# මහබෝසත් චර්යාව

සංස්කාරක :

පූජ්‍ය නිකපිටියේ ගුණරතන හිමි

(ධර්මදානය පිණිසයි)

ශ්‍රී බු: ව: 2562 වූ දුරුතු මස ව්‍ය:ව:2018-12-28
අව සැටවක නම් තිථිය ලත් රවි ද

# පිදුම

ලෝ සතුන් අතරත
මහසත් ගුණෙන් සපිරුණ,
සතට සෙත සලසන
නැත කෙනෙක් වෙන බෝසතුන් හැර...

සක්වළ ගැබ මැදින්
එතෙරට පිහිනුවේ නම්,
බුදු බව ලද හැකියි
පවසතොත් මම එය ද කරමි...

මහත් වූ අදිටනින්
එබඳු ම වූ ද විරියෙන්,
ලොසත භව දුකින්
එතෙර වී මම, එතෙර කරමි යි...

අතට පත් වූ තම නිවන් සුව
අතැර ද සිතමින් ම සත ගැන,
පොළව කම්පිත කර නොයෙක් වර
පිරුවෙ පෙරුමන් පතා බුදු බව...

වෙරළ පරයා ගියත් සයුරු දිය
නොයික්මවමින් සත්‍ය ධර්මය,
අසංඛ්‍ය කප් ගණන් කල් දුර
පාරමී දම් කෙමෙන් සපුරන...

සිහිකලත් ඒ මහ සතුන් ගුණ
ලැබෙන එල අපමණයි සතහට,
එවන් උත්තම බෝසතුන් වෙත
පුදමි මේ ගත තබා හිස මත...

# හැඳින්වීම

**"නභඤ්ච දූරෙ පඨවී ච දූරෙ - පාරං සමුද්දස්ස තදාහු දූරෙ,**
**යතො ච වෙරොචනො අබ්භුදෙති - පභඞ්කරො යත්ථ ච අත්ථමෙති,**
**තතො හවෙ දූරතරං වදන්ති - සතඤ්ච ධම්මං අසතඤ්ච ධම්මං"**

අහසට පොළොව දුර වේ. සමුද්‍රයෙහි එතෙරට මෙතෙර දුර පිහිටියේය. යම් තැනකින් ආලෝකය ගෙන දෙන සූර්‍ය්‍යයා උදා වේ ද, යම් තැනකින් අස්ත වේ ද, එමෙන් සත්පුරුෂයන් ගේ ධර්‍මය හා අසත්පුරුෂයන් ගේ ධර්‍මය ඊටත් වඩා දුර යැයි කියති.

**"අබ්‍යායිකො හොති සතං සමාගමො - යාවාපි තිට්ඨෙය්‍ය තථෙව හොති, ඛිප්පඤ්හි වෙති අසතං සමාගමො - තස්මා සතං ධම්මො අසබ්භි ආරකා"**

සත්පුරුෂයන් ගේ සමාගමය වෙනස් නොවන ස්වභාව ඇත්තේ ය. යම්තාක් කල් පවතී ද ඒ තාක් එසේම වේ. අසත්පුරුෂයන් ගේ සමාගමය වහා වෙනස් වේ. එසේ හෙයින් අසත්පුරුෂ සමාගමෙන් සත්පුරුෂයන්ගේ ධර්‍මය ඈත් ව සිටියේ ය.

(අං: නි: ච: නි: සුවිදූර සූත්‍රය)

දිනක් බුද්ධ උපස්ථායක වූ ආනන්ද තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේගෙන් **"උපඩ්ඪමිදං, භන්තෙ, බ්‍රහමචරියස්ස යදිදං කල්‍යාණමිත්තතා කල්‍යාණසහායතා කල්‍යාණසම්පවඞ්කතා''** යනුවෙන් "ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, කල්‍යාණ මිතුරන් ඇති බවක් කල්‍යාණ යහළුවන් ඇති බවක් කල්‍යාණ මිතුරන් කෙරෙහි නැමෙන සුළු බවක් වේ ද ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාවෙන් හරි අඩක් ඒ මත පිහිටියේය නේද" යැයි මෙසේ ප්‍රශ්නයක් අසා සිටියේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ **"මා හෙවං, ආනන්‍ද, මා හෙවං, ආනන්‍ද, සකලමෙව හිදං, ආනන්‍ද, බ්‍රහමචරියං යදිදං කල්‍යාණමිත්තතා කල්‍යාණසහායතා කල්‍යාණසම්පවඞ්කතා. කල්‍යාණමිත්තස්සෙතං, ආනන්‍ද, භික්ඛුනො පාටිකඞ්ඛං කල්‍යාණසහායස්ස කල්‍යාණසම්පවඞ්කස්ස අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්සති''** "ආනන්‍දය මෙසේ නොකියව, ආනන්‍දය මෙසේ නොකියව, ආනන්‍දය කල්‍යාණ මිතුරන් ඇති බවක් කල්‍යාණ යහළුවන් ඇති බවක් කල්‍යාණ මිතුරන් කෙරෙහි නැමෙන සුළු බවක් වේ ද, මේ සකලවිධ ශාසන බ්‍රහ්මචර්‍ය්‍යාව ඒ මත පිහිටියේය වේ. ආනන්‍දය කල්‍යාණ මිතුරන් ඇති කල්‍යාණ යහළුවන් ඇති කල්‍යාණ මිතුරන් කෙරෙහි නැමෙන සුළු භික්ෂුව ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්‍ගය වඩන්නේ ය, බහුල කරන්නේය යන මෙය කැමති විය යුතුය" යැයි වදාළ සේක.

(සං: නි: මං: සං: උපඩ්ඪ සූත්‍රය)

ලෝක සත්ත්වයන්ට හිත ඇති ශ්‍රේෂ්ඨතම කල්‍යාණ මිත්‍රයා නම් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ම ය. ඒ හැරුණු විට ලෝක සත්ත්වයන්ට පිහිටවන සැබෑ කල්‍යාණ මිත්‍රයා නම් මහ බෝසතාණන් වහන්සේ ය. ඒ උතුමන් වහන්සේලා හැර සසර දුක් විඳින ලෝ සතුන්ට පිහිටවන කෙනෙකු නැත. එබැවින් එබඳු සත්පුරුෂයෝ ලොව පහළ වීම ලෝක සත්ත්වයන්ට සැනසිල්ල පිණිස සැප පිණිස වෙති.

දුක් සසරක සැරිසරමින් සිටි අපට උතුම් බුද්ධ ශාසනයක් හමු වූහ. ඒ උතුම් වූ බුද්ධ ශාසන ප්‍රතිපත්තිය පිරිහී ගෙන යන මෙවන් යුගයක මනුලොව ඉපද බුදු සසුනෙහි පැවිදි ව සම්මා සම්බුද්ධ ශාසන ප්‍රතිපත්ති ධර්මයන් නගා සිටවූ මහ බෝසතාණන් වහන්සේලා අපට ඇසුරු කිරීමට ලැබීම ඉමහත් වාසනාවකි.

ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාව පිහිටුවා වදාළ **පරම පූජනීය රාජකීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශාභිධාන මහෝත්තමයන් වහන්සේ** එසේ වූ මහ බෝසතාණන් වහන්සේ නමකි. එසේම සියලු ආකාර ගුණයන්ගෙන් ද, ධර්ම ඥානයෙන් ද, ප්‍රතිපත්තියෙන් ද, අතිශයින් පරිපූර්ණත්වයට පත් වූ **ත්‍රිපිටකධරාචාර්ය මහෝපාධ්‍යා පරම පූජනීය නා උයනේ අරියධම්මාභිධාන මහෝත්තමයන් වහන්සේ** ද එසේ වූ මහ බෝසතාණන් වහන්සේ නමකි. තව ද **අති පූජනීය බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහා ස්වාමින් වහන්සේ, මඩිහේ පඤ්ඤාසීහ මහා ස්වාමින් වහන්සේ මාහෝ සුමේධ මහා ස්වාමින් වහන්සේ** වැනි ශ්‍රේෂ්ඨ උතුමන් වහන්සේලා ද වර්තමානයෙහි අපට හමු වූ එබඳු ම වූ මහ බෝසතාණන් වහන්සේලා වෙති. තව ද අතීතයෙහි ලක්දිව දස රාජ ධර්මයෙන් රාජ්‍යානුශාසනා කළ **සකල විද්‍යා චක්‍රවර්ති දෙවන පරාක්‍රමබාහු මහ රජතුමා, සිරිසඟබෝ මහ රජතුමා** වැනි ශ්‍රේෂ්ඨ රජවරු ද, **ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමා** වැනි ජාතික වීර උතුමන් ද සසුන් කෙත ආලෝකවත් කළ මහ බෝසතාණන් වහන්සේලා වෙති. ලොවට හිත ඇති අප මහ බෝසතාණන් වහන්සේ ප්‍රධාන අතීතයෙහි පහළ වූ ද, වර්තමානයෙහි පහළ වූ ද, අනාගතයට පහළ වන්නා වූ ද මහ බෝසතාණන් වහන්සේලාට අප විසින් සිතින් කයින් වචනයෙන් සිදු කරගනු ලබන්නා වූ සියලු කුසල ධර්මයෝ ගෞරව පූජා උපහාරයක් ම වේවා. සැම කල්හි අපගේ ගෞරව නමස්කාරය වේවා.

සම්මා සම්බුද්ධ ශාසනය චිරස්ථිතිය ප්‍රාර්ථනාවෙන් හා ලොව පහළ වූ උත්තම කල්‍යාණ මිත්‍ර මහ බෝසතාණන් වහන්සේලාට ගෞරව උපහාර පූජාමය වූ මහා පුණ්‍ය කර්මයක් ව්‍යං වර්ෂ 2017 - 05 - 27, 28 යන දිනයන්හි දී බුදුරජාණන් වහන්සේගේ දෙවන ලංකාගමනය සිදු වූ **නාගදීප චෛත්‍ය රාජයන් වහන්සේ** අබියස දී හා බුදුරජාණන් වහන්සේගේ දකුණු දළද වහන්සේ නමක් වැඩ සිටින **සෝමාවතී චෛත්‍ය රාජයන් වහන්සේ** අබියස

දී **අරියමග්ග සංවිධානය** මගින් මහා සංසරත්නය හා ලෝකවාසී බෞද්ධ ජනතාව එක්ව සිදු කළහ. එම මහඟු පින්කමෙහි දී ලොව පහළ වූ සියලු මහ බෝසතාණන් වහන්සේලා ගේ බුදු ගමන විවරණය කරමින් මහ බෝසතාණන් වහන්සේලාට ගෞරව පූජාවක් වශයෙන් මෙම අගනා ධර්ම ග්‍රන්ථය නිර්මාණය කරන ලදි.

නා උයන ආරණ්‍ය සේනාසනයෙහි ප්‍රධානාචාර්ය අපගේ ගුරුදේවෝත්තම අති පූජනීය **මීගොඩ මහා ස්වාමින් වහන්සේට** 2018-12-28 දිනට අසූ පස්වැනි (85) ජන්ම දිනය යෙදී ඇත්තේ ය. එය නිමිති කොට මෙම අගනා ධර්ම ග්‍රන්ථය නැවත වතාවක් මුද්‍රණය කරවා ධර්ම දනයක් වශයෙන් පිරිනමනු ලබන්නේ අති පූජනීය මීගොඩ මහා ස්වාමින් වහන්සේට ආශිර්වාද පිණිස ය. එම මහා ප්‍රතිපත්ති පූජාමය කුසල බලය සම්මා සම්බුද්ධ ශාසනය චිරාත් කාලයක් නිරුපද්‍රිත ව පැවැත්ම පිණිස ම හේතු වේවා. අසූ පස්වැනි පුණ්‍යාත්ම ජන්ම දිනය සිහිකරන නා උයන ආරණ්‍ය සේනාසනයෙහි ප්‍රධානාචාර්ය අති පූජනීය **මීගොඩ මහා ස්වාමින් වහන්සේට** නිදුක් නිරෝගී සුවපත්භාවයෙන් විංශත් ශතවර්ෂාධික කාලයක් සසුන් ගුණ පූර්ණය කරගැනීමට හේතු වාසනා වේවා.

අති පූජනීය ශ්‍රී කඃ යෝඃ සංඃ පිහිටුවා වදාළ **පරම පූජනීය රාජකීය පණ්ඩිත කඩවැද්දූවේ ශ්‍රී ජිනවංශාභිධාන මහෝත්තමයන් වහන්සේ** හා **ත්‍රිපිටකධරාචාර්ය මහෝපාධ්‍යා පරම පූජනීය නා උයනේ අරියධම්මාභිධාන මහෝත්තමයන් වහන්සේ** ප්‍රධාන ලොව පහළ වූ සියලු මහ බෝසතාණන් වහන්සේලාට උතුම් ගෞරව පූජාවක් වේවා.

එසේම වඳවීගෙන යන සම්බුද්ධ ශාසන ප්‍රතිපත්තිය නැවත නිවැරදි කොට පා අවුක් භාවනා මාර්ගය නමින් ලොවට හඳුන්වා දුන් බුරුම රට චිත්තල පබ්බත භාවනා මධ්‍යස්ථානාධිපති **පරම පූජනීය ඌ ආචිණ්ණ සයාඩෝ මහා ස්වාමින් වහන්සේ** ප්‍රධාන ප්‍රතිපත්තිකාමී මහ සඟ රුවණට ද, ශ්‍රී ලංකාද්වීප ප්‍රතිපත්ති ශාසනයෙහි චූඩාමාණික්‍ය බඳු වූ නා උයන ආරණ්‍ය සේනාසනයෙහි **කෘත්‍යාධිකාරී ප්‍රධාන කර්මස්ථානාචාර්ය අති පූජනීය අඟුල්ගමුවේ අරියනන්ද මහා ස්වාමින් වහන්සේට** ද, අනෙකුත් මහ සඟරුවනට ද, ලංකාවාසී වූ ද, ලෝකවාසී වූ ද සියලු මහසඟරුවණට ද සසුන් කෙත බබුළුවමින් සුවසේ පිළිවෙත් සපුරා නිවන් සුව ලබන්නට හේතු වේවා. සදේවක ලෝකවාසී සියලු සත්නට ද ලෞකික ලෝකෝත්තර සියලු සම්‍යක් ප්‍රාර්ථනා ජය ගැනීමට හේතු වේවා.

මෙම සාරවත් ධර්ම ග්‍රන්ථය සඳහා දයකත්වය දරන්නා වූ අලව්ව පදිංචි ගාමිණී වණිසූරිය මහත්මා ප්‍රධාන පවුලේ සැමදෙනා විසිනි. මෙම උදර ධර්මදනමය කුසලයෙන් සුමින්ද වීරසිංහ ගුරුතුමාට ද, සංගීත කලාව තුළින් බෞද්ධ දර්ශනයට සිංහල ජාතියට සංස්කෘතියට මහත් මෙහෙවරක්

කොට දිවංගත හෙල මහා ගාන්ධර්ව පණ්ඩිත් අමරදේව ශූරීන්ට ද නමින් මියගිය සියලු ඥාතීන්ට ද පුණ්‍යානුමෝදනා කරනු ලබයි. මෙම ධර්ම ග්‍රන්ථය මනාව මුද්‍රණය කර දුන් දිමුතු මුද්‍රණාලයෙහි අධිපතිතුමා ප්‍රධාන කාර්‍ය මණ්ඩලයට ද සියලු ප්‍රාර්ථනාවන් ජය ගැනීමට හේතු වේවා! නිර්වාණාවබෝධය පිණිස ම හේතු වේවා!

**සද්ධම්මො චිරං තිට්ඨතු!**

මෙයට සසුන් ලැදි,
නිකපිටියේ ගුණරතන හිමි.
නා උයන ආරණ්‍යය.

# පටුන


හැඳින්වීම..................... ............................................................................ III

සංඥපනයiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiiX

මහබෝසත් චය්‍ර්‍යාව ..................................................................................1

1.පාරමිතා නම් කවරහු ද? .........................................................................4

2.කවරාර්ථයකින් පාරමී නම් වේ ද?.............................................................4

3.පාරමිතා ධර්ම කී වැදෑරුම් වේද?...............................................................6

4.පාරමිතාවන්ගේ ක්‍රමය කෙබඳු ද? ..............................................................6

5.පාරමිතාවන්ගේ ලක්ෂණය රස පච්චුපට්ඨාන පදට්ඨාන කවරහු ද? .....................9

6.පාරමිතා ධර්මයන් ගේ ප්‍රත්‍යය කවරේ ද? .....................................................13

- ❄ මහාභිනීහාරය පිණිස වන්නා වූ ප්‍රත්‍යය සතර.............................20
- ❄ මහාභිනීහාරය පිණිස වන්නා වූ හේතු සතර...............................21
- ❄ මහාභිනීහාරය පිණිස වන්නා වූ බල සතර.................................27
- ❄ පාරමිතා ධර්මයන්ගේ ප්‍රත්‍යවේක්ෂා ක්‍රම ......................................34
  - ☸ දන පාරමිතාව ප්‍රත්‍යවේක්ෂා ක්‍රමය ..........................................34
  - ☸ සීල පාරමිතාවෙහි ප්‍රත්‍යවේක්ෂා ක්‍රමය.....................................37
  - ☸ නෛෂ්ක්‍රම්‍ය පාරමිතාවේ ප්‍රත්‍යවේක්ෂා ක්‍රමය...........................41
  - ☸ ප්‍රඥ පාරමිතාවෙහි ප්‍රත්‍යවේක්ෂා ක්‍රමය ....................................41
  - ☸ වීය්‍ර්‍යය පාරමිතාවෙහි ප්‍රත්‍යවේක්ෂා ක්‍රමය ...............................44
  - ☸ ක්ෂාන්ති පාරමිතාවෙහි ප්‍රත්‍යවේක්ෂා ක්‍රමය...............................45
  - ☸ සත්‍ය පාරමිතාවෙහි ප්‍රත්‍යවේක්ෂා ක්‍රමය ..................................48
  - ☸ අධිෂ්ඨාන පාරමිතාවෙහි ප්‍රත්‍යවේක්ෂා ක්‍රමය............................49
  - ☸ මෛත්‍රී පාරමිතාවෙහි ප්‍රත්‍යවේක්ෂා ක්‍රමය................................49
  - ☸ උපේක්ෂා පාරමිතාවෙහි ප්‍රත්‍යවේක්ෂා ක්‍රමය .............................50

7.පාරමිතා ධර්මයන්ගේ කෙලෙසීම කෙසේ වේද? ..........................................**54**

8.පාරමිතාවන්ගේ පිරිසිදු වීම කෙසේ වේ ද? ..........................................**57**

9.පාරමිතාවන්ට විරුද්ධ ධර්ම මොනවා ද?..........................................**58**

10.පාරමිතා ධර්මයන්ගේ ප්‍රතිපත්තිය ..........................................**59**

❄ දන පාරමිතාවේ ප්‍රතිපත්ති ක්‍රමය..........................................59

❄ සීල පාරමිතාවේ ප්‍රතිපත්ති ක්‍රමය ..........................................68

☸ චාරිත්‍ර සීලයෙහි ප්‍රතිපත්ති ක්‍රමය..........................................68

☸ චාරිත්‍ර සීලයෙහි ප්‍රතිපත්ති ක්‍රමය ..........................................72

❄ නෛෂ්ක්‍රම්‍ය පාරමිතාවේ ප්‍රතිපත්ති ක්‍රමය..........................................75

❄ ප්‍රඥා පාරමිතාවෙහි ප්‍රතිපත්ති ක්‍රමය ..........................................78

❄ වීර්‍ය්‍යය පාරමිතාවෙහි ප්‍රතිපත්ති ක්‍රමය..........................................80

11.පාරමිතා ධර්මයන්ගේ විභාගය කවරේද?..........................................**85**

12.පාරමිතාවන් ගේ සංග්‍රහය කවරේ ද? ..........................................**87**

13.පාරමිතා ධර්මයන්ගේ සම්පාදනය කිරීමේ..........................................**90**

14.පාරමිතාවන්ගේ සම්පාදනය කොපමණ කලකින් සිද්ධ වේ ද?....................**94**

15.පාරමිතා ධර්මයන්ගේ ආනිශංස කවරේ ද? ..........................................**95**

❄ සොළොස් වැදෑරුම් ඓශ්වර්‍ය්‍ය ධර්ම ..........................................97

❄ දෙතිස් පූර්ව නිමිති ..........................................99

16.පාරමිතා ධර්මයන්හි ඵලය කවරේද?..........................................**102**

❄ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ..........................................102

❄ අසූ අනු ව්‍යඤ්ජන ලක්ෂණ ..........................................104

❄ ව්‍යාම ප්‍රභාව ..........................................107

❄ කේතුමාලාව..........................................107

❄ අසීතිහස්තප්‍රභාව ..........................................108

- ❄ ෂඩ්විධ බුද්ධ රශ්මිය ........ 108
- ❄ අසාධාරණ ඥාන සය ........ 108
- ❄ දසබල ඥාන ........ 111
- ❄ විශාරද ඥාන සතර ........ 112
- ❄ බුදුරජාණන් වහන්සේලාට අසමාන ධර්මතා අට ........ 113
- ❄ අවිජහිත ස්ථාන සතර ........ 115
- ❄ සම තිස් ධර්මතා ........ 116

17.පුණ්‍ය ප්‍රාර්ථනා ........ **119**

# සංඥාපනය

"කිං මෙ අඤ්ඤාතවෙසෙන - ධම්මං සච්ඡිකතෙනිධ,
සබ්බඤ්ඤුතං පාපුණිත්වා - බුද්ධො හෙස්සං සදෙවකෙ,

මේ ලෝකයෙහි භික්ෂූන් වහන්සේ නමක් මෙන් අප්‍රකට ව ධර්මය සාක්ෂාත් කිරීමෙන් මට කවර ප්‍රයෝජනයක් ද? සර්වඥ බවට පැමිණ දෙවියන් සහිත ලෝකයෙහි සර්වඥ බුදුරජාණන් වහන්සේ නමක් වන්නෙමි.

කිං මෙ එකෙන තිණ්ණෙන - පුරිසෙන ථාමදස්සිනා,
සබ්බඤ්ඤුතං පාපුණිත්වා - සන්තාරෙස්සං සදෙවකං"

තමාගේ ථාම බලය දකින්නා වූ මා විසින් එකලාව මේ සසර දුක් තරණය කිරීමෙන් කවර ප්‍රයෝජනයක් ද? තමන් වහන්සේ සසරින් එතරව අන්‍යයන් ද එතර කරවන්නා වූ ද, තමන් සියලු දුකින් මිදී අන්‍යයන් ද දුකින් මුදවන්නා වූ ද සර්වඥත්වයට පැමිණ දෙවියන් සහිත ලෝක සත්ත්වයන් සසර කතරින් එතර කරවන්නෙමි.

(බුද්ධවංස පාලි)

බුදු බව පතා දිය යුතු තාක් දානය පාරමී ශීර්ෂයෙන් දන් දීම, බුදු බව පතා රැකිය යුතු තාක් සීලය පාරමී ශීර්ෂයෙන් සැපිරීම, බුදු බව පතා නෛෂ්ක්‍රම්‍යයෙහි පරතෙරට පැමිණීම ආදී වූ දස පාරමී - දස උප පාරමී - දස පරමත්ථ පාරමී යන සම තිස් පෙරුම් දම් පුරා ශරීරාංග - නේත්‍ර - ධන - රාජ්‍යය - පුත්‍රදාරාවන් යන පඤ්ච මහා පරිත්‍යාගයත් පරිත්‍යාග කොට පූර්ව යෝග, පූර්ව චරියා, ධර්මඛ්‍යාන (ධර්මදාන), ඥාති චර්යාව, අර්ථ චර්යාව ආදිය පුරා බෝධි චර්යාවේ කෙළවරට පැමිණ මහා බෝධිසත්ව උතුමෝ බුදු බවට පත්වන සේක.

උත්තම සම්මා සම්බුද්ධත්වය පිණිස විසි අසංඛ්‍ය, සාරාසංඛ්‍ය කල්ප ලක්ෂ ගණන් පාරමී පුරණ මහ බෝසතාණන් වහන්සේලාගේ පාරමී භූමිය පිළිබඳ සවිස්තරාත්මක ඉතා අගනා උසස් ගණයේ **"මහ බෝසත් චර්යාව"** නමින් විශේෂිත වූ දුර්ලභ ග්‍රන්ථයක් එළිදැක්වීම ඉතා අගේ කොට සලකමි. මෙම ග්‍රන්ථය කියවීම, ධාරාගැනීම, නැවත නැවත සිහි කිරීම අපට ද උතුම් නිර්වාණ බෝධියට ළඟා වීමට අවශ්‍ය පාරමී ධර්මයන් සපුරා ගැණීම පිණිස වේ.

වර්තමාන සසුන් කෙතෙහි බුද්ධාංකුර මහබෝසත් චරිත ලෙස ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථා සමුත්පාදක **අති පූජනීය රාජකීය පණ්ඩිත**

**කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශාභිධාන මහෝත්තමයන් වහන්සේ** සහ ශ්‍රී කඃ යෝඃ සංඃ අනුශාසක **ත්‍රිපිටකධර මහා කර්මස්ථානාචාර්ය අති පූජනීය නා උයනේ ශ්‍රී අරියධම්මාභිධාන මහෝත්තමයන් වහන්සේ** යන අපවත් වී වදාළ මහෝත්තමයන් වහන්සේලා දැක්විය හැක. එතුමන් වහන්සේලාගේ උතුම් ප්‍රව්‍රජ්‍යා දිවියම මහ බෝසත් ගුණයන්ගෙන් අසිරිමත් වේ.

❖ බෝධි කාරක ධර්මසම්භාර අතුරින් දාන පරමත්ථ පාරමිතාව පිරූ බෝධිසත්ව චර්යාවන්ගේ උත්තරීතර අවස්ථාව වන වෙස්සන්තර ජාතකයෙහි දී සත් වාරයක් මහ පොළොව කම්පිත කරවමින් දාන පාරමිතාව සම්පූර්ණ කළ සේක. එබැවින් එය එතරම් ම ඓශ්චර්යයක් වේ.

**"තණ්හක්ඛයො සබ්බදුක්ඛං ජිනාති"** යන සර්වඥ දේශනයට අනුව තෘෂ්ණාක්‍ෂය නම් නිර්වාණාවබෝධය පිණිස ම සෝමනස්ස සහගත ඥාණ සම්ප්‍රයුක්ත අසංකාරික කුසල් සිතින් ම මොහොතක් පාසා සති සමාධි ඥාණ වැඩෙන සේ ශ්‍රද්ධාවත් ධර්ම ඡන්දයත් ධර්මප්‍රීතියත් ඇතිව මෙම දහම් පොත සියතින් ම සකස් කළ පූජ්‍ය නිකපිටියේ ගුණරතන ස්වාමින් වහන්සේට ධර්මදානය පිරිනැමීමේ කුසලානුභාව බලයෙන් සහ රත්නත්‍රයානුභාව බලයෙන් තව තවත් ධර්ම ඥාන මුදුන්පත් වේවා. ලේඛන කුසලතාවෙන් නිරෝගී සම්පත්තියෙන් ශත සහස්‍ර ගුණයෙන් අභිවර්ධනය වේවා. මුද්‍රණ කටයුතු සඳහා කාලය ධනය ශ්‍රමය වැය කළ සහ නොයෙක් ලෙස උපකාර සැලසූ සැමටත් මුද්‍රණාලයාධිපතිතුමා ප්‍රධාන සේවක මඬුල්ලටත් සාධු කියා අනුමෝදන්වන සැමටත් ග්‍රන්ථය කියවීමෙන් සිත් පහදවාගන්නා සැමටත් දෙවියන් සහිත ලෝකයාටත් තෙරුවන් ගුණ බෙලෙන් දෙලොව සුභසෙතත් ශාන්ති ලක්‍ෂණ නිර්වාණ ධාතුවත් සුවසේම සාක්‍ෂාත් වේවා.

**"ධම්මො හවෙ රක්ඛති ධම්මචාරී"**

මෙයට මෙතැති,<br>
පූජ්‍ය අඟුල්ගමුවේ අරියනන්ද ස්ථවීර,<br>
නා උයන ආරණ්‍ය,<br>
පන්සියගම, මැල්සිරිපුර.

# මහබෝසත් චර්‍යාව

## නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

**"එවං අච්ඡරියා හෙතෙ - අබ්භූතා ච මහෙසිනො,**
**මහාකාරුණිකා ධීරා - සබ්බලොකෙකබන්ධවා,**

**අචින්තෙය්‍යානුභාවා ච - සද සද්ධම්මගොචරා,**
**බොධිසත්තා මහාසත්තා - සුචිසල්ලෙඛවුත්තිනො"**

සියලු ලෝක සත්ත්වයන්ට ම හිතානුකම්පාව ඇති ඥාතියා වූ, බොහෝ ඇසූ පිරූ ධර්‍මයන් ඇත්තා වූ උත්තම පණ්ඩිත වූ, මව්පියන් තම දරුවන් කෙරෙහි මෙන් සියලු ලෝක සත්ත්වයන් කෙරෙහි මහා කරුණාවක් ඇත්තා වූ, ලොව වෙසෙන පුහුදුන් සත්ත්වයන් අතර මහත් ප්‍රඥාවක් ඇත්තා වූ, ඉතා පිරිසිදු වූ සැහැල්ලු පැවතුම් ඇත්තා වූ හැම කල්හි ධර්‍මානුධර්‍ම ප්‍රතිපත්තියෙහි හැසිරෙන්නා වූ, ලෝක සත්ත්වයන් අතර උත්තම සත්වයා වූ මහා සත්ව වූ මහබෝසතාණන් වහන්සේලා ඓශ්චර්‍ය්‍ය අද්භූත ගුණ ඇත්තාහ. නොසිතිය හැකි ආනුභාව ඇත්තාහ.

**"මහාවාතසමුද්ධත - වීචිමාලො මහොදධි,**
**අපි ලඞ්ඝෙය්‍ය වෙලන්තං - බොධිසත්තා න ධම්මතං"**

මහා සාගරයෙහි මහා වාතයෙන් හටගත් රළ සමූහය වෙරළ ඉක්මවා ගොඩබිම් යටකරගෙන ගියේ නමුත් මහබෝසතාණන් වහන්සේලා සත්‍ය වූ ධර්‍මතා නොයික්මවති.

**"ලොකෙ සඤ්ජාතවද්ධාපි - න තෙ භාවිතභාවිනො,**
**ලිම්පන්ති ලොකධම්මෙහි - තොයෙන පදුමං යථා"**

ලෝකයෙහි ඉපද ලෝක සත්ත්වයන් අතර වැඩුණු නමුත් ඒ බෝධිසත්ත්වයන් වහන්සේලා භාවනා වශයෙන් පුහුණු කරන ලද සිත් ඇති බැවින් නෙළුම් පත ජලයෙහි නො ගෑවී ජලය තුළ පවත්නා සේ ලෝක ධර්‍මයෙහි නො ඇලෙති.

**"යෙසං වෙ අත්තනි සිනෙහො - නිහීයති යථා,**
**සත්තෙසු කරුණාසිනෙහො - වඩ්ඪතෙව තථා"**

යමෙකුගේ තමා කෙරෙහි ඇති සෙනෙහස යම් යම් ආකාරයකින් පිරිහී යයි ද, සියලු ලෝක සත්ත්වයන් කෙරෙහි ඇති මහ බෝසතාණන් වහන්සේලා ගේ කරුණාව සෙනෙහස එයට අනුරූපව වැඩෙන්නාහ.

**"යථා චිත්තං වසෙ හොති - න ච චිත්තවසානුගා,**
**තථා කම්මං වසෙ හොති - න ච කම්මවසානුගා."**

යම් සේ සිත තමා කෙරෙහි වසඟයෙහි පවතී ද, තමා සිතෙහි වසඟයට නොයයි ද, එලෙස ම කර්‍මය තමා වසඟයෙහි පවත්වයි. තමා කර්‍මයෙහි වසඟයට නොයයි.

**"දෙසෙහි නාභිභූයන්ති - සමුග්ඝාතෙන්ති වා න තෙ,**
**චරන්තා බොධිපරියෙට්ඨිං - පුරිසාජානියා බුධා."**

පණ්ඩිත වූ උත්තම පුරුෂ වූ සම්‍යක් සම්බෝධිය සෙවීමෙහි හැසිරෙන්නා වූ ඒ මහා සත්ත්වයන් වහන්සේලා රාග ද්වේෂ දී අකුසලයන්ගෙන් නො මැඩෙති. විනාශයට නොපැමිණෙති.

**"තෙසු චිත්තප්පසාදෙපි - දුක්ඛතො පරිමොචයෙ,**
**තෙසං පගෙවානුකිරියා - ධම්මස්ස අනුධම්මතොති"**

ඒ මහා බෝසතාණන් වහන්සේලා කෙරෙහි යමෙක් සිත පහදවා ගනී ද, ඒ පැහැදීම් මාත්‍රය ද සසර දුකින් මුදවාලීමට සමත් වේ. එසේ නම් ධර්‍මානුධර්‍ම ප්‍රතිපත්තියෙහි පිහිටා ඒ උතුමන් වහන්සේලා අනුව ක්‍රියා කිරීමෙන් ලැබෙන අනුසස් කියනු ම කවරේ ද?

ඒ වීර උදර මහා කාරුණික මහ බෝසතාණන් වහන්සේලා විසින් කල්ප කෝටි අසංඛ්‍ය ගණනින් සීමා නො කොට හැකි අපමණ කාලයක් මුළුල්ලෙහි තම ශරීරාවයව පවා අපමණ වාරයන් හි දී දන් දෙමින් සංසාර ඛේදයට හසුව අපමණ දුක් විඳින ලෝ සතුන් වෙත

මහත් වූ හිතානුකම්පා ඇතිව පාරමිතා ගුණ පුරා ලොව්තුරා බුදු බවට පැමිණ උතුම් ධර්‍ම චක්‍රය පවත්වා අපමණ සත්ත්වයන් සසර දුකින් මුදවාලත් ද, ඒ මහෝත්තමයන් වහන්සේලා කෙරෙහි ගෞරව නමස්කාර පූර්‍වකව කරන ගුණ වර්‍ණනාව මෙසේ ඉදිරිපත් කරමි. ඒ මහා සත්පුරුෂයන් වහන්සේලා පිළිබඳ වූ උත්තම ගුණ වර්‍ණනා කිරීමේ මහඟු කුසලය සියලු සත්ත්වයන්ට ම පරම සැනසීම වූ නිර්‍වාණාවබෝධය පිණිස ම හේතු වාසනා වේවා!

ඒ මහා බෝසතාණන් වහන්සේලා විසින් සම්මා සම්බෝධිය ලැබීමට පූර්‍ණය කරනු ලබන පාරමිතා භූමිය වනාහි මනෝ වීර්‍යය, වාග් වීර්‍යය, මහා වීර්‍යය යන තුන් ආකාරයෙන් සම්පූර්‍ණ කර ගත යුත්තාහු වෙති.

මහ බෝසතාණන් වහන්සේලා විසින් සත් අසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් මනෝ වීර්‍යය හෙවත් සිතින් බුදු බව ප්‍රාර්‍ථනා කරමින් කුසල් කළ යුතු ය. ඉන් අනතුරුව නව අසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් වාග් වීර්‍යය හෙවත් වචනයෙන් බුදු බව ප්‍රාර්‍ථනා කරමින් කුසල් කළ යුතු ය. මෙසේ සොළසාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් සම්පූර්‍ණ වූ පසු අෂ්ට ධර්‍ම සමෝධානයෙන් යුක්ත වූ විටෙක සම්මා සම්බුදු රජාණන් වහන්සේ නමක් වෙතින් බුදු වන බවට නියත විවරණ ලැබ එතැන් පටන් සම තිස් පෙරුම් දම් පුරා ලොව්තුරා බුදු බවට පැමිණෙති.

ඒ මේ මහා බෝසතාණන් වහන්සේලා සම්මා සම්බෝධිය ලැබීමට පූර්‍ණය කරනු ලබන පාරමිතා භූමිය පිළිබඳ ව චර්‍යාපිටක අර්‍ථ කථාවේ ප්‍රකීර්‍ණක කථා වර්‍ණනාවෙහි දැක්වෙන ආකාරයට අනු පිළිවෙළ නොයික්මවා අර්‍ථ විවරණ දක්වමින් මෙසේ ඉදිරිපත් කරමි. ඒ මෙසේ ය.

1. **පාරමිතාවෝ නම් කවරහු ද?**
2. **කවරාර්‍ථයකින් පාරමිතා නම් වේ ද?**
3. **ඒ පාරමිතාවෝ කී වැදෑරුම් ද?**
4. **ඒ පාරමිතාවන් ගේ ක්‍රමය කවරේ ද?**
5. **පාරමිතාවන් ගේ ලක්‍ෂණ රස පච්චුපට්ඨාන පදට්ඨාන කවරහු ද?**

6. පාරමිතාවන් ගේ ප්‍රත්‍ය කවරේ ද?
7. පාරමිතාවන් ගේ සංක්ලේශය (අපිරිසිදු වීම) කවරේ ද?
8. පාරමිතාවන් ගේ පිරිසිදු වීම කවරේ ද?
9. පාරමිතාවන් ගේ ප්‍රතිපක්‍ෂ (විරුද්ධ) ධර්‍ම කවරේ ද?
10. පාරමිතාවන් ගේ ප්‍රතිපදව කුමක් ද?
11. පාරමිතාවන් ගේ විභාගය කවරේ ද?
12. පාරමිතාවන් ගේ සංග්‍රහය කවරේ ද?
13. පාරමිතාවන් ගේ සම්පාදනය කිරීමේ උපාය කවරේ ද?
14. පාරමිතාවන් ගේ සම්පාදනය කොපමණ කලකින් සිද්ධ වේ ද?
15. පාරමිතාවන් ගේ ආනිශංස කවරේ ද?
16. පාරමිතා පූර්‍ණය කිරීමෙන් ලැබෙන ආනිශංස ඵලය කවරේ ද?

# 1. පාරමිතා නම් කවරහු ද?

තෘෂ්ණා මාන දිට්ඨි යන කෙලෙස්වලින් නොමැඩුනා වූ කරුණාවෙන් හා උපාය කෞෂල්‍ය ඥානයෙන් හාත්පසින් රක්නා ලද පුරුදු කරන ලද දන සීලාදී ගුණයෝ පාරමිතා නම් වෙති.

# 2. කවරාර්‍ථයකින් පාරමී නම් වේ ද?

ඒ දන සීලා දී ගුණ පිරීමෙහි යෙදීම කරණ කොට ගෙන සත්ත්වයින්ට උතුම් වන බැවින් මහා සත්ත්ව වූ මහබෝසතාණන් වහන්සේලා, "පරම" නම් වෙති. ඒ උතුමන් වහන්සේලා ගේ ස්වභාවය හෝ ක්‍රියාව "පාරමී" නම් වෙති. එනම් දන සීලා දී කුසල ක්‍රියාවෝ ය.

තව ද පූර්‍ණය කරන අර්‍ථයෙන් "පරම" නම් වේ. දනා දී ගුණයන් පූර්‍ණය කරන්නා, එම ක්‍රියාවන් පාලනය කරන්නා

යනාර්ථයෙන් මහ බෝසතාණන් වහන්සේලා **"පාරම"** නම් වෙති. මෙසේ පරම වූ මහ බෝසතාණන් වහන්සේලා ගේ ගුණය හෝ ස්වභාවය හෝ ක්‍රියාව **"පාරමී"** නම් වෙති. එනම් දන සීලා දී කුසල ක්‍රියාවෝය.

තව ද ගුණ විශේෂයන් කරණ කොට ගෙන සෙසු සත්ත්වයන් තමා කෙරෙහි බැඳගනී යනාර්ථයෙන් මහා සත්ත්වයන් වහන්සේලා **"පරම"** නම් වෙති. එසේම පරිහානිකර වූ කෙලෙස් ධර්මයන්ගෙන් ඈත් ව ඉතා අධික ව පිරිසිදු වන අර්ථයෙන් මහා සත්ත්වයන් වහන්සේලා **"පරම"** නම් වෙති. උතුම් වූ නිර්වාණ යට විශේෂයෙන් පැමිණෙත්'නුයි මහා සත්ත්වයන් වහන්සේලා **"පරම"** නම් වෙති. එසේම මෙලොව පිළිබඳ ව යමක් දක්නා සේ පරලොව පිළිබඳ ව ද නුවණැසින් පිරිසිඳ දනී යනාර්ථයෙන් මහා සත්ත්වයන් වහන්සේලා **"පරම"** නම් වෙති.

ඉතා බොහෝ වූ සීලාදී ගුණ විශේෂ තමාගේ සිතෙහි රෝපණය කර ගන්නා බැවින් ද **"පරම"** නම් වෙති. ආත්ම සඤ්ඤාවෙන් යුක්තව බොහෝ අනර්ථ සිදු කරන කෙලෙස් සොරුන් සද්ධර්මයෙහි පිහිටා පෙළා ලන හෙයින් මහා සත්ත්වයන් වහන්සේලා "පරම" නම් වෙති.

සසර සයුරෙන් සත්ත්වයන් එතර කරවන අර්ථයෙන් **"පාර"** යැයි කියන ලද නිවන අරමුණු කොට තමනුත් පිරිසිදු වී අන් සත්ව ප්‍රජාව ද පිරිසිදු කරවා සත්ත්වයන් ඒ උතුම් නිවනෙහි බඳී, නිවනට යොදවයි, එයට පමුණුවයි යනාර්ථයෙන් **"පාරමී"** නම් වෙති. තත් වූ පරිද්දෙන් නිවන අවබෝධ කරත්නුයි **"පාරමී"** නම් වෙති. සත්ව සන්තාන ගත එක්දහස් පන්සියයක් තරම් වූ කෙලෙස් ධර්ම නිවනට යොමු කරවා වෙහෙසවත්නුයි **"පාරමී"** නම් වෙති. එසේ කළ හැක්කේ මහා සත්ව වූ මහ බෝසතාණන් වහන්සේලාට පමණකි. එසේ වූ එතුමන් වහන්සේලා ගේ ස්වභාවය හෝ ක්‍රියාව **"පාරමිතා"** නම් වේ.

# 3. පාරමිතා ධර්‍ම කී වැදෑරුම් වේද?

"දානං සීලඤ්ච නෙක්ඛම්මං - පඤ්ඤා වීරියෙන පඤ්චමං,
ඛන්ති සච්චමධිට්ඨානං - මෙත්තුපෙක්ඛාති තෙ දසාති"

දාන පාරමිතාව, සීල පාරමිතාව, නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව, ප්‍රඥා පාරමිතාව, වීර්‍යය පාරමිතාව, ක්‍ෂාන්ති පාරමිතාව, සත්‍ය පාරමිතාව, අධිෂ්ඨාන පාරමිතාව, මෛත්‍රී පාරමිතාව, උපේක්‍ෂා පාරමිතාව යැයි ඒ පාරමිතා ධර්‍ම දස වැදෑරුම් වෙති.

# 4. පාරමිතාවන්ගේ ක්‍රමය කෙබඳු ද?

මෙහි ක්‍රමය යනු භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද ක්‍රමයයි. එය ද මහ බෝසතාණන් වහන්සේලා විසින් පළමුවෙන්ම සමාදන් වීම හේතු කොට ගෙන ය. එසේ සමාදන් වීම පුරුද්ද කොට ගෙන ඇත්තේ ය. යම් සේ මුලදී **"පළමු ව දාන පාරමිතාව පිරිය යුතු යැයි"** මෙසේ සොයා ගන්නා ලද්දේ ද, එසේම සමාදන් වන ලද්දේ ද, එලෙස ම භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද්දේ ය.

එහි දී දානය සීලයට බොහෝ උපකාර ඇති බැවින් ද, සුව සේ පූර්‍ණය කළ හැකි බැවින් ද එය පළමු ව දෙශනා කරන ලදී. සීලයෙන් හාත්පසින් අල්ලා ගන්නා ලද දානය මහත් ඵල ඇත්තේ වේ, මහානිශංස ඇත්තේ වේ, යැයි සලකා දානයෙන් අනතුරුව සීලය වදාරන ලදී. සීලය නෛෂ්ක්‍රම්‍යයෙන් හාත්පසින් අල්ලා ගන්නා ලද්දේ ය. නෛෂ්ක්‍රම්‍යය ප්‍රඥාවෙන් හාත්පසින් අල්ලා ගන්නා ලද්දේ ය. ප්‍රඥාව වීර්‍යයෙන් හාත්පසින් අල්ලා ගන්නා ලද්දේ ය. වීර්‍යය ක්‍ෂාන්තියෙන් (ඉවසීමෙන්) හාත්පසින් අල්ලා ගන්නා ලද්දේ ය. ක්‍ෂාන්තිය සත්‍යයෙන් හාත්පසින් අල්ලා ගන්නා ලද්දේ ය. සත්‍යය අධිෂ්ඨානයෙන් හාත්පසින් අල්ලා ගන්නා ලද්දේ ය. අධිෂ්ඨානය මෛත්‍රියෙන් හාත්පසින් අල්ලා ගන්නා ලද්දේ ය. මෛත්‍රිය

උපේක්‍ෂාවෙන් හාත්පසින් අල්ලා ගන්නා ලද්දේ ය. මෙසේ පුරන ලද දස පාරමිතාවන් මහත් ඵල මහානිශංස වේ.

උපේක්‍ෂාව වනාහි කරුණාවෙන් හාත්පසින් අල්ලා ගන්නා ලද්දේ ය. කරුණාව උපේක්‍ෂාවෙන් හාත්පසින් අල්ලා ගන්නා ලද්දේ ද වේ. මහා කාරුණික වූ බෝධිසත්ත්වයන් වහන්සේලා වනාහි කෙසේ නම් සත්ත්වයන් කෙරෙහි උපේක්‍ෂක වෙත් ද? උපේක්‍ෂක විය යුතු සත්ත්වයන් කෙරෙහි ම උපේක්‍ෂක වෙති. සියලු තැනම සියලු කල්හි ම නොවෙති.

තවත් ක්‍රමයකි. බොහෝ දෙනා කෙරෙහි පැවතීම හේතු කොට ගෙන ද, සියලු සත්ත්වයන්ට සාධාරණ හෙයින් ද, අල්ප වූ ඵල ඇති හෙයින් ද, සුව සේ පිරිය හැකි හෙයින් ද පළමු කොටම දාන පාරමිතාව වදාරණ ලදී.

සීලයෙන් දායක ප්‍රතිග්‍රාහක දෙපක්‍ෂයෙහි ම පිරිසිදු වීම වන හෙයින් ද, පරානුග්‍රහය හේතුවෙන් අන්‍යයන්ගෙන් වන පීඩා වැළැක්වීම වන හෙයින් ද, පරිත්‍යාග කිරීමා දී ක්‍රියාවන් පිළිබඳ ව කියා අනතුරුව කයින් වචනයෙන් නො කළ යුතු (ප්‍රාණවධ ආදී) අකිරිය (නො කළ යුතු) ධර්‍ම කී හෙයින් ද, භෝග සම්පත් පිළිබඳ ව හේතු කියා එයින් භව සම්පත් පිළිබඳ හේතු කී හෙයින් ද දානයට අනතුරුව සීලය වදාරන ලදී.

නෛෂ්ක්‍රම්‍යයෙන් සීල සම්පත්තිය සිදු වන හෙයින් කාය වාක් සුචරිතය කියා අනතුරුව මනෝ සුචරිතය කී හෙයින් ද, පිරිසිදු සිල් ඇතියහුට ම පහසුවෙන් ධ්‍යානය සමෘද්ධ වන හෙයින් ද, කර්‍ම අපරාධ ප්‍රහාණය කිරීමෙන් සිදුවන යහපත කියා ක්ලේශාපරාධ ප්‍රහාණයෙන් ආශය (කෙලෙස් පුරුදු) ශුද්ධිය (පිරිසිදු කිරීම) කී හෙයින් ද, කයින් වචනයෙන් සිදුවන වැරදි සිදුවීම්වලින් වැළකී සිටියහුට සිතෙහි කෙලෙසුන්ගේ නැගී සිටීම සිදු නොවන හෙයින් ද සීලයට අනතුරුව නෛෂ්ක්‍රම්‍යය කියන ලදි.

ප්‍රඥවෙන් නෛෂ්ක්‍රම්‍යය (කෙලෙසුන්ගෙන් නික්මීම) පිරිසිදු වන හෙයින් ද, ධ්‍යානයක් නැති කල්හි ප්‍රඥවක් නැති බව (ප්‍රඥව සමාධියට ආසන්න කාරණය කොට ඇත්තේ ය) කී හෙයින් ද, සමථ නිමිත්ත (සන්සිඳීම) කියා උපේක්‍ෂා නිමිත්ත (මධ්‍යස්ථ බව) කී හෙයින් ද, පරහිත ධ්‍යානයෙන් (අනුන්ට යහපත කිරීමේ කැමැත්ත) පරවැඩ පිණිස පැවති කරුණා උපාය කෞෂල්‍යය කී හෙයින් ද, නෛෂ්ක්‍රම්‍යයට අනතුරුව ප්‍රඥ පාරමිතාව කියන ලදි.

වීයර්‍යාරම්භයෙන් ප්‍රඥව ගේ කෘත්‍යය සිද්ධ වන හෙයින් ද, සත්ත්වශූන්‍යතාධර්මනිධ්‍යානශාන්තිය[1] කියා සත්ත්වයන්ට හිත පිණිස ආරම්භ වූවහුගේ නො මසුරු බව කී හෙයින් ද, උපේක්‍ෂා නිමිත්ත (මධ්‍යස්ථ වීම) කියා පරිග්‍රහ නිමිත්ත (වීයර්‍ය) කී හෙයින් ද, පරීක්‍ෂා කොට කරන සුළු බව කියා උට්ඨාන වීයර්‍ය කී හෙයින් ද (පරීක්‍ෂා කොට බලා කරන තැනැත්තාගේ උත්සාහය විශේෂ ඵල ගෙන දෙයි) ප්‍රඥවෙන් අනතුරුව වීයර්‍ය පාරමිතාව කියන ලදි.

උපේක්‍ෂාව ඇතියහුට ම මෛත්‍රිය සම්පූර්ණ වන හෙයින් සත්ත්වයන් කෙරෙහි හිත වැඩ සැලසීම කියා ඔවුන් විසින් කරනු ලබන අපරාධ කර්මයන් හි ප්‍රතිපක්‍ෂව නැඟී සිටීමක් නැති හෙයින් සියලු සත්ත්වයින් කෙරෙහි තමන්ට උපකාර කරන්නවුන් සේ සලකා මධ්‍යස්ථ භාවය පුරුදු කරන හෙයින් මෛත්‍රියට අනතුරුව උපේක්‍ෂා පාරමිතාව කියන ලදි.

[1] සත්ව පුද්ගල ආත්ම ස්වභාවයෙන් තොර බව පරමාර්ථ වශයෙන් ඇති ලෙස දැකීම

# 5. පාරමිතාවන්ගේ ලක්ෂණය රස පච්චුපට්ඨාන පදට්ඨාන කවරහු ද?

මෙම දස පාරමිතාව ම සාමාන්‍ය වශයෙන් අන්‍යයන් හට අනුග්‍රහ කිරීම **ලක්ෂණය** කොට ඇත්තාහ. අන්‍යයන්ට උපකාර වීම හා කම්පා නොවීම **කෘත්‍යය රසය** කොට ඇත්තාහ. හිතෛෂි භාවය හා බුදු බව **වැටහෙන ආකාරය** කොට ඇත්තාහ. මහා කරුණාව හා උපාය කෞෂල්‍යය ඥානය **ආසන්න කාරණය** කොට ඇත්තාහ.

**"විසෙසෙන පන යසමා කරුණූපායකොසල්ල පරිග්ගහිතා අත්තූපකරණ පරිච්චාග චෙතනා දානපාරමිතා"**

විශේෂ වශයෙන් වනාහි කරුණාවෙන් හා උපාය කෞෂල්‍යය ඥානයෙන් පිරිසිඳ ගන්නා ලද තමාගේ ජීවිතය හා අන් සවිඤ්ඤාණක අවිඤ්ඤාණක වස්තු පරිත්‍යාග චේතනාව **"දාන පාරමිතාව"** නම් වේ.

එබැවින් දාන පාරමිතාව පරිත්‍යාගය **ලක්ෂණය** කොට ඇත්තේ ය. දෙන වස්තුවෙහි ලෝභය දුරු කිරීම **කෘත්‍යය රසය** කොට ඇත්තේ ය. වස්තුවෙහි නො ඇලීම හා භව සම්පත්තිය **වැටහෙන ආකාරය** කොට ඇත්තේ ය. පරිත්‍යාග කළ යුතු වස්තුව **ආසන්න කාරණය** කොට ඇත්තේ ය.

**"කරුණූපාය කොසල්ලපරිග්ගහිතං කායවචීසුචරිතං අත්ථතො අකත්තබ්බවිරතිකත්තබ්බකරණ චෙතනාදයො ච සීලපාරමිතා"**

කරුණාවෙන් හා උපාය කෞෂල්‍ය ඥානයෙන් පිරිසිඳ ගන්නා ලද කාය වාක් සුචරිතය අර්‍ථ වශයෙන් නො කළ යුතු දෙයින් වැළකීමේ හා කළ යුතු දේ කිරීමේ චේතනාදීහු **"සීල පාරමිතාව"** නම් වේ.

සීල පාරමිතාව සීලන හෙවත් කය වචනය දෙක සුරැකි ව තබා ගැනීම හා මනා කොට පිහිටුවීම, කුසල ධර්‍මයන්ට ආධාර වන බව **ලක්ෂණය** කොට ඇත්තේ ය. දුසිල් බව නැසීම ද නිරවද්‍ය බව ද **කෘත්‍යය රසය** කොට ඇත්තේ ය. පිරිසිදු බව **වැටහෙන ආකාරය**

කොට ඇත්තේ ය. හිරි ඔත්තප්ප දෙක **පදනම** හෙවත් **ආසන්න කාරණය** කොට ඇත්තේ ය.

**"කරුණූපායකොසලල පරිගගහිතො ආදීනවදසසන පුබබඞගමො කාමභවෙහි නිකඛමන චිත්තුපපාදෙ නෙකඛමමපාරමිතා"**

කරුණාවෙන් හා උපාය කෞෂල්‍ය ඥනයෙන් පිරිසිඳ ගන්නා ලද ආදීනව දැක්ම පෙරදැරි වූ කාම භවයන්ගෙන් නික්මීමේ සිත ඉපදවීම "**නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව**" නම් වේ.

ඒ මේ නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව කාමයෙන් ද භවයෙන් ද නික්මීම **ලක්‍ෂණය** කොට ඇත්තේ ය. කාමයෙහි ද භවයෙහි ද ආදීනව ප්‍රකට කිරීම **කෘත්‍යය රසය** කොට ඇත්තේ ය. එම කාමයන්ට හා භවයන්ට පිටුපානා බව **වැටහෙන ආකාරය** කොට ඇත්තේ ය. සංවේගය **පදනම** හෙවත් **ආසන්න කාරණය** කොට ඇත්තේ ය.

**"කරුණූපායකොසලල පරිගගහිතො ධමමානං සාමඤ‍ඤ විසෙස ලකඛණාවබොධො පඤ‍ඤපාරමිතා"**

කරුණාවෙන් හා උපාය කෞෂල්‍ය ඥනයෙන් පිරිසිඳ ගන්නා ලද ධර්මයන් ගේ සාමාන්‍ය විශේෂ ලක්‍ෂණාවබෝධය "**ප්‍රඥ පාරමිතාව**" නම් වේ.

ඒ මේ ප්‍රඥ පාරමිතාව යථා ස්වභාවය අවබෝධ කිරීම ද, දක්‍ෂ දුනුවායෙක් විසින් විදින ලද ශරවේදයක් (ඊ තලයක්) මෙන් නො පැකිළ ප්‍රතිවේධ කිරීම **ලක්‍ෂණය** කොට ඇත්තේ ය. පහනක් මෙන් ගෝචර වූ ධර්මයන්ගේ බැබළීම **කෘත්‍යය රසය** කොට ඇත්තේ ය. වනයකට ගිය ස්වදේශිකයෙකු මෙන් මුළා නොවීම **වැටහෙන ආකාරය** කොට ඇත්තේ ය. සිතෙහි එකඟ කම හා චතුස්සත්‍යය පදනම හෙවත් **ආසන්න කාරණය** කොට ඇත්තේ ය.

**"කරුණූපායකොසලල පරිගගහිතො කායචිත්තෙහි පරහිතාරමෙභා වීරියපාරමිතා"**

කරුණාවෙන් හා උපාය කෞශල්‍ය ඥානයෙන් පිරිසිඳ ගන්නා ලද කයින් හා සිතින් අන්‍යයන්ට වැඩ කිරීමෙහි පැවතියා වූ උත්සාහය "**වීර්‍ය්‍ය පාරමිතාව**" නම් වේ.

එම වීර්‍ය්‍ය පාරමිතාව උත්සාහය **ලක්‍ෂණය** කොට ඇත්තේ ය. උපස්ථම්භනය හෙවත් සිතට අනුබල දීම **කෘත්‍යය රසය** කොට ඇත්තේ ය. නො පසුබැසීම **වැටහෙන ආකාරය** කොට ඇත්තේ ය. වීර්‍ය්‍යාරම්භ වස්තු හා සංවේගය (අෂ්ට මහා සංවේග වස්තු) **පදනම** හෙවත් **ආසන්න කාරණය** කොට ඇත්තේ ය.

**"කරුණූපාය කොසලල පරිගගහිතං සත්තසඞ්ඛාරාපරාධ සහනං අදොසප්පධානො තදාකාරප්පවත්ත චිත්තුප්පාදො ඛන්තිපාරමිතා"**

කරුණාවෙන් හා උපාය කෞශල්‍ය ඥානයෙන් පිරිසිඳ ගන්නා ලද සත්ව සංස්කාරයන් (සවිඤ්ඤාණක අවිඤ්ඤාණක වස්තූන්) විසින් කරනු ලබන අපරාධයන් ඉවසීමත් එසේ ඉවසීම් වශයෙන් පැවතියා වූ අද්වේෂය (මෛත්‍රිය) ප්‍රධාන කොට ඇති සිත් ඉපදවීමත් "**ක්‍ෂාන්ති පාරමිතාව**" නම් වේ.

ඒ මේ ක්‍ෂාන්ති පාරමිතාව ඉවසීම ලක්‍ෂණය කොට ඇත්තේ ය. ඉෂ්ට අනිෂ්ට ධර්‍මයන් (සැප දුක්) ඉවසීම **කෘත්‍යය රසය** කොට ඇත්තේ ය. ඉවසීම හා අවිරුද්ධ බව **වැටහෙන ආකාරය** කොට ඇත්තේ ය. තත් වූ පරිද්දෙන් දැකීම **පදනම** හෙවත් **ආසන්න කාරණය** කොට ඇත්තේ ය.

**"කරුණූපායකොසලල පරිගගහිතං විරතිචෙතනාදිභෙදං අවිසංවාදනං සච්චපාරමිතා"**

කරුණාවෙන් හා උපාය කෞශල්‍ය ඥානයෙන් පිරිසිඳ ගන්නා ලද විරති[1] චේතනා ආදී ප්‍රභේද ඇති විසංවාදනය හෙවත් බොරු නොකී ම "**සත්‍යය පාරමිතාව**" නම් වේ.

---

[1] සම්මා වාචා - සම්මා කම්මන්ත - සම්මා ආජීව

මේ සත්‍යය පාරමිතාව විසංවාදනය හෙවත් කාරණය අන්‍යයන්ට නො වැරදවීම **ලක්‍ෂණය** කොට ඇත්තේ ය. ඇති සැටි ප්‍රකට කිරීම **කෘත්‍යය රසය** කොට ඇත්තේ ය. වචනවල යහපත් බව **වැටහෙන ආකාරය** කොට ඇත්තේ ය. සුරත බව හෙවත් විනීත බව **පදනම** හෙවත් **ආසන්න කාරණය** කොට ඇත්තේ ය.

**"කරුණූපායකොසලල පරිගගහිතං අචලසමාදනාධිට්ඨානං තදකාරපපවත්තො චිත්තුපපාදෙ අධිට්ඨානපාරමිතා"**

කරුණාවෙන් හා උපාය කෞෂල්‍ය ඥානයෙන් පිරිසිඳ ගන්නා ලද අචල සමාධිෂ්ඨානය හෙවත් සමාදන් වන ධර්‍මයන්හි නිශ්චලව පිහිටීම ද එබඳු ආකාරයෙන් පිහිටි සිත් ඉපදවීම ද "**අධිෂ්ඨාන පාරමිතාව**" නම් වේ.

ඒ මේ අධිෂ්ඨාන පාරමිතාව බෝධි සම්භාර ධර්‍මයන්හි නො සැලී පිහිටීම **ලක්‍ෂණය** කොට ඇත්තේ ය. ඒ බෝධි සම්භාර ධර්‍මයන්ට ප්‍රතිපක්‍ෂ (විරුද්ධ) වූ ධර්‍මයන් මැඩ පැවැත්වීම **කෘත්‍යය රසය** කොට ඇත්තේ ය. ඒ බෝධි සම්භාර ධර්‍මයන්හි නිශ්චල බව **වැටහෙන ආකාරය** කොට ඇත්තේ ය. ඒ බෝධි සම්භාර ධර්‍මයන් ම **පදනම** හෙවත් **ආසන්න කාරණය** කොට ඇත්තේ ය.

**"කරුණූපායකොසලල පරිගගහිතො ලොකසස හිතසුඛූපසංහාරො අතථතො අබ්‍යාපාදෙ මෙත්තාපාරමිතා"**

කරුණාවෙන් හා උපාය කෞෂල්‍ය ඥානයෙන් පිරිසිඳ ගන්නා ලද ලෝක සත්ත්වයන් වෙත හිත සැප එළවීම, අර්‍ථ වශයෙන් අව්‍යාපාදය (මෛත්‍රිය) "**මෛත්‍රී පාරමිතාව**" නම් වේ.

ඒ මේ මෛත්‍රී පාරමිතාව සත්ත්වයන් කෙරෙහි හිත මිත්‍ර භාවයෙන් යුක්තවීම **ලක්‍ෂණය** කොට ඇත්තේ ය. හිතෛෂී බව හා ක්‍රෝධය දුරු කිරීම **කෘත්‍යය රසය** කොට ඇත්තේ ය. සෞම්‍ය බව **වැටහෙන ආකාරය** කොට ඇත්තේ ය. සත්ත්වයන්ට මනාප බව දක්වීම **පදනම** හෙවත් **ආසන්න කාරණය** කොට ඇත්තේ ය.

**"කරුණූපායකොසලල පරිගගහිතා අනුනයපටිසවිදධංසනී ඉටඨානිටෙඨසු සතතසඞඛාරෙසු සමපපවතති උපෙකඛාපාරමිතා"**

කරුණාවෙන් හා උපාය කෞශල්‍ය ඥානයෙන් පිරිසිඳ ගන්නා ලද ඇලීම් හා ගැටීම් නසන තමාට ප්‍රිය වූ ද, අප්‍රිය වූ ද සත්ව සංස්කාරයන් (සවිඤ්ඤාණක අවිඤ්ඤාණක වස්තූන්) කෙරෙහි සමව පැවැත්ම **"උපේක්‍ෂා පාරමිතාව"** නම් වේ.

මේ උපේක්‍ෂා පාරමිතාව මධ්‍යස්ථ ස්වභාවයෙන් පෙනී සිටීම ලක්‍ෂණය කොට ඇත්තේ ය. සාධාරණ හෙවත් සම බව දැක්වීම කෘත්‍යය රසය කොට ඇත්තේ ය. කෝපය හා ඇලීම සන්සිඳවීම වැටහෙන ආකාරය කොට ඇත්තේ ය. කර්‍මය ස්වකීය කොට ඇති බව (කර්‍මානුරූපව සැප දුක් විඳින බව) පදනම හෙවත් ආසන්න කාරණය කොට ඇත්තේ ය. මෙසේ කරුණාවෙන් හා උපාය කෞශල්‍ය ඥානයෙන් පරිගෘහිත වූ දාන සීලාදී කුසල ධර්‍ම මහ බෝසතාණන් වහන්සේලා ගේ සන්තානයෙහි පවත්නා වූ **"පාරමී"** නම් වෙති.

# 6. පාරමිතා ධර්‍මයන් ගේ ප්‍රත්‍යය කවරේ ද?

ප්‍රථම කොට අභිනීහාරය හෙවත් මුල් ම ප්‍රාර්‍ථනාව පාරමිතාවන්ට ප්‍රත්‍යය වෙයි. එය වනාහි අෂ්ට ධර්‍ම සමෝධානය නම් වේ. එනම්:-

**"මනුසසතතං ලිඞගසමපතති - හෙතු සතථාරදසසනං,**
**පබබජජා ගුණසම්පතති - අධිකාරො ච ඡනදතා,**
**අටඨධමමසමොධානා - අභිනීහාරො සමිජඣතී"**

❖ **මනුසසතතං:-**

මිනිසත් බව ලැබූවෙකු ම සම්මා සම්බුද්ධත්වයට පැමිණෙන හෙයින් ප්‍රථම විවරණය ලබන විට ඒ මහ බෝසතාණන් වහන්සේලා මිනිසත් බව ලැබූවෙකු ම විය යුතු ය.

❖ **ලිඞගසමපතති:-**

මිනිසත් බව ලැබූවෙකු වූව ද පුරුෂයෙක් ව උපන්නෙකු ම සම්බුද්ධත්වයට පැමිණෙන හෙයින් ප්‍රථම විවරණය ලබන විට ඒ මහ බෝසතාණන් වහන්සේලා පුරුෂභාවය ලැබූවෙකු ම විය යුතු ය. ස්ත්‍රියක ගේ ප්‍රාර්ථනාව සමෘද්ධ නොවේ. තව ද පුරුෂභාවය ලබා සිටියේ වී නමුත් පණ්ඩක නපුංසක උභතොබ්‍යඤ්ජනකාදීහු ද, අඳ ගොළු බිහිරි විකලාංග ඇතියවූන් ගේ ද ප්‍රාර්ථනාව සමෘද්ධ නොවේ. කුමක් හෙයින් ද යත් :-

ඉහත සඳහන් කාරණය නිසා ද ලක්‍ෂණයන් ගේ පිරිපුන් බවක් නොමැති නිසා ද වේ. මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් ද මෙසේ වදරණ ලද්දේ ම ය. **"අටඨානමෙතං, භිකඛවෙ, අනවකාසො, යං ඉතථී අරහං අසස සමමාසමබුදෙධා"** යනුවෙන් මහණෙනි, යම් හෙයකින් ස්ත්‍රියක් අර්හත් සම්‍යක් සම්බුද්ධ වේ යැයි යන මේ කාරණය විද්‍යමාන නොවේ. එය හේතු රහිත ය. එහෙයින් මිනිසත් බව ලබා සිටියේ වී නමුත් ස්ත්‍රී පණ්ඩකාදීන් ගේ ප්‍රාර්ථනාව සමෘද්ධ නොවේ.

❖ **හෙතු :-**

උපනිඃශ්‍රය සම්පත්තිය හෙවත් පශ්චිම භවිකව උපන් අර්හත්වය ලැබීමට පින් ඇති බව ය. මිනිසත් බව ලබා උපන් පුරුෂයකු ගේ වූව ද උපනිඃශ්‍රය සම්පත්තිය ඇතියහුගේ ම ප්‍රාර්ථනාව සමෘද්ධ වේ. සෙස්සන් ගේ ප්‍රාර්ථනාව සමෘද්ධ නොවේ.

❖ **සතථාරදසසනං:-**

සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමක් හමුවීමයි. ජීවමාන බුදුරජාණන් වහන්සේ නමක් හමුවෙහි ම ප්‍රාර්ථනා කරන්නහු ගේ ප්‍රාර්ථනාව සමෘද්ධ වේ. බුදුරජාණන් වහන්සේ පිරිනිවි කල්හි ද, ශාරීරික ධාතු නිදන් කළ චෛත්‍ය රාජයාණන් වහන්සේ නමක් හමුවෙහි ද, බෝධි රාජයාණන් වහන්සේ නමක් හමුවෙහි ද, බුද්ධ ප්‍රතිමා වහන්සේ නමක් හමුවෙහි ද, පසේ බුදුරජාණන් වහන්සේ

නමක් හමුවෙහි ද, අග්‍ර ශ්‍රාවක මහා ශ්‍රාවකා දී බුද්ධ ශ්‍රාවකයන් වහන්සේ නමක් හමුවෙහි ද කරන ලද ප්‍රාර්ථනාව සමෘද්ධ නොවේ. කුමක් හෙයින් ද යත්? ජීවිත පරිත්‍යාග සංඛ්‍යාත අධිකාරය බලවත් නොවන හෙයිනි. ප්‍රාර්ථනාව ගේ උදර භාවය නිසා ජීවමාන බුදුරජාණන් වහන්සේ නමක් හමුවෙහි ම කළ ප්‍රාර්ථනාව සමෘද්ධ වේ. එය අතිශයින් ම බලවත් වන හෙයිනි.

### ❖ පබ්බජ්ජා :-

ජීවමාන බුදුරජාණන් වහන්සේ නමක් හමුවෙහි දී ම ප්‍රාර්ථනා කරන්නේ ද කර්මවාදී - ක්‍රියාවාදී තාපසයන් හමුවෙහි හෝ බුද්ධ ශාසනයෙහි හෝ පැවිද්ද ලැබූවහුගේ ම ප්‍රාර්ථනාව සමෘද්ධ වේ. ගිහිව සිට ප්‍රාර්ථනා කළහු ගේ එම ප්‍රාර්ථනාව සමෘද්ධ නොවේ. කුමක් හෙයින් ද යත්? බුදු බවට සුදුසු නොවන බැවිනි. මහ බෝසතාණන් වහන්සේලා වනාහි පැවිදි බව ලබා සිටියදී ම සම්‍යක් සම්බෝධියට පැමිණෙති. ගිහි භාවයෙහි සිට නොලබති. එහෙයින් ප්‍රථම විවරණය ලබන කල්හි ද පැවිදි ව සිටීම ම සුදුසු වෙති. ඒ පැවිද්ද වනාහි කිසියම් උසස් ගුණ සම්පත්තියක පිහිටීමක් වන බැවිනි.

### ❖ ගුණ සමපතති :-

අභිඥා ආදී ගුණ විශේෂයෝ ය. පැවිදි ව සිට බුදුරජාණන් වහන්සේ හමුවෙහි ප්‍රාර්ථනා කරන්නේ නමුත් පඤ්ච අභිඥා අෂ්ට සමාපත්ති ලාභීහුගේ ම ප්‍රාර්ථනාව සමෘද්ධ වේ. එම ගුණ සම්පත්තිය නො ලැබූවහුගේ ප්‍රාර්ථනාව සමෘද්ධ නොවේ. කුමක් හෙයින් ද යත්? එම අභිඥා ගුණ නැතියහු පාරමිතා ගුණ මොනවා ද යැයි විමසා බැලීමට අසමත් බැවිනි. උපනිඃශ්‍රය සම්පත්තියෙන් හා අභිඥා සම්පත්තියෙන් යුක්ත වූ මහා පුරුෂයන් වහන්සේලා ම කළ ප්‍රාර්ථනාව අනුව එම පාරමී ගුණ සොයා පූර්ණය කරන්නට සමර්ථ වන හෙයිනි.

❖ **අධිකාරො :-**

ජීවිත පරිත්‍යාගයෙන් කළ ප්‍රාර්ථනා ඇති බවයි. අධික වූ උපකාරය ද, අධික වූ පරිත්‍යාගය ද යැයි කියන ලද ගුණයෙන් යුක්ත වූයේ ද, යමෙක් තමාගේ ජීවිතයත් බුදුරජාණන් වහන්සේට පූජා කර කරනු ලබන අධික වූ උපකාරයක් වේ ද, ඔහුගේ ම ප්‍රාර්ථනාව සමෘද්ධ වේ. අනිකෙකුගේ ප්‍රාර්ථනාව සමෘද්ධ නොවේ.

❖ **ඡන්දතා :-**

කත්තුකම්‍යතා කුසල ඡන්දයයි. ඉහත කියන ලද ගුණයන්ගෙන් පරිපූර්ණ වූ යම් උතුමෙකුට බුද්ධ කාරක ධර්මයන් සඳහා යම් මහත් වූ කැමැත්තක් මහත් වූ ප්‍රාර්ථනාවක් මහත් වූ කරනු කැමැත්තක් ඇත්තේ වේ ද, ඔහුගේ ම ප්‍රාර්ථනාව සමෘද්ධ වේ. අනිකෙකු ගේ ප්‍රාර්ථනාව සමෘද්ධ නොවේ. මෙහි ඡන්දතාව හෙවත් කැමැත්ත පිළිබඳ ව මෙසේ උපමා දැක්වීමක් වේ.

අප වාසය කරන මේ ලෝක ධාතුව චක්‍රාවාට පර්වතයෙන් වටය. එහි මැදින් අතරතුර දුර (විෂ්කම්භය) යොදුන් දෙළොස් ලක්‍ෂ තුන්දහස් හාරසිය පණසකි (1203450). යම් වීර උතුමන් වහන්සේ නමක් එකම ජලාශයක් වූ මෙම සක්වළ ගැබ මැදින් තම අත් පා ශක්තියෙන් අතරතුර පීනා ගොස් එතෙර වන්නට සමර්ථ වේ ද, එබඳු වීයර්‍යවන්ත උතුමන්ට ම බුද්ධත්වය ලැබිය හැකි යැයි අසන්නට ලැබෙන්නේ ද, එය කළ නොහැක්කක් සේ නො අදහා **"මම එය පීනා එතෙර වන්නෙමි"** යැයි හටගත් කැමැත්තක් ඇත්තේ වේ ද, එහි හැකිළීමකට පසුබැහැමකට නො පැමිණේ ද එබඳු වූ වීයර්‍යවන්ත පුරුෂයන්ගේ ම ප්‍රාර්ථනාව සඵල වෙති.

තව ද දුම් නැති ගිනි දැල් නැති රතු වන් ගිනි අඟුරින් පිරුණු සක්වළ ගල අතරතුර එය පයින් පාගමින් මැදින් ගොස් එතර යෑමට යමෙක් සමර්ථ වේ ද, එසේම දෙපැත්ත කැපෙන පිහිය තල උල් ආදියෙන් පිරුණු සක්වළ ගලක් අතරතුර ඒවා පයින් මඩිමින් එතර යාමට යමෙක් සමර්ථ වේ ද, එසේම යමෙක් අතරක් නැර

කටුවලින් ගැවසී ගත් ඝනව වැවුණු උණ පඳුරුවලින් ගැවසී ගත්තා වූ මුලු සක්වළ පුරා පිහිටි උණ වනයක් මැදින් එතර යාමට කැමති වේ ද, සමර්‍ථ වේ ද, හැකිළීමට නො පැමිණේ ද, යමෙක් සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් මුළුල්ලෙහි නරකයෙහි පැසී බුදු බවට පැමිණිය යුතුය යැයි අසා එය දුෂ්කර දෙයක් යැයි නො අදහා **"මම එපමණ කලක් එහි පැසී බුදු බවට පැමිණෙන්නෙමි"** යැයි හටගත් කැමැත්ත ඇත්තේ වේ ද, පසුබැසීමකට නො පැමිණේ ද, මේ ආදී ලෙස මහ බෝසතාණන් වහන්සේලාගේ ලෝ සතුන් සසර කතරින් ගොඩ නගන්නට පාරමිතා පුරා බුදු බව ලැබීමේ කැමැත්තෙහි මහත් බව දත යුතු ය.

❖ **"අට්ඨධම්මසමොධානා - අභිනීහාරො සමිජ්ඣති"** :-

මෙසේ මේ අභිනීහාරය අංග අටකින් සමන්විත වේ. අර්‍ථ වශයෙන් එම අට වැදැරුම් අංගයන් ගේ එකතුවෙන් යුත් චිත්තෝත්පාදය එක්වන්ව යෙදීමෙන් ප්‍රාර්‍ථනාව සමෘද්ධ වේ.

මෙසේ මේ අෂ්ට ධර්‍මයන්ගේ එක්වීමෙන් සම්පාදිත ව මහ බෝසතාණන් වහන්සේලාගේ සන්තානයෙහි විශේෂ වූ අධිෂ්ඨාන ප්‍රාර්‍ථනාවන් හට ගනිති. එනම් :-

❖ **"තිණ්ණොහං තාරෙය්‍යං"**

මම සසරින් එතරව ලෝ සතුන් සසර කතරින් එතර කරවමි.

❖ **"මුත්තොහං මොචෙය්‍යං"**

මම කෙලෙසුන්ගෙන් මිදී සියලු සත්ත්වයන් කෙලෙසුන්ගෙන් මුදවමි.

❖ **"දන්තොහං දමෙය්‍යං"**

මම කෙලෙස් ක්‍රියාකාරකම්වලින් දමනය වී සියලු ලෝ සතුන් ද කෙලෙසුන්ගෙන් දමනය කරවමි.

❖ "සනෙතාහං සමෙයාං"

මම සන්සිඳීමට පත්ව සියලු සත්ත්වයන් ද සන්සිඳීමට පත් කරවමි.

❖ "අසසතෙතාහං අසසසෙයාං"

මම සැනසීමට පත්ව සියලු සත්ත්වයන් ද සැනසීමට පත් කරවමි.

❖ "පරිනිබබුතොහං පරිනිබබාපෙයාං"

මම කෙලෙස් පිරිනිවීමෙන් නිවීමට පැමිණ සියලු ලෝ සතුන් ද කෙලෙස් පිරිනිවීමෙන් නිවීමට පත් කරවමි.

❖ "සුදෙධාහං සොදෙයාං"

මම කෙලෙසුන්ගෙන් පිරිසිදු වී සියලු සත්ත්වයන් ද කෙලෙසුන්ගෙන් පිරිසිදු කරවමි.

❖ "බුදෙධාහං බොධෙයාං"

මම සත්‍යය අවබෝධ කරගෙන සියලු සත්ත්වයන්ට ම සත්‍යය අවබෝධ කරවමි.

මෙලෙස පැවතියේ අභිනීහාරය හෙවත් මුල් ප්‍රාර්ථනාවයි. එය අවිශේෂයෙන් සියලු ම පාරමිතාවන්ට ප්‍රත්‍ය වේ. එම අභිනීහාර ප්‍රවෘත්තියෙන් මතුවට පාරමිතාවන් ගේ සෙවීම, වැටහීම, සමාදනය, අධිෂ්ඨානය, නිෂ්පත්තිය (හට ගැනීම) යන මේ සියල්ල ම මහා පුරුෂයන් වහන්සේලාට හමුවේ.

ඒ අභිනීහාරය වනාහි මනා කොට සම්‍යක් සම්බෝධියෙහි පිහිටුවීම **ලක්‍ෂණය** කොට ඇත්තේ ය.

**"අහෝ ඒකාන්තයෙන් මම උතුම් වූ සම්‍යක් සම්බෝධිය අවබෝධ කරන්නෙමි නම් සියලු සත්ත්වයන්ට ම හිතසුව**

**එළවන්නෙමි"** යැයි මේ ආදී ප්‍රාර්ථනාව **කෘත්‍යය රසය** කොට ඇත්තේ ය.

බෝධි සම්භාර ධර්මයන්ට හේතුවන බව **වැටහෙන ආකාරය** කොට ඇත්තේ ය.

මහා කරුණාව හා උපනිඃශ්‍රය සම්පත්තිය **පදනම** හෙවත් **ආසන්න කාරණය** කොට ඇත්තේ ය.

මෙය වනාහි සිතිය නොහැක්කා වූ බුද්ධ භූමිය ද, අප්‍රමාණ වූ සත්ව ලෝකයට වැඩ සැලසීම ද අරබයා පැවති සියලු බුද්ධ කාරක ධර්මයන්ට මුල් වූ ඉතා යහපත් වූ පරම කල්‍යාණ වූ අප්‍රමාණ ප්‍රභාව ඇති පුණ්‍ය මහිමයක් වේ.

යම් අභිනීහාර ධර්මයක (ප්‍රාර්ථනාවක) පහළ වීමත් සමගම මහා පුරුෂයන් වහන්සේලා මහා බෝධි යාන (බුද්ධ කාරක ධර්ම සෙවීමේ) ප්‍රතිපත්තියට බැස ගත්තේ නම් වෙයි ද, නියත භාවයට පැමිණීමෙන් එයින් නොනැවතීම ස්වභාව කොට ඇති හෙයින් එතැන් පටන් **"බෝධිසත්ව"** යන ව්‍යවහාරය හෙවත් ගෞරව නාමය ලබති. සර්වප්‍රකාරයෙන් සම්‍යක් සම්බෝධියෙහි මනාව ඇලුණු සිත් ඇති බව ද, බෝධි සම්භාර ශික්ෂාවන්හි සමර්ථ බව ද එතුමන් වහන්සේලාට පිහිටන්නාහ.

ඉහත කියන ලද අභිනීහාරයන් සමෘද්ධ වීමෙන් ඒ මහා පුරුෂයන් වහන්සේලා සර්වඥතා ඥානාධිගමය පූර්ව ලක්ෂණ කොට ඇතිව ස්වයම්භූ ඥානයෙන් (තමාගේ ම වැටහීමේ නුවණින්) මනා කොට සියලු පාරමිතාවෝ සොයා දැන ඒ පාරමිතා ධර්මයන් සමාදන් ව පිළිවෙලින් පූර්ණය කරති.

එම අභිනීහාරයට ප්‍රත්‍යය සතරක් ද, හේතු සතරක් ද, බල සතරක් ද ඇත්තේ ය. ඒවා මෙසේ ය.

## ❄ මහාභිනීහාරය පිණිස වන්නා වූ ප්‍රත්‍යය සතර

1. මේ ලෝකයෙහි මහා පුරුෂයන් වහන්සේලා මහත් බුද්ධානුභාවයෙන් ඓශ්චර්‍ය්‍යය වූ අද්භූත වූ ප්‍රාතිහාර්‍ය්‍යය කරන්නා වූ තථාගතයන් වහන්සේ නමක් දකිත් ද, එවිට ඒ බුදුරජාණන් වහන්සේලා අරමුණු කොට **"මේ ධර්ම ධාතුව වනාහි ඒකාන්තයෙන් මහත් ආනුභාව ඇත්තේ ය. යම් ධර්ම ධාතුවක් අවබෝධ කළ හෙයින් භාග්‍යවතුන් වහන්සේ මෙබඳු ඓශ්චර්‍ය්‍යය අද්භූත ස්වභාව ඇති සේක. අචින්ත්‍ය වූ ආනුභාව ඇති සේක"** යනුවෙන් මහා බෝධියෙහි (බුදු බව කෙරෙහි) සිත පිහිටුව යි. මහා සත්ත්වයන් වහන්සේලා ඒ මහානුභාව දර්ශනය නිසාම එය ප්‍රත්‍යය කොට සම්බෝධියෙහි ඇලෙන්නාහු එහි සිත පිහිටුවති. මේ මහාභිනීහාරය පිණිස වන්නා වූ පළමු වන ප්‍රත්‍යයයි.

2. මහා සත්ත්වයන් වහන්සේලා තථාගතයන් වහන්සේ ගේ එසේ කියන ලද මහානුභාවය නොදකිත් ද, එසේ වුවත් **"භාග්‍යවතුන් වහන්සේ මෙබඳු වූ ද, මෙබඳු වූ ද ගුණ ඇත්තාහ"** යැයි අසයි ද, ඒ ඇසීම ප්‍රත්‍යය කොට සම්බෝධියෙහි ඇලෙන්නාහු එහි සිත පිහිටුවති. මේ මහාභිනීහාරය පිණිස වන්නා වූ දෙවන ප්‍රත්‍යයයි.

3. මහා සත්ත්වයන් වහන්සේලා තථාගතයන් වහන්සේ ගේ එසේ කියන ලද මහානුභාවය නොදකිත් ද, අන්‍යයන්ගෙන් නො අසයි ද, එසේ වුවත් භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද **"දසබලසමන්නාගතො භික්ඛවෙ තථාගතො"** (මහණෙනි, තථාගතයන් වහන්සේ බල දශයකින් යුක්ත වන්නාහ) යැයි ආදී වශයෙන් වදාළ බුද්ධානුභාව ප්‍රතිසංයුක්ත වූ ධර්මය අසයි ද එතුමන් වහන්සේලා ඒ ධර්මය ප්‍රත්‍යය කොට සම්බෝධියෙහි ඇලෙන්නේ එහි සිත පිහිටුව යි. මේ මහාභිනීහාරය පිණිස වන්නා වූ තෙවැනි ප්‍රත්‍යයයි.

4. මහා සත්ත්වයන් වහන්සේලා තථාගතයන් වහන්සේ ගේ එසේ කියන ලද මහානුභාවය නොදකිත් ද, අන්‍යයන්ගෙන් නො අසත්

ද, ධර්‍මයෙන් නොම අසත් ද එසේ වුවත් උදර අදහස් ඇති කල්‍යාණාධිමුත්තිය හෙවත් යහපත් කුසල ධර්‍මයන් කෙරෙහි නිශ්චය ඇත්තේ **"මම මේ බුද්ධ වංශය, බුද්ධ තන්තිය හෙවත් බුද්ධ වචනය, බුද්ධ ප්‍රවේණිය, බුද්ධ ධර්‍මතාවය පරිපාලනය කරන්නෙමි"** යැයි හැම විටම ධර්‍මයටම සත්කාර කරමින් ගරුකාර කරමින් බුහුමන් කරමින් පූජා කරමින් එය නිසා එය ප්‍රත්‍යය කොට සම්බෝධියෙහි ඇලෙන්නේ එහි සිත පිහිටුවත්. මේ මහාභිනීහාරය පිණිස වන්නා වූ සිව්වැනි ප්‍රත්‍යයයි.

## ❄ මහාභිනීහාරය පිණිස වන්නා වූ හේතු සතර

1. මහා පුරුෂයන් වහන්සේලා ස්භාවයෙන් ම උපනිඃශ්‍රය සම්පන්න වූයේ පළමු බුදුවරයන් වහන්සේලා කෙරෙහි කරන ලද ප්‍රාර්‍ථනා (වාප්‍රනිධාන මනෝප්‍රනිධාන) ඇත්තේ ද වෙති. මෙය මහාභිනීහාරය පිණිස පවත්නා වූ පළමු වන හේතුවයි.

2. මහා පුරුෂයන් වහන්සේලා ස්භාවයෙන් ම කරුණාධ්‍යාශ (කරුණාවන්තව කටයුතු කරණ ස්භාවය) ඇත්තේ කරුණාවෙහි ඇලුණේ තම දිවි පුදා වූව ද සත්ත්වයන් දුකින් මුදවන කැමැත්තෙන් යුක්ත වූවාහු වෙති. මෙය වනාහි මහාභිනීහාරය පිණිස වන දෙවන හේතුවයි.

3. මහා පුරුෂයන් වහන්සේලා සියලු සසර දුකින් ද, සත්ත්වයන්ට හිත කැමති ව පවත්නා වූ දුෂ්කර චර්‍යාවෙන් ද බොහෝ කාලයක් අපමණ කම්කටොළු විඳිමින් ව්‍යායාමයෙහි යෙදෙන්නේ නමුත් තමන් කැමති වන අර්‍ථ සිද්ධිය සම්පූර්‍ණ වන තෙක් කලකිරීමට පත්වීමක් නැතිව තැතිගැන්මක් නැතිව කාලය ගෙවන්නාහු වෙති. මෙය වනාහි මහාභිනීහාරය පිණිස වන තෙවන හේතුවයි.

4. මහා පුරුෂයන් වහන්සේලා යමෙකු විසින් අහිත දෙයින් වළක්වත් ද හිත දෙයෙහි යොදවත් ද එබඳු කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කරන්නාහු වෙති. මෙය වනාහි මහාභිනීහාරය පිණිස වන සතර වන හේතුවයි.

ඒ මහා බෝධිසත්ත්වයන් වහන්සේලා විශේෂිත වූ උපනිඃශ්‍රය සම්පත්තියකින් යුක්ත වූවාහු වෙති. එහිලා මෙම වර්ණනාව වේ.

ඒකාන්තයෙන් ම මහා සත්ත්වයන් වහන්සේලා ගේ අදහස සම්බෝධියට නැමුණේ විශේෂයෙන් නැමුණේ බර වූයේ වෙති. සත්ත්වයන්ට හිත වැඩ සැලසීම පිණිස අදහස නැමී පවතිත්. එය කරණ කොට ප්‍රථම අභිනීහාරය ලැබීමට පූර්වයෙහි පහළ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේලා සමීපයෙහි සම්බුද්ධත්වය ලැබීම පිණිස **"මම ද මෙසේ වූ සම්‍යක් සම්බෝධියට පැමිණ මනා කොට ම සත්ත්වයන්ට හිත වැඩ සලසන්නෙමි"** යැයි සිතින් ද වචනයෙන් ද ප්‍රාර්ථනා කරන ලද්දාහු වෙති.

මෙලෙස සම්පූර්ණ වූ උපනිඃශ්‍රය සම්පත් ඇති බෝසතාණන් වහන්සේලාට මෙම කරුණු උපනිඃශ්‍රය සම්පත්තියට උපකාර ධර්මයෝ වෙති. යම් කාරනයන්ගෙන් යුක්ත වූ බෝසතාණන් වහන්සේලාට බුද්ධ ශ්‍රාවක බව පිණිස පිළිපන් ශ්‍රාවක බෝධිසත්ත්වයන් වහන්සේලාට හා පසේ බුදු බව ලැබීම පිණිස පිළිපන් ප්‍රත්‍යෙක බෝධිසත්ත්වයන් වහන්සේලාට වඩා විශේෂයක් මහත් වූ නා තත්වයක් ඉන්ද්‍රිය වශයෙන් ද ප්‍රතිපත්ති වශයෙන් ද කුසලතා වශයෙන් ද ප්‍රකට වෙති.

තව ද උපනිඃශ්‍රය සම්පන්න වූ මහා පුරුෂයන් වහන්සේලාට වනාහි ප්‍රකට වූ ශ්‍රද්ධා දී ඉන්ද්‍රියයෝ ඇත්තේ තීක්ෂණ වූ ඥාණය ඇත්තේ වේ ද, සෙසු ප්‍රත්‍යෙක බුද්ධ බෝධිසත්ත්වයන් වහන්සේලාට හා ශ්‍රාවක බෝධිසත්ත්වයන් වහන්සේලාට එසේ නොවෙති. මහා පුරුෂයන් වහන්සේලා සැම කල්හි පරහිත වැඩ පිණිස පිළිපන්නාහු වෙති. තමහට හිත වැඩ පිණිස පිළිපන්නාහු නොවෙති.

එතුමන් වහන්සේලා යම් සේ බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සැප පිණිස, ලොවට අනුකම්පාව පිණිස, දෙව් මිනිසුන්ට අර්ථ ය පිණිස, හිත පිණිස, සැප පිණිස පිළිපන්නාහු වෙත් ද ප්‍රත්‍යෙක බුද්ධ හා ශ්‍රාවක බෝධිසත්ත්වයන් වහන්සේලා එසේ පිළිපන්නාහු නොවෙති.

එහි දී ස්ථානෝචිත වැටහීමෙන් ද ස්ථාන අස්ථාන කුසල භාවයෙන් ද [1] යුක්ත වූවාහු වෙති. එසේම මහා සත්ත්වයන් වහන්සේලා ප්‍රඥාවෙන් දනාධ්‍යාශ ඇත්තාහු වෙති. දන් දීමෙහි ඇලුනාහු වෙති. දිය හැකි දෙය ඇති කල්හි දෙන්නාහු ම වෙති. දුන් දෙය පිළිබඳ ව නැවත පසුතැවීමකට නොපැමිණෙති. නිරන්තරයෙන් ම බෙද දෙන සුළු වූවාහු වෙති. ආදර ගෞරව ඇතිව සතුටු සිතින් ම දෙති. උදාසීන සිතින් නොදෙති. මහත් වූ දනයක් දුන්නේ නමුත් දීමෙන් සෑහීමකට නොපැමිණෙති. මදක් ගැන කියනු ම කවරේ ද? අන්‍යයන්ට දන් දීමෙහි උත්සාහ ඉපදවීම පිණිස දීමෙහි ගුණ වර්ණනා කරති. දනය පිළිබඳ වූ දැහැමි කථා කියති. දන් දෙන අන්‍යයන් දැක ද සතුටු සිත් ඇත්තාහු වෙති. භය උපන් තැන්හි දී අන්‍යයන්ට අභය දෙති. මෙසේ දනාධ්‍යාශ ඇති මහා පුරුෂයන් වහන්සේලා ගේ දන පාරමිතාව පූර්ණය පිළිබඳ වූ ක්‍රමය වේ.

තව ද මහා සත්ත්වයන් වහන්සේලා ප්‍රාණවධ ආදී පාප ධර්මයන් කෙරෙහි ලැජ්ජා ඇත්තාහු වෙති. එහි විපාක පක්ෂයට බිය වෙති. සත්ත්වයන් වෙහෙසට පත් නොකරන ස්වභාව ඇත්තාහු වෙති. එසේ හෙයින් එතුමන් වහන්සේලා සැප ස්වභාවයෙන් යුක්ත වූවාහු  කපටි නොවූ මායා රහිත වූ ඍජු ස්වභාව ඇත්තා වූ සුවච වූ සුවච බව පිණිස පිළිපන් ධර්මයන්ගෙන් යුක්ත වූ මෘදු ස්වභාව ඇත්තා වූ දැඩි නොවූ නිහතමානී ගුණයෙන් යුක්ත වෙති. යටත් පිරිසෙයින් තණසුලක් තරම් වූ ද අන්සතු දෙයක් නොගනිති. තම අතෙහි තබන ලද ණයක් හෝ ගෙන අන්‍යයන් මුලා නොකරති. තමා වෙත තබන ලද අන්සතු දේ පිළිබඳ ව ඒ වස්තු හිමියන් මුලා වූ කල හෝ සිහි නැතිව අමතක වූ කල හෝ එය මතක් කර එය වෙනත් අය අතට

[1] යමක් සිදුවීමට හා සිදු නොවීමට හේතු මෙසේ යැයි දන්නා නුවණ

පත් නොවෙත් ද එලෙස හිමියාට ම පවරා දෙති. අන් සතු දේ වලට ලෝභ නූපදවති. ලාමක හැඟීම් පහළ නොකරගනිති. ස්ත්‍රී ව්‍යසනාදියෙන් දුරින් ම දුරු වෙති. ඇත්ත කියන්නාහු ඇත්තෙන් ඇත්ත ගළපති. බිඳුණු අය සමගි කරති. සමගි වූවන්ට අනුබල දෙති. ප්‍රිය වචන කථා කරති. මද සිනහව පෙරටුව පළමු කොටම කථා වෙති. අර්ථයෙන් යුත් දෙයක් ම කියති. ධර්මවාදී වෙති. දැඩි ලෝභ නැති ව්‍යාපාදයෙන් වෙන් වූ සිත් ඇත්තෝ වෙති. කර්මය අනුව තමන්ට එහි විපාක ලැබෙන බව පිළිගන්නා ඥානයෙන් හා සත්‍යයට අනුලොම් වූ ඥානයෙන් යුක්ත වූ හෙයින් වරදවා නොදකිති. කළ ගුණ දන්නා බැවින් කෘතවේදි වූ වැඩිහිටියන්ට පුදන්නෝ වෙති. පිරිසිදු දිවි පැවැත්ම් ඇති ධර්මයෙහි යෙදීමට කැමත්ත ඇතිව අන්‍යයන් ද ධර්මයෙහි යොදවති. සර්වප්‍රකාරයෙන්ම සත්ත්වයන් අවැඩින් වළක්වා කළ යුත්තෙහි යොදවා තමන් ද එලෙසටම කළ යුත්තෙහි යෙදෙති. තමන්ට යම් වැරදීමක් වූ විගස වහාම එයින් නැගී සිට ආයති සංවරයෙහි පිහිටති. මෙලෙස සීලාධ්‍යාශයෙන් යුක්ත වූ මහා පුරුෂයන් වහන්සේලාගේ සීල පාරමිතාව පිළිබඳ ක්‍රමය වෙයි.

තවද ඒ මහා පුරුෂයන් වහන්සේලා මඳ වූ කෙලෙස් හා මඳ වූ නීවරණ ඇත්තෝ වෙති. පවිවේක අදහස් ඇති කලබල නොවීම ස්වභාව කොට ඇත්තෝ වෙති. පාප විතර්ක එතුමන් වහන්සේලාගේ සිතට නො පැමිණෙති. විවේකයට පැමිණියා වූ එතුමන් වහන්සේලා ගේ සිත වහාම සමාධිගත වෙති. සතුරු ජනයා කෙරෙහි වහාම මෛත්‍රී සිත පිහිටුවා ගනිති. සෙස්සන් කෙරෙහි කියනු ම කවරේ ද? නිරන්තරයෙන් සිහි ඇතිව වෙසෙති. බොහෝ කල් ගියේ නමුත් කළ කී දෑ සිහි කරති. නුවණැත්තාහු වෙති. ධර්මෞජ ප්‍රඥව යැයි කියනු ලබන විදර්ශනා ප්‍රඥවෙන් යුක්ත වෙති. කළ යුතු ඒ ඒ කෘත්‍යයන් හි දක්ෂ වෙති. සත්ත්වයන්ට හිත වූ ක්‍රියාවන්හි පටන් ගත් වීර්‍යයෙන් යුක්ත වෙති. සියල්ල ඉවසන සුළු වූයේ ක්ෂාන්ති බලයෙන් යුක්ත වෙති. අචල වූ අධිෂ්ඨානයෙන් ද දැඩි වූ සමාදනයෙන් ද යුක්ත වෙති. උපේක්ෂා වීමට හේතු වූ ධර්මයන්හි උපේක්ෂා වෙති. මෙසේ ඒ මහා සත්ත්වයන් වහන්සේලා ගේ නෛෂ්ක්‍රම්‍යය අධ්‍යාශයාදී වශයෙන් නෛෂ්ක්‍රම්‍යය පාරමිතාදිය පිළිබඳ කාරණයෝ වෙති.

මෙසේ වූ බෝධි සම්භාර කරුණුවලින් යුක්ත වූ මහා පුරුෂයන් වහන්සේලා හට **"මහාභිනීහාරය සඳහා කල්‍යාණමිත්‍ර ආශ්‍රය හේතු වේ"** යැයි යමක් කියන ලද්දේ වේ ද, මේ සැකෙවින් ඒ කල්‍යාණ මිත්‍රයන් පිළිබඳ ලක්‍ෂණයෝය.

මේ ලෝකයෙහි කල්‍යාණ මිත්‍රයා ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ වේ. සීලයෙන් යුක්ත වූයේ වේ. ශ්‍රැතයෙන් යුක්ත වූයේ වේ. ත්‍යාගයෙන් යුක්ත වූයේ වේ. වීර්‍ය්‍යයෙන් යුක්ත වූයේ වේ. සිහියෙන් යුක්ත වූයේ වේ. සමාධියෙන් යුක්ත වූයේ වේ. ප්‍රඥාවෙන් යුක්ත වූයේ වේ.

මෙහි ශ්‍රද්ධා සම්පත්තිය හේතුකොටගෙන තථාගතයන් වහන්සේ ගේ බුද්ධත්වය ද කර්‍මය හා කර්‍ම ඵලය ද පිළිගනී. එය හේතුකොටගෙන සම්‍යක් සම්බෝධියට හේතු වූ සත්ත්වයන් පිළිබඳ හිතෛෂී බව අත් නොහරී.

සීල සම්පත්තිය හේතුවෙන් සත්ත්වයන්ට ප්‍රියමනාප වේ. ගරු සම්භාවනාවට පැමිණියේ වේ. වරදින් චෝදනාවට ලක් නොවේ. පවට ගර්‍හා කරන්නේ වේ. අන්‍යයන්ට අවවාදනුශාසනා කිරීමට සුදුසු වූයේ වේ. එසේ කරන්නේ ද වේ. පර අපවාද චෝදනා ඉවසන්නෙක් වේ.

ශ්‍රැත සම්පත්තිය හේතුවෙන් සත්ත්වයන්ට හිතසුව එළවන ගැඹුරු කථා කියන්නෙක් වේ.

ත්‍යාග සම්පත්තිය හේතුවෙන් අල්පේච්ඡතාවෙන් යුක්ත වූ ලද දෙයින් සතුටු වන්නෙක් වේ. විවේකයෙහි (භාවනාවෙහි) ඇලුණු සිත් ඇත්තේ වේ. ඥාති හා දයක කුලයන්හී ද පිරිසෙහි ද නො ඇලුණෙක් වේ.

වීර්‍ය්‍යය සම්පත්තිය හේතුවෙන් සත්ත්වයන්ට හිත වැඩ සලසන ප්‍රතිපත්තියෙහි පටන් ගත් අත් නොහරින වීර්‍ය්‍යයෙන් යුක්ත වේ.

සති සම්පත්තිය හේතුවෙන් නිවැරදි ධර්‍මයෙහි එළඹ සිටි සිහිය ඇත්තෙකු වේ.

සමාධි සම්පත්තිය හේතුවෙන් නොවිසුරුණු සිත් ඇති එකඟ වූ සිත් ඇත්තෙකු වේ.

ප්‍රඥා සම්පත්තිය හේතුවෙන් අවිපරීතව (වරදවා නොගෙන) දැන ගන්නෙකු වේ. සිහියෙන් යුක්තව කුසලාකුසල ධර්‍මයන්ගේ ගති ස්වභාවයන් සොයා ප්‍රඥාවෙන් සත්ත්වයන් ගේ හිත අහිත ස්වභාවයන් ඇත්තා වූ ස්වභාවයන් දැන සමාධියෙන් එකඟ වූ සිතින් යුක්තව වීර්‍යයෙන් සත්ත්වයන් අහිතයෙන් වළක්වා හිත දෙයෙහි යොදවති.

එසේ හෙයින් කල්‍යාණ මිත්‍රයා පිළිබඳ ව මේ වර්‍ණනාව වේ.

**"පියො ගරු භාවනීයො - වත්තා ච වචනක්ඛමො,**
**ගම්භීරඤ්ච කථං කත්තා - නො චට්ඨානෙ නියොජයෙති".**

"ඇසුරු කරන්නන්ට ප්‍රිය ජනක වේ. ගෞරවනීය වේ. ගුණ වශයෙන් සම්භාවනාවෙන් යුක්ත වේ. අවවාදනුශාසනා කරන්නෙක් වේ. විචාල ප්‍රශ්න ඉවසන්නෙකු වේ. ගැඹුරු ධර්‍මකථා කියා දෙන්නෙකු වේ. තමන් ඇසුරු කරන්නන් අස්ථානයෙහි (වැරදි මඟ) නො යොදවා නිවන්මඟ, සුගතිමඟ යොදවන්නෙකු වේ. එබඳු උත්තම පුද්ගලයා "**කල්‍යාණ මිත්‍රයා**" නම් වේ".

මෙබඳු වූ ගුණ ඇති කල්‍යාණ මිත්‍රයා නිසා මහා පුරුෂයන් වහන්සේලා තමාගේ හේතු උපනිඃශ්‍රය සම්පත්තිය මනාව පිරිසිදු කර ගනිති. සුවිශුද්ධ වූ ආශය ප්‍රයෝගය[1] ඇතිව සතරවිධ වූ බලයන්ගෙන් යුක්තව නොබෝ කලකින් යුක්තව අෂ්ට ධර්‍ම සමෝධානයන්හි එක්වන්ව පිහිටා මහාභිනීහාරය කරන්නේ නොනවත්නා ස්වභාවයෙන් යුක්තව සම්‍යක් සම්බෝධිය පිහිට කොට ඇතිව බෝධිසත්ව භාවයෙහි පිහිටා ගනිති.

---

[1] විදර්‍ශනා ප්‍රඥාවෙන් යුක්ත වීම

## ❉ මහාභිනීහාරය පිණිස වන්නා වූ බල සතර

අභිනීහාර සම්පන්න වූ මහා බෝසතාණන් වහන්සේලාට "**ආධ්‍යාත්මික බලය, බාහිර බලය, උපනිඃශ්‍රය බලය, ප්‍රයෝග බලය**" යැයි බල සතරක් පිහිටති.

1. ආත්ම පරිත්‍යාගයෙන් ධර්‍ම ගෞරවයෙන් සම්‍යක් සම්බෝධිය පිළිබඳ ව යම් විශේෂ කැමැත්තක්, ඒකාන්තයෙන් සම්බෝධියට නැඹුරු වූ අදහස් ඇති බවක් වේ ද, යමක් කරණ කොට ගෙන මහා පුරුෂයන් වහන්සේලා තමන් ම අධිපති කොට ගෙන පවට ලැජ්ජා ඇතිව අභිනීහාර සම්පන්න වූයේ (ප්‍රාර්‍ථනාව සමෘද්ධිමත් කිරීමෙහි පිහිටියේ) මෙසේ පාරමිතා ධර්‍ම පූර්‍ණය කොට සම්‍යක් සම්බෝධියට පැමිණෙත් ද මෙය ආධ්‍යාත්මික බලය නම් වේ.

2. අනුන් ඇසුරු කොට සම්‍යක් සම්බෝධිය පිළිබඳ ව යම් අභිරුචියක්, ඒකාන්තයෙන් සම්බෝධිය පිළිබඳ ව නැඹුරු වූ අදහස් ඇති බවක් වේ ද, යමක් කරන කොට ගෙන මහ පුරුෂයන් වහන්සේලා ලෝකාධිපති (සියලු ලෝ සතුන්ට නායක) වූයේ ගෞරව ස්වභාව ඇත්තේ අභිනීහාර සම්පන්න වූයේ පාරමිතා ධර්‍ම පූර්‍ණය කොට සම්‍යක් සම්බෝධියට පැමිණෙත් ද මෙය බාහිර බලය නම් වේ.

3. සම්‍යක් සම්බෝධිය පිණිස උපනිඃශ්‍රය සම්පත්තියෙහි යම් කැමැත්තක්, ඒකාන්තයෙන් නැමුණු සිත් ඇති බවක් වේ ද යමක් කරණ කොට ගෙන මහ පුරුෂයන් වහන්සේලා තියුණු වූ ශ්‍රද්ධා දී ඉන්ද්‍රියයන් ඇතිව ප්‍රකට වූ (පඨවි ආදී) ධාතු ඇතිව සිහියෙහි පිහිටියේ අභිනීහාරයන්ගෙන් යුක්තව පාරමිතා ධර්‍ම පූර්‍ණය කොට සම්‍යක් සම්බෝධියට පැමිණෙත් ද මෙය උපනිඃශ්‍රය බලය නම් වේ.

4. සම්‍යක් සම්බෝධිය පිණිස එයට සුදුසු වූ යම් ප්‍රයෝග සම්පත්තියක් වේ ද, සකස් කොට කරන බවක් වේ ද, යමක් කරණ කොට ගෙන මහා පුරුෂයන් වහන්සේලා විශුද්ධ වූ

ක්‍රියාවන් ඇතිව නිරන්තරයෙන් ක්‍රියාත්මක වූ අභිනීහාරයෙන් යුක්තව ධර්‍ම පූර්‍ණය සම්‍යක් සම්බෝධියට පැමිණෙත් ද මෙය ප්‍රයෝග බලය නම් වේ.

මෙසේ ප්‍රත්‍ය සතරකින් ද හේතු සතරකින් ද බල සතරකින් ද යුක්ත වූ අෂ්ට ධර්‍ම සමෝධානයෙන් යුතුව සම්පාදනය කරන ලද මේ අභිනීහාරය පාරමිතා ධර්‍මයන්ට මූල කාරණා වශයෙන් ප්‍රත්‍යය වේ. විශේෂයෙන් පුරුදු කරගන්නා ලද යම් ධර්‍මයකගේ පැවැත්ම හේතු කොට ගෙන මහා පුරුෂයන් වහන්සේලාට ඓශ්වර්‍ය්‍ය අද්භූත ධර්‍මයෝ පිහිටත් ද එබඳු වූ ධර්‍මයෝ සතර දෙනෙක් වෙති. එනම් :-

1. සියලු සත්ත්වයෝ ම තම ඖරස පුත්‍රයන් මෙන් ප්‍රිය වූ සිතින් ආරක්‍ෂා කෙරෙත්.

2. මහා පුරුෂයන් වහන්සේලා ගේ සිත පුතුන් කෙරෙහි කෙලෙසීමකට නොපැමිණේ.

3. සත්ත්වයන්ට හිත සුව එළවීම එතුමන් වහන්සේලා ගේ අධ්‍යාශයත් උත්සාහයත් වේ.

4. තමා ගේ බුද්ධ කාරක ධර්‍ම මතුමත්තේ වැඩෙති. මුහුකිරීමට පැමිණෙති.

යම් හේතුවකින් මහා පුරුෂයන් වහන්සේලා ඉතා උසස් වූ පුණ්‍යස්කන්ධයකින් හා කුසලස්කන්ධයකින් යුක්තවීම තුළින් සැප විහරණයෙන් යුක්තවීම වූයේ වේ ද, සත්ත්වයන්ට දක්‍ෂිණාර්හ වූයේ වේ ද, උතුම් වූ ගෞරව දැක්විය යුතු ස්ථානයක් වූයේ වේ ද, අසමාන වූ පින් කෙතක් වූයේ වේ ද මේ සියල්ල ඓශ්වර්‍ය්‍ය ධර්‍මතා හේතුවෙන් ම වේ. මෙසේ නොයෙක් ගුණ ඇති නොයෙක් අනුසස් ඇති මහාභිනීහාරය හෙවත් මූල ප්‍රාර්‍ථනා ව සියලු පාරමිතා ධර්‍මයන්ට ප්‍රත්‍යය වේ.

අභිනීහාරය යම් සේ පාරමිතා ධර්‍මයන්ට ප්‍රත්‍යය වේ ද, එසේම මහා කරුණාවත් උපාය කෞශල්‍ය ඥාණයත් පාරමිතාවන්ට ප්‍රත්‍යය වේ. උපාය කෞශල්‍ය ඥාණය නම් බෝධි සම්භාර ධර්‍ම වූ දනාදිය පිළිබඳ ඇති ප්‍රඥාවයි. යම් කරුණකින් හා උපාය කෞශල්‍ය ඥාණයකින් යුක්ත වීමෙන් මහා පුරුෂයන් වහන්සේලා ගේ ආත්ම සුඛ නිරපේක්‍ෂක බව ද, නිරන්තරයෙන් අන්‍යයන්ට වැඩ කිරීමෙහි නිරත වන බව ද, ඉතා දුෂ්කර වූ මහ බෝසත් චයර්‍යාවන් හේතුවෙන් ද කලකිරීමකට නොපැමිණ ප්‍රසාදයම වැඩීම ද දැකීම ඇසීම සිහි කිරීමාදී සියලු තැන්හි සත්ත්වයන්ට හිතසුව එළවීමට කාරණා වෙති.

එතුමන් වහන්ලා ගේ ප්‍රඥාවෙන් බුද්ධත්වය සිද්ධ වෙති. කරුණාවෙන් බුද්ධ කාරක ධර්‍ම සිද්ධ වෙති. ප්‍රඥාවෙන් තමන් එතර වෙති. කරුණාවෙන් අනුන් එතර කරති. ප්‍රඥාවෙන් අනුන්ගේ දුක් දැනගනිති. කරුණාවෙන් අනුන්ගේ දුකට පිළියම් කරති. ප්‍රඥාවෙන් දුකෙහි කලකිරෙති. කරුණාවෙන් දුක් පිළිගනිති. ප්‍රඥාවෙන් නිර්වාණයට අභිමුඛ (ඉදිරිපත්) වෙති. කරුණාවෙන් සසරට බැස ගනිති. කරුණාවෙන් සංසාරයට අභිමුඛ (ඉදිරිපත්) වෙති. ප්‍රඥාවෙන් එහි නො ඇලෙති. ප්‍රඥාවෙන් සියලු තැන්හි නො ඇලෙති. ප්‍රඥාව හා කරුණාව අනුව ගිය හෙයින් සියලු සත්ත්වයන්ට අනුග්‍රහ කිරීම පිණිස පවතිත්. කරුණාවෙන් සියලු සත්ත්වයන්ට අනුකම්පා කරති. කරුණාව හා ප්‍රඥාව අනුව ගිය හෙයින් සියලු සත්ත්වයන් කෙරෙහි නො ඇලුණු සිත් ඇත්තාහු නොවෙති. ප්‍රඥාවෙන් "**මමය මගේය**" යන හැඟීම් නැති වෙති. කරුණාවෙන් අලස බව හා බැගෑපත් බව නැති වෙති. එසේම ප්‍රඥාවෙන් තමන්ට තමන් අධිපති බව ද, කරුණාවෙන් අන්‍ය සත්ත්වයන් දුකින් මිදවීමට අධිපති (ප්‍රධාන) වන බව ද, ප්‍රඥාවෙන් ධෛර්‍යවත් බව ද, කරුණාවෙන් පරහට වැඩ සිද්ධිය වන බව ද, ප්‍රඥාව හා කරුණාව යන දෙකෙන් නිර්භයභාවය හා අහිංසක බව ද, එසේම ධර්‍මාධිපති බව (ප්‍රත්‍යක්‍ෂ කරගන්නා වූ ධර්‍මය අධිපති කොට ඇති) හා ලෝකාධිපති බව ද (ලෝක සත්වයන්ට ප්‍රධාන), ප්‍රඥාවෙන් කළ ගුණ දන්නා බව ද, කරුණාවෙන් අන්‍යයන් තමන්ට උපකාර කිරීමට පෙර තමන් අන්‍යයන්ට උපකාර කරන බව ද, කරුණාව හා ප්‍රඥාව යන දෙකෙන් මෝහය හා තෘෂ්ණාව දුරු කිරීම ද, විද්‍යා හා චරණ ධර්‍ම සම්පූර්ණ වන බව ද, බල (දසබල) හා

වෛශාරද්‍ය (චතු විශාරද බව) නිෂ්පත්තිය (නිපදවන බව) ද යන සියලු පාරමිතාවන් හි ඵල ලැබීමට විශේෂයෙන් උපාය වන හෙයින් ප්‍රඥව හා කරුණාව යන දෙක පාරමී ධර්‍මයන්ට ප්‍රත්‍යය වෙති. පාරමිතාවන්ට මෙන්ම බුදු බව පිණිස වූ යම් මූල ප්‍රාර්‍ථනාවක් වේ ද එයට ද ප්‍රත්‍යය වේ.

තව ද **උත්සාහය, උම්මග්ග, අවත්ථාන, හිතචරියා** යන මේ ධර්‍මයන් ද පාරමිතාවන්ට ප්‍රත්‍යය වේ. ඒවා බුද්ධත්වයට උත්පත්ති ස්ථාන (පදනම) වන හෙයින් **බුද්ධ භූමි** යැයි කියනු ලැබේ. එහි :-

**උත්සාහ** :- යනු බෝධි සම්භාර ධර්‍ම වූ පාරමිතාවන් නගා සිටුවන වීය්‍ර්‍යයයි.

**උම්මග්ග**:- යනු බෝධි සම්භාර ධර්‍මයන් පිරීමට උපාය කෞශල්‍ය වූ ප්‍රඥවයි.

**අවත්ථාන** :- යනු අධිෂ්ඨානයයි. එය වනාහි වෙනස් නොවන අධිෂ්ඨානයයි.

**හිතචරියා** :- යනු මෛත්‍රී භාවනාව හා කරුණා භාවනාවයි.

තව ද මහා සත්ත්වයන් වහන්සේලාට දනාදී පාරමිතා ගුණ පූර්‍ණය පිණිස පවතින අධ්‍යාශ (අධිෂ්ඨාන) සයක් වෙති. එනම් **අලෝභධ්‍යාශය, අදෝෂධ්‍යාශය, අමෝහධ්‍යාශය, නෙක්ඛම්මධ්‍යාශය, පවිවේකධ්‍යාශය, නිස්සරණධ්‍යාශය** යන සයයි.

1. අලෝභ අදහස් ඇති බෝධිසත්ත්වයන් වහන්සේලා ලෝභයෙහි දෙස් දැකීම **අලෝභධ්‍යාශය** නම් වේ.

2. අද්වේෂ අදහස් (මෛත්‍රිය) ඇති බෝධිසත්ත්වයන් වහන්සේලා ද්වේෂයෙහි දෙස් දැකීම **අදෝෂධ්‍යාශය** නම් වේ.

3. අමෝහ අදහස් (ප්‍රඥව) ඇති බෝධිසත්ත්වයන් වහන්සේලා මෝහයෙහි දෙස් දැකීම **අමෝහධ්‍යාශය** නම් වේ.

4. ගිහි ගෙයින් නික්මීමේ අදහස ඇති බෝධිසත්ත්වයන් වහන්සේලා පඤ්චකාම වස්තූන් හි හා ගිහිගෙයි විසීමෙහි දෙස් දැකීම **නෙක්ඛම්මධ්‍යාශය** නම් වේ.

5. විවේකයෙහි (භාවනා වැඩීමෙහි) බලවත් කැමැත්ත ඇති බෝධිසත්ත්වයන් වහන්සේලා පිරිසට එක්වීමෙහි දෙස් දැකීම **පවිවේකධ්‍යාශය** නම් වේ.

6. ආත්ම ස්නේහයයෙන් වෙන්වීම පිළිබඳ ව නිස්සරණ අදහස් ඇති බෝධිසත්ත්වයන් වහන්සේලා (කාම, රූප, අරූප) සියලු භවයන්හි දෙස් දැකීම නිස්සරණධ්‍යාශය නම් වේ.

තව ද බුද්ධත්වය පිණිස පිළිපදින්නා වූ බෝධිසත්ත්වයන් වහන්සේලාට ඒ පාරමිතාවන් පිළිබඳ ව ඇත්තා වූ **දානාධ්‍යාශය, සීලාධ්‍යාශය, නෙක්ඛම්මධ්‍යාශය, යථාභූතඥාණාධ්‍යාශය, වීර්‍යාධ්‍යාශය, ඛන්ත්‍යධ්‍යාශය, සත්‍යාධ්‍යාශය, අධිට්ඨානාධ්‍යාශය, මෙත්තාධ්‍යාශය, උපේක්ෂාධ්‍යාශය** යැයි අධ්‍යාශ දසයක් වේ. එහි :-

1. දානයට ප්‍රතිපක්ෂ වූ (විරුද්ධ) මසුරු කමෙහි දෙස් දැක මනා කොට දානය පුරුදු කිරීම **දානාධ්‍යාශය** නම් වේ.

2. දුසිල්බවෙහි දෙස් දැක මනා කොට සිල් පිරීම **සීලාධ්‍යාශය** නම් වේ.

3. කාමයන් හි හා ගිහි වාසයෙහි දෙස් දැක මනා කොට පැවිද්දට යොමු වීම **නෙක්ඛම්මධ්‍යාශය** නම් වේ.

4. අස්ථානයෙහි (වැරදි මාර්ගයෙහි) හා විචිකිච්ඡාවෙහි (බුද්ධා දී අටතැන්හි සැකය) දෙස් දැක ඇති සැටියෙන් විනිවිද දැක අවබෝධ ඥානයෙන් පිළිපැදීම **යථාභූත ඥානාධ්‍යාශය** නම් වේ.

5. කුසීත භාවයෙහි දෙස් දැක වීයර්‍යාම්භයෙහි යෙදීම **වීයර්‍යාධ්‍යාශය** නම් වේ.

6. නො ඉවසීමෙහි දෙස් දැක ඉවසීමෙහි මනා කොට හික්මීම **ඛන්ත්‍යධ්‍යාශය** නම් වේ.

7. බොරු කීමෙහි දෙස් දැක සත්‍ය ප්‍රකාශ කිරීමෙහි මනා කොට පිහිටා ගැනීම **සත්‍යාධ්‍යාශය** නම් වේ.

8. දුබල බව හේතුවෙන් වරදට පත්වීමෙහි දෙස් දැක මනා කොට අධිෂ්ඨානයෙහි පිහිටීම **අධිට්ඨානාධ්‍යාශය** යි.

9. ව්‍යාපාදයෙහි දෙස් දැක මෛත්‍රියෙහි මනා කොට පිහිටා ගැනීම **මෙත්තාධ්‍යාශය** නම් වේ.

10. සැප දුක් ආදී පෙරළෙන ධර්මතාවයන්හි දෙස් දැක මනා කොට මධ්‍යස්ථ වීම **උපේක්ෂාධ්‍යාශය** නම් වේ.

මෙසේ පිහිටි අධ්‍යාශ ඇති බැවින් ලෝක ධර්මයන්හි ආදීනව දැක මහ බෝසතාණන් වහන්සේලා මනා කොට නෛෂ්ක්‍රම්‍යා දී පාරමිතා ධර්ම පූර්ණය කරති.

එසේම පරිත්‍යාග නොකිරීමෙහි ආදීනව හා පරිත්‍යාග කිරීමෙහි ආනිශංස නුවණින් සලකා බැලීම දනාදී පාරමිතා ධර්ම පූර්ණයට ප්‍රත්‍යය වෙති. මහ බෝසතාණන් වහන්සේලා එය මෙසේ ප්‍රත්‍යවේක්ෂා කරති.

කෙත් වතු රන් රුවන් ගව මහිෂ දැසි දස් අඹුදරු ආදී වස්තූන් හි සිත් ඇලුණු සත්ත්වයන්ගේ එම වස්තූන් බොහෝ දෙනාට සාධාරණ වන හෙයින් ප්‍රාර්ථනා කරන බැවින් රජ සොර සතුරු පීඩාවන්ට ආක්‍රමනයන්ට හේතු වන බැවින් ද, විවාදයට කරුණු වන බැවින් ද, සතුරන් ඇති කරන බැවින් කෙලෙසුන්ගේ ග්‍රහණයට හසුව

ඇලුණු එම වස්තූන් ප්‍රඥාගෝචර භාවයෙන් අසාර බැවින් ද, එම වස්තූන් ලැබ රැකීමට ගොස් අන්‍යයන් වෙහෙසන්නට වන බැවින්, විනාශයට හේතු වන බැවින්, ශොකාදී දුක් වලට උත්පත්ති ස්ථාන වන බැවින් ද, එම වස්තූන්ගේ ඇලීම හේතුවෙන් මසුරු මළ උපදනා හෙයින් ද, එයින් අපායෙහි උපදවන බැවින් ද බොහෝ අවැඩ එම වස්තූන් නිසා උපදනේය.

එම වස්තූන් අත්හැර පරිත්‍යාග කිරීමෙන් මේ සියලු ආදීනව දුක් පීඩා දුරු වන බැවින් එකම සුවපත් භාවයක් පිණිස වේ. එය අප්‍රමාදයට හේතු වේ.

තවද යාචකයෙක් පැමිණ වස්තූන් ඉල්ලන විට බොහෝ දෙනා නො දී සඟවන වස්තුව ඔහුට පරිත්‍යාග කිරීමෙන් මතු ලෞකික ලෝකෝත්තර සැප ලැබිය හැකි බැවින් ද, ඒ පරිත්‍යාග කළ වස්තුව රක්‍ෂා ස්ථානයක් විශ්වාසයෙන් තැබූවක් වන හෙයින් ද, කොයි යම් මොහොතක හෝ අත්හැර යා යුතු වූ එම වස්තු පරිත්‍යාගය එය පරලොවට ගෙන යවයි කියන්නකු වැනිව උපදෙස් දෙන්නෙකු වැනි හෙයින් ද, ගිනි ගෙන දිලිසෙන්නා වූ ගෙයක් මෙන් මරණ ගින්නෙන් දිලිසෙන ලෝකයෙහි ඒ වස්තුව පිළිස්සීමට නොදී ඉවත් කර ගෙන නොනැසෙන ලෙස නිධන්ගත කිරීමට ස්ථානයක් වැනි බැවින් ද, දාන සංඛ්‍යාත කුසල කර්‍මයන් හි සහය වන බැවින් ද, ලොව ඇති සියලු සම්පත්තීන්ට අග්‍ර වූ අතිශයින් දුර්ලභ වූ සම්‍යක් සම්බුද්ධත්වය ලැබීමට මහත් සේ උපකාර වන බැවින් ද ඒ යාචකයා පරම මිතුරෙකු ලෙස සලකති.

එසේම අපරිත්‍යාගයෙහි ආදීනව හා පරිත්‍යාගයෙහි ආනිශංස නුවණින් සලකා බැලීම දානාදී පාරමිතාවන්ට ප්‍රත්‍යය වේ. අභිනීහාර සම්පන්න මහබෝසතාණන් වහන්සේලා එය මෙසේ ප්‍රත්‍යවේක්‍ෂා කරති.

# ❄ පාරමිතා ධර්‍මයන්ගේ ප්‍රත්‍යවේක්‍ෂා ක්‍රම

## ☸ දන පාරමිතාව ප්‍රත්‍යවේක්‍ෂා ක්‍රමය

කෙත් වතු, රන් රුවන්, ගව, මහිෂ, දැසි දස්, අඹුදරු ආදී වූ වස්තූන් හි තෘෂ්ණාවෙන් ඇලුණු සිත් ඇතියවුන්ගේ එම වස්තූන් බොහෝ දෙනා ප්‍රාර්‍ථනා කරන බැවින් ද, රජ සොර සතුරු ගිනි ජල සුළං ආදී නොයෙක් උපද්‍රවයන්ට හසුවන බැවින් ද, වාද විවාද අඬදඹරයන් හට ගැනීමට කරුණු වන බැවින් ද, සතුරන් ඇති කරන බැවින් ද, මගේ කියා තම වසඟයෙහි නොපවතින හෙයින් අසාර බැවින් ද, වස්තු ලැබීම ඒවා රැකීම ඇති කල්හි අන්‍යයන්ගෙන් බොහෝ පීඩා විඳීමට කරුණු වන බැවින් ද, වස්තු විනාශයෙන් ශොකාදී දුක් වලට හේතු වන බැවින් ද, එම වස්තූන් හි ඇලීම මතු අපා දුක් සංසාර දුක් ගෙන දෙන බැවින් ද එම කාම වස්තූන්ගේ බොහෝ ආදීනව ඇති බව සිහිකට යුතු ය.

බොහෝ දෙනා ඇලුම් කරන ප්‍රාර්‍ථනා කරන එම කාම වස්තූන් පරිත්‍යාග කිරීම එම වස්තූන් නිසා සිදුවන සියලු උපද්‍රවයන්ගෙන් නිදහස් කරවන බැවින් එකම සුවයක් වන්නේ ය. එබැවින් අප්‍රමාදව දන් දිය යුතු ය.

තවද වස්තුව ඉල්ලන යාචකයා තමන් සතු සඟවා නිදන් කොට තැබිය යුතු වූ වස්තුව නිස්කාරණයේ සඟවා තබා විනාශ වන්නට නොදී මතු මත්තෙහි දීමෙහි විපාක ලබන්නට නැවත නැවත පරිත්‍යාගය පුරුදු කරන්නට නියමාකාර වූ සඟවා තැබීමක් ලෙස කියාපාන්නක් වැනි බැවින් ඒ වස්තූන් සඟවා තබන්නට පරම විශ්වාසවන්තයෙකු වන හෙයින් ද, මෙලොවින් පරලොවට ගෙන යා නොහැකි එම වස්තුව පරිත්‍යාගය තුලින් පරලොවට ගෙන යාමට උපදෙස් දෙන්නෙකු වන හෙයින් ද, ගිනි ගෙන දැවෙන්නා වූ ගෙයක් මෙන් මරණ බියෙන් දැවි දැවී ආරක්‍ෂා කරන්නා වූ වස්තුව ගින්නෙන් පිලිස්සී විනාශයට පත් නොවී එයින් පිටත් කර ආරක්‍ෂා කරගන්නට සහය වන මිත්‍රයෙකු වැනි හෙයින් ද, එසේ පිටතට ගත් වස්තුව

නොනැසෙන පරිද්දෙන් නිධන්ගත කර තැබීමට රක්‍ෂා ස්ථානයක් වැනි හෙයින් ද, තමන්ට දනය නම් වූ උසස් වූ පාරමී ගුණය මුහු කරවා ගැනීමට සහාය වන බැවින් ද, සියලු සම්පත්තීන්ට අග්‍ර වූ අතිශයින් දුර්ලභ වූ සම්‍යක් සම්බුද්ධත්වය නම් උතුම් සම්පත්තිය ලැබීමට මහත් උපකාරයක් වන බැවින් ද ඒ සඳහා උපකාර වන පරම කල්‍යාණ මිත්‍රයෙකු යැයි යාචකයා සැලකිය යුතු ය.

තවද යාචකයා විසින් උදර කටයුත්තක් වන පරිත්‍යාගයෙහි මා යොදවා මම දනපතියෙක් යන සම්භාවනාවෙන් ගෞරව කරන ලද්දේ වෙමි. එබැවින් මා විසින් එම ගෞරව සම්භාවනාව මැනවින් රැකිය යුතු ය. ඒකාන්තයෙන් නැසෙන සුළු වූ ජීවිතය නො ඉල්ලන්නේ නමුත් මා විසින් පරිත්‍යාග කොට අර්ථ යක් කර ගත යුතු ය. එසේ නම් ඉල්ලූ විට දීම ගැන කියනු ම කවරේ ද? උදර අදහස් ඇතියවුන් විසින් යාචකයන් සොයා දන් දිය යුතු ය. මාගේ පිනෙන් යාචකයා තෙමේ ම මා සමීපයට පැමිණියේ ය. එසේම යාචකයා මා සතු දේ ඔහුට පරිත්‍යාග කරන ලෙස මා දනය පිණිස යොදවයි ද, මේ යාචකයා මෙන් සලකා සියලු ලෝක සත්ත්වයෝ මාගේ අනුග්‍රහය ලැබිය යුත්තෝ යැයි ද, යාචකයන් නැති කල්හි කෙසේ නම් මාගේ දන පාරමිතාව පිරෙන්නේ යැයි ද, මා විසින් සියලු යාචකයන් කෙරෙහි දන වස්තු සොයා තැබිය යුතු යැයි ද, යාචකයන් වනාහි මගෙන් නො ඉල්ලා මා සතු දෑ පැහැර ගනිත් නම් මම යාචකයන්ට ප්‍රිය නොවෙති, ඔවුහු මට ප්‍රිය වීමට නම් මා විසින් ම මා සතු දෑ ඔවුනට දිය යුතු යැයි ද, වස්තුවත් යාචකයනුත් ඇති කල්හි දන් නොදීම මට මහත් නින්දවක් යැයි ද, එබැවින් කෙසේ නම් මාගේ වස්තුවත් ශරීරාවයවත් ජීවිතයත් යාචකයන්ට පරිත්‍යාග කෙරෙම්දැයි පරිත්‍යාගයට නම්‍යශීලී බව ඇති කර ගත යුතු ය.

තව ද මේ වස්තු සම්පත් වනාහි යමකු විසින් අපේක්‍ෂා රහිතව අතහැර දමන ලද්දක් මෙන් අපේක්‍ෂා රහිතව දයකයා විසින් ලාභ ප්‍රයෝජන අපේක්‍ෂාවක් නැතිව අත්හැරීමේ කුසල සිත ඉපදවිය යුතු ය.

වස්තුව ඉල්ලන තැනැත්තා ප්‍රිය කෙනෙකු නම් සතුටු සිත ඉපදවිය යුතු ය. අප්‍රිය පුද්ගලයෙකු ඉල්ලන්නේ නම් මොහුට මෙය දීමෙන් ප්‍රියයකු වන්නේ යැයි ද, මිත්‍රයකු වන්නේ යැයි ද සතුට ඇති කර ගත යුතු ය. දෙන්නා වූ තැනැත්තා යාචකයාට ප්‍රිය වන්නේ යැයි සොම්නස් විය යුතු ය. වෛරී පුද්ගලයෙකු ඉල්ලන්නේ නම් මොහු ඉල්ලන දෙය දීම හේතුවෙන් මිත්‍රයකු වන්නේ යැයි සොම්නස් ඉපදවිය යුතු ය. මෙලෙස ප්‍රිය, අප්‍රිය, වෛරී, මධ්‍යස්ථ සෑම කෙනෙකු කෙරෙහි ම මෛත්‍රී පූර්වාංගම කරුණාව ඉදිරිපත් කරගෙනම දිය යුතු ය.

යම් හෙයකින් බොහෝ කලක් පුරුදු කරන ලද පරිත්‍යාග කරන ලද දිය යුතු වූ වස්තූන් කෙරෙහි ලෝභය උපදී නම් බෝධිසත්ව ප්‍රතිඥාව ඇත්තා වූ උත්තමයන් විසින් ඒ පිළිබඳ ව මෙසේ පිළිපැදිය යුතු ය.

**"සත්පුරුෂය! සම්‍යක් සම්බුද්ධත්වය ප්‍රාර්ථනා කරන්නා වූ නුඹ විසින් සියලු සත්ත්වයන්ට උපකාර පිණිස මේ ශරීරය හා ජීවිතය අත්හරින ලද්දේ නොවේ ද? එසේ කළ නුඹ වනාහි දූන් බාහිර වස්තූන්ට ඇලුම් කිරීම නුසුදුසු ය. එය ඇතුන්ගේ නෑමක් හා සමාන බැවින් ද, එළ දෙන දන් දී කඹයට ඇලුම් කිරීමක් හා සමාන බැවින් ද නො හෝබනේ ය"**

එසේ හෙයින් බාහිර වස්තුවෙහි ද ඇලුම් කිරීම නොවටනේය. යමෙක් මහත් බෙහෙත් ගසක් දැක එහි මුල්, පොතු, දෙබල, අරටුව, අතු, කොළ, මල්, ගෙඩි ආදියෙන් යමක් ප්‍රයෝජන ඇත්තේ ද ඒවා ගෙන යති. එහෙත් මා සතු දේ මොවුහු ගෙන යති යැයි, ගස විරෝධයක් නොදක්වයි. එසේම මුළු ලොවට හිත වැඩ පිණිස වීයඞ්ය වඩන්නා වූ මා විසින් දුකට උල්පතක් වූ කිසි කෙළඹි ගුණයක් නැත්තා වූ හැම කල්හි අපවිත්‍ර වූ මේ ශරීරය අනුන්ට උපකාර පිණිස පමුණුවන කල්හි ස්වල්ප මාත්‍ර වූ ද මිථ්‍යා සිතක්, වැරදි හැඟීමක් ඇති කර නොගත යුතු ය. ඒකාන්තයෙන් බිඳෙන්නා වූ විසිර යන්නා වූ නැසෙන්නා වූ ස්භාවයෙන් යුත් ආධ්‍යාත්මික වූ ද බාහිර වූ ද පඨවි

ආදී භූත රූපයන් කෙරෙහි කුමන විශේෂයක් ද? **"මෙය මම වෙමි, මෙය මගේය, මෙය මගේ ආත්මය"** යැයි කියා යම් ඇල්මක් වෙත් ද, එය වනාහි මෝහයෙහි පෙළඹවීමක් මිස අන් කුමක් ද? එබැවින් බාහිර වස්තූන් කෙරෙහි මෙන්ම ආධ්‍යාත්මික වූ ඇස් කන් අත් පා ආදියෙහි ද මාංශ ආදියෙහි ද නිරපේක්ෂව ඒවායින් ප්‍රයෝජන ඇත්තෝ කැමති දෙයක් ගෙන යෙත්වා යි අත් හරින ලද සිත් ඇත්තෙකු විය යුතු ය.

මෙසේ සලකා බලන්නා වූ මහා බෝධිසත්ත්වයන් වහන්සේලාගේ සම්මා සම්බෝධිය පිණිස කාය ජීවිත නිරපේක්ෂකව මෙහෙයවනු ලබන ප්‍රයෝගය පහසුවෙන් සඵල වෙති. එබදු උත්තම පුරුෂයන් වහන්සේලා පිරිසිදු වූ කාය වාක් මනෝ කර්ම ඇතිව පිරිසිදු ආජීවය ඇතිව ප්‍රඥා සම්පන්න ප්‍රතිපත්තියෙහි පිහිටා **අපාය කෞෂල්‍ය**[1] **උපාය කෞෂල්‍ය**[2] ඥානයන්ගෙන් යුක්තව දිය යුතු වස්තූන් මනාව අතහැර දීම තුළින් **ආමිස දානය අභය දානය ධර්මදානය** කිරීමෙන් සත්ත්වයන්ට මනාව අනුග්‍රහ කිරීමට සමත් වෙති.

## ☸ සීල පාරමිතාවෙහි ප්‍රත්‍යවේක්ෂා ක්‍රමය

සීල පාරමිතාව මෙසේ ප්‍රත්‍යවේක්ෂා කල යුතු ය. මේ සීලය වනාහි ගංගා යමුනා ආදී මහා ගංගාවන්හි ජලයෙන් පිරිසිදු කිරීමට නොහැකි වූ ද්වෙෂ මළ සෝදන ජලය වැනි වේ. රත් හඳුන් ආදියෙන් දුරු කොට නොහැකි වූ රාගාදී කෙලෙස් දැවිලි දුරු කරන්නා වූ ඖෂධයකි. මුතුහර, ඔටුනු, කොඬොල් ආදී වූ බොහෝ ජනයන් සැරසෙන ආභරණයන්ට වඩා විශේෂ වූ සත්පුරුෂයන්ගේ ආභරණයකි. සියලු දිසාවන් හි හමා යන්නා වූ සියලු කාලයන්ට සුදුසු වන්නා වූ සුවඳකි. ක්ෂත්‍රිය මහාසාරාදි කුලවතුන් විසින් ද සදෙව් ලොව දෙවියන් විසින් ද වැඳුම් පිදුම් කට යුතු වූ ඔවුන් තමා වෙත ගෙන්වා ගැනීමට සමත් උතුම් වූ දිව්‍ය මන්ත්‍රයකි. පහසුවෙන් දෙව්

---

[1] මේ මේ දේ සිහි කිරීමෙන් නූපන් අකුසල් වැඩෙති. උපන් අකුසල් බහුල වෙති යැයි සිහි කිරීම

[2] අපාය දුකින් ද සංසාර දුකින් ද නිදහස් වීමේ උපාය මාර්ගය සිහි කිරීමයි

ලොව යා හැකි ඉණිමගකි. ධ්‍යාන අභිඥා ගුණ පහසුවෙන් ලැබීමෙ උතුම් මාර්‍ගයකි. නිර්‍වාණය නම් වූ උතුම් පුරයට පමුණුවන ප්‍රධාන මාර්‍ගයකි. ශ්‍රාවක බෝධිය, පසේ බුදු බව, සම්මා සම්බුදු බව පිහිටන භූමියකි. කැමති වන ප්‍රාර්‍ථනා කරන යමක් වේද ඒ සියල්ල ලැබීමේ උපාය වන්නා වූ සිතුමිණි රුවන් කල්ප වෘක්‍ෂ යනාදිය ඉක්මවා සිටි උතුම් රත්නයකි. භාග්‍යවතුන් වහන්සේ විසින් ද මෙය මෙසේ වදරණ ලද්දේමය. **"ඉජ්ඣිස්සති භික්ඛවේ සීලවතෝ චේතෝ පණිධි විසුද්ධත්තා"** (මහණෙනි, පිරිසිදු සිල් ඇත්තහුගේ චිත්ත ප්‍රාර්‍ථනාව සමෘද්ධ වේ.) තවද අන් කරුණක් ද මෙසේ වදරණ ලද්දේමය. **"ආකංඛෙය්‍යං චෙ භික්ඛවෙ භික්ඛු සබ්‍රහමචාරීනං පියොචස්සං මනාපො ගරු භාවනීයො චාති සීලෙසෙවවස්ස පරිපූරකාරී"** (මහණෙනි, මේ ශාසනයෙහි සසර දුකින් අත මිදී නිවන්සුව ලැබීමට පැවිදි වූ භික්‍ෂුව සබ්‍රහ්මචාරීන් වහන්සේලාට ප්‍රිය වෙමි, ගරු වෙමි, සම්භාවනීය වෙමි යැයි කැමති වන්නේ නම් එම භික්‍ෂුව විසින් සීලයම පරිපූර්‍ණ කළ යුතු ය.) තව ද මෙසේ වදරන ලද්දේමය. **"අවිප්පටිසාරත්තානි ඛො ආනන්ද කුසලානි සීලානි"** (ආනන්දය, නිරවද්‍ය වූ පිරිසිදු සීලයෝ සිත විපිළිසර නොවීම ප්‍රයෝජන කොට පවතී) යනා දී සීල සම්පත්තියෙහි ආනිශංස සැලකිය යුත්තාහ. එසේම අග්ගික්ඛන්ධොපම සූත්‍රාදීන් ගේ කියවෙන කරුණු අනුව සීල විපත්තියෙහි ආදීනව සැලකිය යුත්තේ ය.

තව ද අත්තානුවාද භය, පරානුවාද භය, දණ්ඩ භය, අපා භයාදියෙහි පීඩාවට පත් නොවන බැවින් ද, නිකැළැල් සීලය හේතු කොට ගෙන ප්‍රීතිය සතුට සන්සිඳීම ඇති කර ගැනීමට මූල කාරණය වන බැවින් ද, සිතෙහි විපිළිසරය දුරුකර දෙන බැවින් ද, සියලු සැපතට ප්‍රධාන හේතුව වන බැවින් ද, ජාතිය, ධනය, අධිපතිකම, උසස් ඥාති මිත්‍රාදී සියලු සම්පත්තීන්ට වඩා උසස් වූ සම්පත්තිය වන බැවින් ද සීලය මහත් ආනිශංස ඇත්තේ යැයි සිහිකට යුතු ය.

සීලවන්තයාට තමාගේ සීල සම්පත්තිය හේතුවෙන් **"මා විසින් බොහෝ කුසල් කරන ලද්දේ ය. යහපත් දෙයක් කරන ලද්දේ ය. භය දුරුකර ගැනීමට පිහිටක් කරගන්නා ලද්දේ ය."** යැයි මහත් ප්‍රීතියක්

සොම්නසක් ඇති වේ. සීලවන්තයාට තමන්ගේ සිත දෙස් නොකියයි. නුවණැත්තා වූ අන්‍යයන් ද දෙස් නොකියති. දඬුවම් විඳීමේ ද මතු අපායෙහි ඉපදීමෙහි ද බියක් නැත්තේ වේ. නුවණැත්තන්ගේ ප්‍රශංසාව සීලවන්තයාට හිමි වේ. පහත් කුලයක උපන්නේ නමුත් සීලවන්තයාට ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණාදීන්ගේ ගෞරව පූජා ලැබෙන්නේ ය. සීල සම්පත්තිය කුල සම්පත් ධන සම්පත් මැඩ පවත්නේ ය. සොර සතුරන්ට පැහැර ගැනීමට නො හැක්කා වූ මිය පරලොව යන්නා වූ තැනැත්තා අනුව යන්නා වූ, සමථ විපස්සනා යෝගයන්ට පිහිටාධාර වන්නා වූ සීලය බාහිර ධන සම්පත් ඉක්මවා ආධ්‍යාත්මික වූ උසස් සැප ලබා දෙන්නේ ය.

**"දුස්සීල ව සියක් වසරක් ජීවත් වීමට වඩා සීලවන්තයෙකු ගේ එක් දවසක් ජීවත් වීම උතුම් වන්නේ ය"** යැයි වදාළ හෙයින් ද, **"ජීවිතය පවත්නා කාලය තුළ සීල සම්පත්තියෙහි පිහිටා සිට සීල භේදයක් නො කොට වන්නා වූ මරණය උතුම් වන්නේ ය"** යැයි වදාළ හෙයින් ද සීලය ජීවිතයට වඩා විශිෂ්ට වන්නේ ය. වෛරී වූවන්ට එම සීලවන්තයා ප්‍රිය පුද්ගලයෙකු වන හෙයින් ද, ජරා රෝග ව්‍යසන ආදියෙන් සීලවන්තයා නො මැඩිය හැකි හෙයින් ද, සීල සම්පත්තිය රූප සම්පත්තිය ඉක්මවා බබළන්නේ ය. සීලය මහල් ප්‍රාසාද සඳළු සහිත ගෘහයන් ආදී සම්පත්තීන් ද, රජ යුවරජ සේනාපති ආදී තනතුරු ද, ගෞරව නාමයන් ද ඉක්මවා මහත් සැප සිද්ධ කර දෙන්නේ ය. සීලය සියලු සැප සම්පත්තීන්ට පිහිටවන බැවින් ද ඒකාන්තයෙන් යහපතක් ම සිද්ධ කර දෙන බැවින් ද පරලොව යන්නවුන් අනුව යන බැවින් ද ස්නේහ ඇතිව සමීපචාරීව උපකාර කරන්නා වූ ඥාති මිත්‍රාදීන් ඉක්මවා උපකාර සලසන්නා වූ පරම ඥාතියෙකු මිත්‍රයෙකු වැනිය. මව්පිය ගුරුවරාදීන් විසින් පවා කළ නොහැකි මහත් උපකාර සීලය සිද්ධ කර දෙන්නේ ය. ඇත් අස් රිය පාබලාදී බල සේනාවන් විසින් ද ඖෂධ මන්ත්‍රා දී ශාන්ති කර්මාදියෙන් ද ආරක්‍ෂා කරලීමට දුෂ්කර වූ තම ජීවිතය හා සම්පත් සුරක්‍ෂිත කර දෙන්නා වූ බැවින් ද තමාට ද යටත් නොවන විශේෂ ශක්තියක් බැවින් සීලය ඉතා විශිෂ්ට වන්නේ ය. එබැවින් **"ධම්මො හවෙ රක්ඛති ධම්මචාරී"** ධර්මය රකින්නා තමා විසින් රක්නා ධර්මය තුළින් ම ආරක්‍ෂා වන්නේ ය යැයි වදාළ සේක.

මෙසේ සීලය නොයෙක් ගුණ ඇත්තේ යැයි ප්‍රත්‍යවේක්‍ෂා කරන්නා හට අසම්පූර්ණ වූ සීල සම්පත්තිය සම්පූර්ණ කළ හැකි වන්නේ ය. අපිරිසිදු වූ සීලය පිරිසිදු කරගතහැකි වන්නේ ය. මෙසේ පූර්ණය කරන ලද පුරුදු කරන ලද සීලයට ප්‍රතිපක්‍ෂ වූ (විරුද්ධ) ද්වේෂා දී පාප ධර්ම අතරතුර නැවත උපදින්නේ නම් එවිට මහා බෝධිසත්ව ප්‍රතිඥා ඇත්තහු විසින් මෙසේ සැලකිය යුතුය.

"සත්පුරුෂය, නුඹ විසින් සම්මා සම්බුද්ධත්වය ලැබීම පිණිස ප්‍රතිඥා කරන ලද්දේ නොවෙත් ද, සීලයෙන් වෙන් වූවෙකුට ලෞකික සම්පත්තීන් පවා ලැබිය නොහැකිය. එසේ ඇති කල්හි ලෝකෝත්තර සම්පත් ගැන කියනු ම කවරේ ද? සියලු සම්පත්තීන්ට අග්‍ර වූ සම්‍යක් සම්බෝධියට පිහිට ආධාර වූ සීල සම්පත්තියෙන් අතිශයින් උත්කෘෂ්ට භාවයට පැමිණිය යුතු නොවේ ද, එබැවින් "**කිකීව අණ්ඩං**"[1] යනා දී වදාළ ලෙස සිල් රක්නා වූ නුඹ විශේෂයෙන් තමන්ට ද අන්‍යයන්ට ද ප්‍රිය විය යුතු ය. එසේම නුඹ විසින් ධර්මදේශනා කිරීමෙන් සත්ත්වයන් ත්‍රිවිධ යානයෙහි[2] ඇතුළත් කිරීම හා සීල සමාධි ප්‍රඥාවන් මෝරා යාම කළ යුතු ය. අපත්‍යාහාර සේවනය කරන්නාට ලැබෙන වෙදෙකු ගේ පිළියමක් මෙන් දුශ්ශීල පුද්ගලයා ගේ වචනය විශ්වාස නො කොට යුත්තේ ය. එබැවින් කෙසේ නම් මම ඇදහිය යුත්තෙකු වී සත්ත්වයන් ත්‍රිවිධ බෝධියෙහි පිහිටුවීමට සීල සමාධි ප්‍රඥාවන්ගෙන් මෝරා යාම කරන්නෙම් ද, එබැවින් ස්වභාවයෙන් ම සිල් ඇත්තෙකු විය යුතු ය. තව ද ධ්‍යානා දී ගුණ විශේෂයන් හා එක්ව සත්ත්වයන්ට උපකාර කරන්නට තමා ගේ සමත් බව ද ප්‍රඥා දී පාරමී ගුණ පිරීම ද ධ්‍යානා දී ගුණ වැඩීම ද සීල පාරිශුද්ධියෙන් තොරව සිද්ධ නොවෙත්ම ය. එබැවින් මනා කොට සීලය පිරිය යුතු ය". මේ වනාහි සීලය ප්‍රත්‍යවේක්‍ෂා කරන ක්‍රමයයි.

---

[1] බිජුවට රක්නා කිරලදෙනක් මෙන් ද, වලිගය රක්නා සෙමර මුවා මෙන් ද, එකම පුත්‍රයා ආරක්‍ෂා කරන මවක් මෙන් ද, එක් ඇසක් ඇතියෙකු ඒ එකම ඇස රකින්නාක් මෙන් ද සැම කල්හි ගෞරව ඇතිව ජීවිත පරිත්‍යාගයෙන් සිල් රැකිය යුතුය.

[2] බුදු පසේ බුදු මහරහත් බෝධිත්‍රය

## ☸ නෛෂ්ක්‍රම්‍ය පාරමිතාවේ ප්‍රත්‍යවේක්‍ෂා ක්‍රමය

**"සමබාධො සරාවාසො රජොපථො"** (ගිහිගෙයි විසීම නම් ගැහැට සහිතය. කෙලෙස් දූවිලි උපදවන තැනකි.) යනා දී වශයෙන් ගිහිගෙයි විසීමෙහි ආදීනව ද, **"අට්ඨිකඞ්කලූපමා කාමා"** (මේ කාම වස්තූහු නම් මස් නැති ඇට කැබැල්ලක් බඳු උපමා ඇත්තේ ය) යනා දී ලෙස කාම වස්තූන් හි ආදීනවයන් ද, **"මාතාපි පුත්තෙන විවදති"** (වැදූ මව ද තම පුතු සමග වාද ඇතිකරගනී) යනා දී ලෙස වස්තු කාමයන් මුල්කොට අර්බුද උපදින බව සලකා එහි ආදීනව ද, **"සෙය්‍යථාපි පුරිසො ඉණං ආදාය කම්මන්තෙ පයොජෙය්‍ය"** (යම් සේ පුරුෂයෙකු පොලියට ණය ගෙන කර්මාන්තයන් හි යොදවන්නේ ද ඔහුගේ එම කර්මාන්ත සමෘද්ධ වන්නේ නම් එයින් පරන ණය ගෙවා ඉතිරි වූ යම් මුදලක් වේ නම් එයින් තම අඹු දරුවන් පෝෂණය කරන්නේය. පසුව ණය නැති බව නිසා සතුටු වන්නේ ය) යනාදිය සලකා වස්තු කාමයන් ණයට ගත් දෙයක් මෙන් සලකා ක්ලේශ කාමයන් හි ආදීනව සැලකිය යුතු ය.

එමෙන්ම **"අබ්භොකාසො පබ්බජ්ජා"** (පැවිද්ද වනාහි අභ්‍යවකාශය මෙන් තමාගේ කියා රැකීමට කිසිවක් නැති හෙයින් නිදහස් තැනකි.) යනා දී වශයෙන් පැවිද්දෙහි ආනිශංස සලකා නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව ප්‍රත්‍යවේක්‍ෂා කළ යුතු ය.

## ☸ ප්‍රඥා පාරමිතාවෙහි ප්‍රත්‍යවේක්‍ෂා ක්‍රමය

ප්‍රඥාවෙන් තොරව දනා දී කුසල ධර්මයෝ සම්පූර්ණ නොවෙති. තම කර්මාන්තයන් ප්‍රඥාවෙන් තොරව නිසි ලෙස කිරීමට සමර්ථ නොවෙති යැයි ප්‍රඥාවෙහි ගුණ සිහි කළ යුතු ය. එසේම ජීවත් වීමකින් තොර වූ ශරීර යන්ත්‍රය නොහෝබි ද, යෑම් ඊම් ආදී ක්‍රියා කිරීමට අසමත් වේ ද, විඥ්ඥාණයෙන් තොරව චක්ෂුරාදී ඉඳුරන්ගෙන් රූප දර්ශනාදී ක්‍රියාවන් කිරීමට අසමර්ථ වේ ද, එසේම ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් ප්‍රඥාවෙන් තොරව තම තමාගේ කෘත්‍යයන් නිසිලෙස

කිරීමට අසමර්‍ථ වෙති. ප්‍රඥාව පරිත්‍යාගා දී සියලු කුසලධර්‍ම ප්‍රතිපත්තීන් හි ප්‍රධාන වෙති.

දල්වන ලද ප්‍රඥා ඇස ඇති මහා බෝධිසත්ත්වයන් වහන්සේලා තම ශරීරාවයව පවා දන් දී නමුත් තමා උසස් කොට නොසලකති. අනුන් පහත් කොට නොසලකති. අන්‍යයන්ට නින්දා දිය නොකරති. සියල්ලන්ට ම ප්‍රයෝජනවත් වන බෙහෙත් ගසක් මෙන් අතීත අනාගත වර්‍තමාන යන කාලත්‍රය පිළිබඳවම සතුටු සිත් ඇතිව තම පැවතුම් සිහි කරති. ප්‍රඥාව ඇති විට ම උපාය කෞශල්‍ය ඥාණයෙන් යුක්තව දනා දී කුසල ක්‍රියාවන්හි යෙදී අන්‍යයන්ගේ යහපත සිදු කොට ඒවා පාරමී බවට පත් කර ගනිති.

තව ද ප්‍රඥාව නොමැති විට තෘෂ්ණා දී සංක්ලේශ ධර්‍මයන් නො නැසිය හැකි බැවින් සීල විශුද්ධියක් නොවන්නේ ය. එසේ ඇති කල්හි සර්‍වඥතාඥානය නම් වූ උසස් සම්පත්තිය ලැබීම පිණිස අධිෂ්ඨානයක් කෙසේ නම් පිහිටත් ද? නොවෙත්ම ය. එබැවින් නුවණ ඇත්තාට ම ගිහි ගෙයි විසීමෙහි ද පඤ්චකාම ගුණයන්හී ද සංසාරයෙහි ද ආදීනව හා පැවිද්දෙහි ද ධ්‍යාන සම්පත්තියෙහි ද නිර්‍වාණ ධාතුවෙහි ද ආනිශංස සලකා පැවිදි බව ලැබ ධ්‍යාන වඩා නිවන් මඟ තමනුත් අනුගමනය කරමින් අන්‍යයන් ද එහි යෙදවීමට හැකි වෙයි.

තව ද ප්‍රඥාවෙන් තොර වූ වීර්‍යය වැරදි සහිතව ආරම්භ වූවක් වන බැවින් ප්‍රාර්‍ථනීය අර්‍ථ ය සිද්ධ නොවන්නේ ය. එබැවින් ප්‍රඥාවෙන් තොරව කරන ක්‍රියාවන් ආරම්භ නොකිරීම ම උතුම් වේ. ප්‍රඥාව සහිත වූ වීර්‍යයෙන් කරන කාර්‍යයන්ගෙන් සඵල නොවන්නා වූ කිසිවක් නැත්තේ ම ය. මක් නිසා ද යත්? උපාය කෞශල්‍ය ඥානයෙන් කරන ක්‍රියාවන් හේතු සහිතව මනාව දැක කරන බැවිනි. තව ද නුවණ ඇත්තෙකු ම අන්‍යයන් කරන දුක් පීඩා අපහාස ඉවසන්නට සමතෙක් වේ. නුවණ නැතියහුට එසේ කළ හැකි නොවේ. ඔවුහු තමන්ට කරන අවැඩ මුල්කොට ක්‍රෝධාදියෙන් ඇලලී යති. නුවණැත්තාට ම අන්‍යයන් කරන අවැඩ ඉවසීමෙන් ප්‍රිය මනාප සිතින් පිළිගැනීම

හේතුවෙන් ගුණ දහම් ස්ථිර වීම පිණිස පවතී. නුවණැත්තා අනිත්‍යා දී ත්‍රිවිධ ලක්‍ෂණයන් ද ඒවා ඉපදීමට හේතූන් ද, ඒවාට විරුද්ධ ධර්‍මයන් ද තත් වූ පරිද්දෙන් දන සත්‍යයෙහි පිහිටීමෙන් අන්‍යයන්ට බොරු කාරයෙකු නොවන්නේ ය. මෙසේ ප්‍රඥාවෙහි බලයෙන් තමාට නිසි උපකාරය සිද්ධ කොට ගෙන ධෛර්‍යය සම්පන්න වී සියලු පාරමිතා ධර්‍මයන්හි ස්ථිර අදහස් ඇතිව සමාදන් ව පිහිටා ජය ගන්නේ ය. නුවණ ඇතියහු ම "**මොහු මට ප්‍රියය, මොහු මධ්‍යස්ථය, මොහු වෛරීය**" යැයි විභාගයක් නො කොට සියල්ලන් කෙරෙහි එක් සිත් ඇතිව පවතින්නේ ය. එසේම ලාභ අලාභාදී ලෝක ධර්‍මයන් පැමිණි කල්හි වෙනසකට නොපැමිණ නුවණින් සිතා මධ්‍යස්ථ වන්නේ ය. මෙසේ සියලු පාරමිතා ධර්‍ම පූර්‍ණය සඳහා ප්‍රඥාවම මූල කාරණය වන බව සැලකිය යුතු ය.

තව ද ප්‍රඥාව නැති විට නිවැරදි දර්‍ශනයක් නැත. හේතුඵල සංඛ්‍යාත දෘෂ්ටි සම්පත්තියක් නැත. සීල සම්පදාවක් නැත. ප්‍රඥාවෙන් තොර වූවහුට ආත්මාර්‍ථයක් කළ නොහැක. එසේ ඇති කල්හි කෙසේ නම් පරහිතකාමී ප්‍රතිපත්තියක් කරන්නේ ද? එබැවින් පරහිත ප්‍රතිපත්තියෙහි යෙදෙන්නා වූ නුඹ විසින් සකස් කොට ප්‍රඥාව දියුණු කිරීමෙහි යෙදිය යුතු නොවේ ද? යැයි බෝධිසත්ත්වයන් වහන්සේලා විසින් තමහට අවවාද කළ යුතු ය.

මහා සත්ත්වයන් වහන්සේලා විසින් වනාහි ප්‍රඥාවෙහි අනුභාවයෙන් සතර සංග්‍රහ වස්තූන් පිළිබඳ ව අධිෂ්ඨාන සතරක පිහිටා ලොවට අනුග්‍රහ කොට සත්ත්වයන් නෛර්‍යාණික මාර්‍ගයෙහි යොදවති. එසේම ශ්‍රද්ධා දී ඉන්ද්‍රියයන් ද අභිවෘද්ධියට පමුණුවති. එසේම ප්‍රඥා බලයෙන් නාමරූප, ස්කන්ධ, ධාතු, ආයතනාදී පරමාර්‍ථයන් පිළිබඳ ව විනිවිද දක්නා නුවණ බහුල කොට ඇතිව සංස්කාරයන් හි පැවැත්ම හා නැවැත්ම තත් වූ පරිද්දෙන් දන දනා දී ගුණ විශේෂයන් නිර්‍වාණ සම්පත්තිය ප්‍රතිවේධ කිරීමේ ශීර්‍ෂයෙන් පුහුණු කරමින් සම්මා සම්බෝධිය පිණිස වූ බෝධිසත්ත්ව ශික්‍ෂණය පුරුදු කළ යුතු යැයි සලකා ප්‍රඥා පාරමිතාව සම්පූර්‍ණ කළ යුතු ය.

## ☸ වීර්‍යය පාරමිතාවෙහි ප්‍රත්‍යවේක්‍ෂා ක්‍රමය

හීන වීර්‍යය ඇති තැනැත්තාට පෙනෙන්නා වූ ලෞකික කටයුතු ද කොට නිමවාගත නොහැකි වේ. දුක් නොතකා පටන් ගත් වීර්‍යය ඇතියහුට නො කළ හැකි දෙයක් නැත. නොලැබිය හැකි සම්පත්තියක් නැත. හීන වීර්‍යය ඇති තැනැත්තාට **"සසර නැමති මහ සයුරෙන් සියලු සත්ත්වයන් එතර කරන්නෙමි"** යැයි එබන්දක් පටන් ගැනීම පවා නොහැකි වන්නේ ය. මධ්‍යම වීර්‍යය ඇති තැනැත්තාට වනාහි පටන් ගත් ඒ ව්‍යායාමය අතරතුර නතර වන්නේ ය. උසස් වීර්‍යය ඇති තැනැත්තා වනාහි ආත්මාර්ථ සැප පිළිබඳ අපේක්‍ෂාවකුදු නො කොට ආරම්භ කොට කෙළවරට පැමිණෙන්නේ යැයි වීර්‍යය සම්පත්තියෙහි ආනිශංස සිහිකට යුතු ය.

තව ද සංසාරය නැමැති මඬින් එතර වන්නට යමෙකු ගේ යම් ආරම්භයක් වන්නේ ද, ඔහුගේ වීර්‍යය ලිහිල් වුවහොත් ප්‍රාර්ථනීය අර්ථ ය සිදු නොවන්නේ ය. එසේ ඇති කල්හි දෙවියන් සහිත ලෝක සත්ත්වයන් සසර නැමැති මඬ ගොහෝරින් එතර කරවන්නට යැයි කළ ප්‍රාර්ථනා ඇත්තහුට කෙසේ නම් එය කළ හැකි වේ ද? සිතෙහි හටගන්නා වූ රාගාදී කෙලෙස් දෝෂයන් වනාහි මත් වූ ඇතුන් මෙන් නොවැළැක්විය හැක්කාහ. ඒ රාගාදිය සිතෙහි ක්‍රියාත්මක වීමෙන් හටගන්නා වූ කර්මයෝ ඔසවාගත් කඩු ඇති වධකයන් විසින් කළ වරදට දඬුවම් පමුණුවන්නාක් මෙන් සැම කල්හි දුගතියෙහි වැටීමට ඉඩ සලස්වන බැවින් නොවසන ලද අපාය දෙර ඇතියහ. ඒ අකුසල ධර්මයන්හි යොදවන්නා වූ පාප මිත්‍රයන් සැම කල්හි සමීපයෙහි සැරිසරන්නා. අඥාන පෘතග්ජන භාවය ඇති කල්හි ඒ පාප මිත්‍රයන් කී අවවාදයන්හි පිහිටා සංසාර දුකට වැටීමට සිදු වන්නේ ය. එබැවින් තමා ම තම උත්සාහයෙන් සසර දුකින් අත මිදීමට සුදුසු වන්නේ ය. මිථ්‍යා විතර්ක දී සියලු පාප ධර්ම වීර්‍යයේ අනුභාවයෙන් දුරුකටහැකි වන්නේ ය. ලැබීමට දුෂ්කර වූ සම්මා සම්බුද්ධත්වය ආත්මාධීන

වීර්‍යයෙන්[1] කළ හැක්කේ නම් එම වීර්‍යයෙන් තවත් කිරීමට අපහසු යමක් ඇත්තේ දැයි වීර්‍යයෙහි ගුණ ප්‍රත්‍යවේක්‍ෂා කළ යුතු ය.

## ☸ ක්‍ෂාන්ති පාරමිතාවෙහි ප්‍රත්‍යවේක්‍ෂා ක්‍රමය

ක්‍ෂාන්තිය වනාහි සිතෙහි වැඩිදියුණු කරගනු ලබන්නා වූ උත්තම ගුණයන්ට ප්‍රතිපක්‍ෂ (විරුද්ධ) ක්‍රෝධය දුරු කොට මානුෂීය ගුණ සම්පාදනය කරන්නා වූ සැබෑ සත්පුරුෂයන්ට පිහිටවන තියුණු ආයුධයකි. අන්‍යයන් මැඩ පැවැත්වීමට සමත් වන අලංකාරමත් වූ ආභරණයකි. කෙලෙස් තවන දුරු කරන ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට මහත් බල සම්පත්තියකි. ක්‍රෝධ නැමැති ගිනි නිවන්නා වූ සිසිල් දියකි. මහත් වූ කීර්ති ඝෝෂාවක් හට ගන්වන්නට සමත් මහ පොළොවකි. පාපී පුද්ගලයන් විසින් කරනු ලබන වාග් විෂ මර්‍ධනයට සමත් මන්ත්‍රයකි. එසේම ඖෂධයකි. සංවරයෙහි පිහිටියවුන්ට උතුම් වීර්‍යවන්ත කමකි. ගැඹුරු අදහස් ඇති බැවින් සාගරයකි. ද්වේෂය නම් වූ මහ සයුරට වෙරළකි. අපා දොරටුව වසන්නා වූ පියන් පතකි. දෙව්ලොව බඹලොව නැගිය හැකි ඉනිමගකි. සියලු ගුණ දහම් පිහිටීමට භූමියකි. කායාදී තිදොර පිරිසිදු කරන්නකි යැයි ප්‍රත්‍යවේක්‍ෂා කළ යුතු ය.

තව ද මේ ලෝක සත්ත්වයෝ ඉවසීම නම් වූ සම්පත්තිය නොමැති බැවින් මෙලොව තැවීමට හේතුවන ක්‍රෝධයෙහි යෙදී ඒ අනුව පසුව තැවෙති. පරලොව දී ද තැවෙති. අන්‍යයන් විසින් කළ කී දෑ අරමුණු කොට ද "**මට මෙසේ කීවේය, මෙසේ කළේය**" යැයි දුක් උපදිත් ද, ඒ දුක් හට ගැනීමට තැනක් වූ මේ ආත්මභාවය ද, ඒ දුක් විපාක වශයෙන් ලැබීමට මූල හේතුව ද මා විසින් ම කරගන්නා ලද්දකි. ඒ මේ දුක්ඛයන් නිවාලන්නට මේ ක්‍ෂාන්තිය (ඉවසීම) උතුම් පිහිටකි යැයි ප්‍රත්‍යවේක්‍ෂා කළ යුතු ය.

[1] ආත්ම පරිත්‍යාගයෙන් යුත් බලවත් වූ වීර්‍යය

තව ද අපකාර කරන්නන් (විරුද්ධව වැඩ කරන්නන්) නැතිනම් මම කෙසේ ඉවසීම පුරුදු කරන්නෙම් ද, මෙතෙමේ මට දැන් මෙසේ කළත් පෙර මට බොහෝ උපකාර කරන ලද්දෙහි ය. එය ඉවසීමට කාරණයක් නොවේ. කරන ලද අවැඩක් ම ඉවසීමට කාරණා වන්නේ ය. එසේ හෙයින් මට අවැඩ කොට මොහු මගේ ඉවසීම නැමැති උතුම් ගුණය පුරුදු කිරීමට මහත් උපකාර වූයේ යැයි ප්‍රත්‍යවේක්‍ෂා කළ යුතු ය.

තව ද මේ සියලු සත්ත්වයෝ මට දරුවෝ වැනි වෙති. දරුවෙකු කළ වරදකට කවරෙක් නම් කිපෙත් ද? යම් වරදක් හේතු කොට ගෙන මේසේ වූ දුක් උපන්නේ නම් ඒ දුක් විපාක ලැබීමට මම ම මූළ හේතුව කර ගත්තෙමි. මෙසේ ඒ කායික මානසික දුක් වේදනා මම ම සකස්කරගෙන එහි විපාක මට ම පැමිණෙන විට මම කවරෙකුට නම් කිපෙම් ද? යමෙක් යම් අවැඩක් කළේ වී නමුත් එය ඒ ක්‍ෂණයෙහි ම නිරුද්ධව ගියේ වේ ද? දැන් ඒ සියල්ල නිරුද්ධ වී අවසන් ය. නාමරූප, පඤ්චෝපාදනස්කන්ධ, ආධ්‍යාත්මික හා බාහිර වශයෙන් වූ දෙළොස් ආයතන ආදියෙහි පැවැත්මක් ස්ථිර බවක් නැත. සිඳි සිඳී බිඳි බිඳී පවත්නා වූ පරම්පරාවක් පවත්නේ වෙති. ඒ සියල්ල මම මගේ කියා නො පැවැත්විය හැකි අනාත්ම ධර්‍මතාවයක් බැවින් කරන කෙනෙකු හෝ විඳින කෙනෙකු නැත. එබැවින් කවරෙක් නම් කවරෙකුට අපරාධ කෙරෙත්ද යි ප්‍රත්‍යවේක්‍ෂා කොට ක්‍ෂාන්තිය (ඉවසීම) වැඩිය යුතු ය.

මෙසේ ඉවසීම පුරුදු කළ නමුත් යමෙකුගේ සිතෙහි කෙනෙකු කළ කී අවැඩ සිහි වී ඔහු කෙරෙහි ක්‍රෝධය නැවත නැවත ස්මතු වේ ද, සිතෙහි පුරුදු කළ කුසල පුරුදු මැඩ ඉදිරියට පැමිණේ ද එවිට මෙසේ සිහි කළ යුතු ය.

ක්‍ෂාන්තිය (ඉවසීම) වනාහි අනුන් විසින් කළ අවැඩවලට විරුද්ධ කම් වලට ප්‍රත්‍යුපකාර කරන්නකි. ඒ අවැඩ ද විරුද්ධ කම් කිරීමෙන් දුක් ඉපදවීම ශ්‍රද්ධාවට හා සියලු ලෝකය කෙරෙහි අනභිරත සඤ්ඤාවට ද හේතු වන්නේ ය. යම්කිසි ඉෂ්ට අනිෂ්ට වූ

රූපා දී අරමුණු හා එක්වීමක් වේ ද, එය වනාහි ඉන්ද්‍රියයන්ගේ ස්වභාවයක් වේ. යම් මේ අනිෂ්ට වූ රූපා දී අරමුණු එක්වීමක් මට නොවන්නේ යැයි යම් සිතුවිල්ලක් වේ ද එය කිසිවිට නොවන්නකි. ක්‍රෝධයෙහි වසඟයට ගිය සත්වයා ක්‍රෝධයෙන් උමතු වී අවුල් වූ සිත් ඇතිව තව තවත් ක්‍රෝධය වැඩීමට හේතුවන දේ කිරීමෙන් කවර ප්‍රයෝජනයක් ද, මේ සියලු සත්ත්වයෝ සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් කිසි භේදයක් නො කොට ඖරස පුත්‍රයන් මෙන් රක්නා ලද්දාහු ය. එබැවින් මා විසින් ඒ සත්ත්වයන් කෙරෙහි ක්‍රෝධ කිරීම නොගැළපෙන්නේ ය. අපරාධය හා ගුණවත් කම යමෙකු කෙරෙහි ඇති කල්හි ඒ අපරාධය අත්හැර ඔහුගේ ගුණවත් කම සිහි කොට මා විසින් ඔහුට ක්‍රෝධ නො කළ යුතු ය. කිසිඳු ගුණයක් නොදක්නා ලද විට **"මොහුට මාගේ අනුකම්පාව හැර වෙන කිසි පිහිටක් ඇත්තේ ද?"** යැයි කරුණාව ඉපදවිය යුතු ය. තව ද ක්‍රෝධය ඇති කල්හි මාගේ ඇත්තා වූ ගුණ පිරිහී යන්නේ ය. අපකීර්තිය ඇති වන්නේ ය. කිපීමෙන් මාගේ ශරීර වර්‍ණය අඩු වන්නේ ය. දුකසේ නිදීම වන්නේ ය. සතුරන් විසින් කැමති වන දෑ මා කරා පැමිණෙන්නේ ය. ක්‍රෝධය වනාහි අහිත දෙය කරන්නා වූ හිත දෙය නසන්නා වූ බලවත් සතුරෙකි.

ඉවසීම ඇති කල්හි කිසිඳු සතුරෙක් නැත්තේ ය. අපරාධ කළ තැනැත්තාට තමා විසින් ම කළ ඒ වරදෙහි විපාක වශයෙන් ලැබිය යුතු වූ යම් දුකක් වේ ද, ක්‍ෂාන්තිය ඇති කල්හි මා හට ඒ කිසි දුකක් නොවන්නේ යැයි මෙසේ ප්‍රත්‍යවේක්‍ෂා කළ යුතු ය.

තව ද මෙසේ ප්‍රත්‍යවේක්‍ෂා කළ යුතු ය. කිපෙන්නා වූ මම වනාහි සතුරා අනුව යන ලද්දේ වෙමි. මා විසින් ක්‍රෝධය ක්‍ෂාන්තියෙන් මැඬ පැවැත් වූ කල්හි එයට දස වූ සතුරා මැනවින් මැඬ පැවැත් වූයේ වන්නේ ය. ක්‍රෝධය හේතු කොට ගෙන මාගේ ඉවසීමේ ගුණය අත්හැරීම නුසුදුසු ය. ගුණයට විරුද්ධ ධර්‍මයක් වන ක්‍රෝධය ඇති විට මාගේ සීලාදී ගුණයෝ කෙසේ නම් සම්පූර්‍ණ වන්නේ ද, එසේ සීලාදී ගුණ ධර්‍ම නොමැති කල්හි මම කෙසේ නම් සත්ත්වයන්ට උපකාර කොට ප්‍රතිපදාවට අනුරූප ලෙස සැපයට පැමිණෙම් ද, ඉවසීම ඇති විටම බාහිර අවුල් නැති බැවින් එකඟ වූ

සිත් ඇති තැනැත්තාට ම සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍ය ආදී ලෙස ද නිර්වාණ සම්පත්තිය අසංඛත, අමෘත, ශාන්ත, ප්‍රණීත ආදී ලෙස ද සිතට වැටහෙන්නේ ය. බුද්ධ ධර්මය වනාහි අචින්ත්‍ය වූ අප්‍රමාණ ප්‍රභාව ඇත්තේ යැයි වැටහෙන්නේ ය. එයින් මතු මාර්ගානුලෝම ඥාණයෙහි පිහිටා සංස්කාර ධර්ම ආත්ම ආත්මීය භාවයක් (තමන්ට අයත් බවක්) නැත්තා වූ ධර්ම ස්වභාවයක් වූයේ ය. සත්ත්වයෝ ඔවුනොවුන් විසින් කරනු ලබන කුසලාකුසල කර්ම ස්වභාවය අනුව තම තමාගේ ප්‍රත්‍යයෙන් උපදිති, නැසෙති, කිසි තැනකින් නො එති. කිසි තැනකට නොයති. කිසි තැනක නොපිහිටති. මෙහි වනාහි කිසි කෙනෙකුන්ගේ බලපෑමක් යෙදවීමක් මැදිහත් වීමක් නොවන්නේ ය. මමය මාගේ ය කියා අහංකාර මමත්වයෙන් යුක්ත බව කිසිවක් පිහිට කොට නැත යැයි යම් වැටහීමක් වේ ද, එය කරණ කොට ගෙන මහා බෝධිසත්ත්වයන් වහන්සේලා සම්මා සම්බුද්ධත්වයට නියතව නොපෙරළෙන ස්වභාවයෙන් යුක්ත වූවාහු වෙති. එය වනාහි එතුමන් වහන්සේලා පුහුණු කළ ස්වකීය ඥාණය තුළින් වටහා ගෙන සිද්ධ වන්නේ යැයි මේ ආදී ලෙස ක්‍ෂාන්ති පාරමිතාවෙහි ගුණ ප්‍රත්‍යවේක්‍ෂා කළ යුතු ය.

## ☸ සත්‍ය පාරමිතාවෙහි ප්‍රත්‍යවේක්‍ෂා ක්‍රමය

සත්‍යයෙන් තොරව සීලාදී ගුණ ධර්ම නොපිරිය හැකි ය. ප්‍රතිපත්තියට අනුරූපව නොපිහිටන්නේ වේ. සත්‍යවාදීත්වය ඉක්මවා යැමෙන් සියලු පාප ධර්මයන්ගේ වැඩීම වන්නේ ය. අසත්‍යයෙන් අසත්‍ය ගළපන පුද්ගලයා ඇදහිය (විශ්වාස) නො කළ හැකි ය. මතුවටත් විශ්වාස නො කළ හැකි වචන ඇත්තෙකු වන්නේ ය.

සත්‍ය වචන ඇති තැනැත්තාට සියලු ගුණ ධර්ම පිහිටන්නේ ය. සත්‍ය නම් උතුම් ගුණය අධිෂ්ඨාන කොට ගැනීමෙන් සියලු බෝධි සම්භාර ධර්මයන් පූර්ණය කිරීමට සමත් වන බැවින් සත්‍ය වසං නොකිරීමෙන් සියලු බුද්ධ කාරක ධර්ම පූර්ණය කොට නිමාවට

පැමිණිය හැකි වන්නේ යැයි සත්‍ය පාරමිතාවේ සම්පත්තිය ප්‍රත්‍යවේක්‍ෂා කළ යුතු ය.

## ☸ අධිෂ්ඨාන පාරමිතාවෙහි ප්‍රත්‍යවේක්‍ෂා ක්‍රමය

දනාදි කුසල ධර්මයන්හි ස්ථිර අධිෂ්ඨානයෙන් පිහිටා ගත යුතු ය. ඒ දනාදි කුසල ධර්මයන්ට විරුද්ධවාදි ධර්මයන් මතු වූ කල්හි පසුබැසීමකට නොපැමිණ ස්ථිර අධිෂ්ඨානය නිෂ්චලව පිහිටා ගැනීම කළ යුතු ය. තවද දනාදි කුසල ධර්මයෝ ධීර වීර භාවයෙන් තොරව කිසි කලෙක සම්පූර්ණ නොවන බව සිහි කොට ධීර වීර භාවයෙන් සිදු කිරීම බෝධි කාරක ධර්ම සම්පූර්ණත්වයට හේතුවන බව ද සිහි කළ යුතු ය.

තව ද අධිෂ්ඨාන ශක්තිය නැති අයගේ දුබල බව ද, අධිෂ්ඨාන ශක්තියේ ගුණත්, අධිෂ්ඨාන ශක්තිය ඇතිව ජයගත් පූර්ව චරිත සිහි කිරීමත් කළ යුතු ය යැයි, අධිෂ්ඨාන පාරමිතාවේ සම්පත්තිය ප්‍රත්‍යවේක්‍ෂා කළ යුතු ය.

## ☸ මෛත්‍රී පාරමිතාවෙහි ප්‍රත්‍යවේක්‍ෂා ක්‍රමය

ආත්මාර්ථකාමී අදහස් ඇතියවුන්ට ද පරාර්ථකාමී අදහස් නැතියවුන්ට ද මෙලොව පරලොව සම්පත්තියකට පැමිණීමට නොහැකි වෙති. සියලු සත්ත්වයන් නිර්වාණ සම්පත්තියෙහි පිහිටුවන්නට කැමැත්ත ඇතියවුන් විසින් සත්ත්වයන් කෙරෙහි හිත වැඩ සැලසීමේ අදහසකින් තොරව සැපතට පැමිණීම නො කළ හැකි ය. පසුව සියලු සත්ත්වයන්ට ලෝකෝත්තර සම්පත් ලබා දීමට කැමති වන්නවුන් විසින් දැන් ලෞකික සම්පත් ලබා දීම පිණිස කැමති විය යුතු ය. දැන් අදහසක් ඇති වූ පමණකින් සත්ත්වයන්ට හිතසුව එළවීමට නොහැකි ය. එය ලබා දීමට ප්‍රයෝග සම්පත්තියෙහි පිහිටා ක්‍රියාවෙන් එය කළ යුතු ය. දැන් මා විසින් සත්ත්වයන්ට හිත සැප

එළවීමට යමක් කරන්නේ නම් එය මට පසුව ධර්ම සංවිභාගයට[1] සහාය වන්නේ ය. මේ සත්ත්වයන්ට උපකාර කිරීමෙන් තොරව මට බෝධි සම්භාර ධර්මයන් සිද්ධ කර ගැනීමට නොලැබෙන බැවින් මාගේ අධ්‍යාශය සම්පූර්ණ කර ගැනීමට මේ සත්ත්වයෝ උතුම් පුණ්‍ය ක්ෂේත්‍රයකි, අනුත්තර වූ කුසල බීජ වැපිරීමට භූමියකි, කුසලායතනයකි, උතුම් ගෞරව ආයතනයකි යනාදී ලෙස සත්ත්වයන් කෙරෙහි හිතෛෂී භාවය පිණිස අධිෂ්ඨානය ඇති කර ගත යුතු ය.

තව ද කරුණාවට පිහිටවන බැවින් සියලු සත්ත්වයන් කෙරෙහි මෛත්‍රිය වැඩිය යුතු ය. අසීමිතව කරන ලද මෛත්‍රිය සත්ත්වයන් කෙරෙහි හිත සුව එළවීමෙහි නිරත වූ තැනැත්තාට ඒ සත්ත්වයන්ට පැමිණෙන අහිත දුක් දුරු කිරීමට කැමැත්ත බලවත් ව උපදිති. ස්ථිරව පිහිටි කරුණාව සියලු බුද්ධ කාරක ධර්ම සම්පූර්ණ කිරීමට මූල කාරණය ද, එකම පිහිට ද, දෙරටුව ද වේ. මේ ආදී ලෙස මෛත්‍රී පාරමිතාව පිළිබඳ ව මෛත්‍රියෙහි ගුණ ප්‍රත්‍යවේක්ෂා කළ යුතු ය.

## ☸ උපේක්ෂා පාරමිතාවෙහි ප්‍රත්‍යවේක්ෂා ක්‍රමය

උපේක්ෂාව නැති කල්හි සත්ත්වයන් විසින් කරනු ලබන විප්‍රකාරය සිතට විකාර උපදවන්නේ ය. එසේ වූ චිත්ත විකාරයක් ඇති කල්හි දනාදී බෝධි කාරක ධර්මයන් වැඩීමක් නැත්තේ ය. මෛත්‍රී සෙනෙහසින් පිනවන ලද සිතෙහි උපේක්ෂාවෙන් තොරව බෝධි සම්භාර ධර්මයන්ගේ පිරිසිදු බවක් වැඩීමක් නොවන්නේ ය. උපේක්ෂාව නැති විට බෝධි සම්භාර ධර්මයන් වැඩීමෙන් වන කුසල ධර්මයන් ද, එහි විපාකයන් ද, සත්ත්වයන්ට පිරිනමන්නට නොහැකි වන්නේ ය. උපේක්ෂාව නැති විට සියලු සත්ත්වයන් කෙරෙහි ප්‍රතිග්‍රාහක සම්පත්තිය සලකා විභාගයක් නො කොට පරිත්‍යාග කිරීමට නොහැකි ය. උපේක්ෂාව නැති විට ජීවිතය පැවැත්වීමට සුදුසු වස්තූන්ගේ ද

---

[1] පසුබැසීමකට නොපැමිණ තමන් වහන්සේ අවබෝධ කරන සතර මාර්ග සතර ඵල නිර්වාණ ධර්මය සාධාරණ පරිභෝගය පිණිස අන්‍යයන්ට දේශනා කිරීම.

ජීවිතයෙහි ද අන්තරාය කර ස්වභාවයන් මෙනෙහි නො කොට සීලය පිරිසිදු කරන්නට නොහැකි වන්නේ ය.

තව ද උපේක්ෂාව ඇති විට වස්තූන් හි නො ඇලීම ද, ඇලීම ඉවසන තැනැත්තාට ම නෛෂ්ක්‍රම්‍ය බලය (අත්හැරීම) සිද්ධ වන බැවින් ද, වස්තූන් හි උත්පත්තියේ සිට වෙනස් වීම් ආදිය බැලීම් තුළින් බුද්ධ කාරක ධර්ම මුදුන්පත් වන බැවින් ද, දැඩි වීයඨය ඇත්තහුට උපේක්ෂාව අඩු වීමෙන් වීයඨයෙහි කෘත්‍යය සිදු නොවන බැවින් ද, උපේක්ෂාව ඇත්තහුට ශාන්ති චින්තාව සිද්ධ වන හෙයින් ද, උපේක්ෂාව ඇති විට සත්ව සංස්කාරයන් පිළිබඳ මුලා වීම රැවටීම නොවන හෙයින් ද, අෂ්ට ලෝක ධර්මයන්හි මධ්‍යස්ථ වීමෙන් සමාදන් ව ගත් කුසල ධර්මයන්හි නිශ්චලව පිහිටීම වන හෙයින් ද, අන්‍යයන් විසින් කරන අවැඩ නොසලකන බැවින් මෛත්‍රී විහරණය සමෘද්ධ වන බැවින් ද, මෙලෙස මහා බෝධිසත්ත්වයන් වහන්සේලාගේ සියලු බුද්ධ කාරක ධර්මයන් ගේ **සමාදනය අධිෂ්ඨානය සම්පූර්ණ වීම නිෂ්පත්තිය** (හට ගැනීම) යන මේ සියල්ලම උපේක්ෂාවෙහි අනුභාවයෙන් ම සිද්ධ වන්නේ යැයි උපේක්ෂා පාරමිතාව ප්‍රත්‍යවේක්ෂා කළ යුතු ය. මෙලෙස පරිත්‍යාග නොකිරීමෙහි ආදීනව හා පරිත්‍යාගයෙහි ආනිශංස ආදී ලෙස දනාදී සියලු පාරමිතා ධර්මයන් පූර්ණය කිරීම පිළිබඳ ව ප්‍රත්‍යවේක්ෂාව කළ යුතු ය.

තව ද පරිවාර සහිත වූ පසළොස් චරණ ධර්මයන් ද පඤ්ච අභිඥාවන් ද දනාදී පාරමිතා ධර්මයන්ට ප්‍රත්‍ය වේ. මෙහි චරණ ධර්ම නම් **සීල සංවරය, ඉන්ද්‍රිය සංවරය, පමණ දැන ආහාර ගැනීම, නිදි වැරීම, ශ්‍රද්ධාව, හිරිය, ඔත්තප්පය, බහුශ්‍රැත භාවය, වීයඨය, සතිය, ප්‍රඥාව, ප්‍රථම ධ්‍යානය, දුතිය ධ්‍යානය, තතිය ධ්‍යානය, චතුර්ථ ධ්‍යානය** යන පසළොසයි.

- මේ චරණ ධර්මයන්ගෙන් සීල සංවරය ආදී මුල් සතර ධර්මයන්ට **තෙළෙස් ධුතාංගයන්** ද, **අල්පේච්ඡතා** දී ගුණ ධර්මයන් ද පිරිවර වෙති.

❖ බුද්ධානුස්සති, ධම්මානුස්සති, සංඝානුස්සති, සීලානුස්සති, ත්‍යාගානුස්සති, දේවතානුස්සති, උපසමානුස්සති යන අනුස්සති භාවනා සත ද, රූක්‍ෂ පුද්ගලයන් දුරු කිරීම, මෘදු පුද්ගලයන් ඇසුරු කිරීම, ප්‍රසාදය ඇතිවෙන සූත්‍ර ධර්‍මයන් සිහි කිරීම, එහි නැමුණු සිත් ඇති බව ද යන ඒකාදස ධර්‍මයන් ශ්‍රද්ධාවට පිරිවර වෙති.

❖ අකුසලයන්හි ආදීනව සිහි කිරීම, අපාය දුක්ඛය සිහි කිරීම, කුසල ධර්‍මයන්ට උපකාර බව සැලකීම, හිරි ඔත්තප්ප ධර්‍ම නැති පුද්ගලයන් දුරු කිරීම, හිරි ඔත්තප්ප ධර්‍ම ඇති පුද්ගලයන් සේවනය කිරීම, එහි නැමුණු සිත් ඇති බව යන ධර්‍ම සය හිරි ඔත්තප්ප ධර්‍මයන්ට පිරිවර වෙති.

❖ පෙර භවයන්හි දී සමථ විපස්සනා භාවනාවන් සම්පූර්‍ණ ලෙස ප්‍රගුණ කර ඇති බව, විමසන බව, ධර්‍මානුධර්‍ම ප්‍රතිපත්තියෙහි යෙදීම, නිවැරදි විද්‍යාස්ථානාදියෙහි හික්මී පුරුද්ද, මෛත්‍රී ශ්‍රද්ධාදී ඉඳුරන් ඇති බව, කෙලෙස් දුරු කළ බව, අල්පශ්‍රැත පුද්ගලයන් දුරු කිරීම, බහුශ්‍රැත පුද්ගලයන් සේවනය කිරීම, එහි නැමුණු සිත් ඇති බව යන නවවිධ ධර්‍මයන් බහුශ්‍රැත බවට පිරිවර වෙති.

❖ අපාය භය සිහි කිරීම, අනුගමනය කළ යුතු මග සිහි කිරීම, ධර්‍මයෙහි මහත් බව (ගැඹුරු) සිහි කිරීම, ථීනය හා මිද්ධය යන දෙක දුරු කිරීම, කුසීත පුද්ගලයන් දුරු කිරීම, වියර්‍යයවන්ත පුද්ගලයන් ඇසුරු කිරීම, සතර සම්‍යක් ප්‍රධාන වීයර්‍ය සිහි කිරීම, එහි නැමුණු සිත් ඇති බව යන අෂ්ට විධ ධර්‍මයන් වීයර්‍යයට පිරිවර වෙති.

❖ සිහිය නුවණ ඇති බව, මුලා වූ සිහි ඇතියවුන් දුරු කිරීම, එළඹ සිටි සිහිය ඇතියවුන් ඇසුරු කිරීම, එහි නැමුණු සිත් ඇති බව යන සතර ධර්‍මයන් සිහියට පිරිවර වෙති.

- ❖ **විමසන බව, ආධ්‍යාත්මික බාහිර වස්තූන් හි පිරිසිදු බව, සම වූ ශ්‍රද්ධා දී ඉන්ද්‍රියයන් ඇති බව, නුවණ මඳ පුද්ගලයන් දුරු කිරීම, ප්‍රඥවන්ත පුද්ගලයන් ඇසුරු කිරීම, ගැඹුරු වූ ප්‍රඥ ප්‍රභේද සිහි කිරීම, එහි නැමුණු සිත් ඇති බව** යන සප්තවිධ ධර්මයන් ප්‍රඥවට පිරිවර වෙති.

- ❖ **ප්‍රාතිමෝක්ෂ සංවර සීලය, ඉන්ද්‍රිය සංවරය, පමණ දන ආහාර ගැනීම, නිදි වැරීම, සමථ භාවනාව පිළිබඳ වූ භාවනා කර්මස්ථාන අටතිසෙහි පූර්ව භාග භාවනාව ද, ආවර්ජනාදී ධ්‍යානයන් පිළිබඳ වූ පඤ්ච විධ වශීතාව ද** යන තෙසාළිස් ධර්ම සතර ධ්‍යානයන්ට පිරිවර වෙති.

මෙහි වනාහි සීලාදී ප්‍රයෝග ශුද්ධිය[1] සත්ත්වයන්ට අභය දනය පිණිස හේතු වේ. ආශය ශුද්ධිය[2] ආමිස දනය පිණිස හේතු වේ. ප්‍රයෝග හා ආශය දෙදෙනාගේ ශුද්ධිය ධර්මදනය පිණිස හේතු වේ. සමර්ථ වේ. මෙලෙස චරණ ධර්ම බෝධි කාරක ධර්මයන්ට ප්‍රත්‍යය වේ. තව ද සම්පත්ති චක්කාදීහු ද[3] දනාදී පාරමිතාවන්ට ප්‍රත්‍ය වන බව දත යුතු ය.

---

[1] යෝනිසෝ මනසිකාරය ඇතිව මනාව ධර්ම ශ්‍රවණය කොට කාය වාක් සංවරය ඇති කර ගැනීම

[2] විදර්ශනා ප්‍රඥව නම් වූ අනුලෝම ක්ෂාන්තියෙන් ද, කර්ම විපාක දන්නා ඥනය හා මාර්ග ඥනය නම් වූ යථාභූත ඥන දර්ශනයෙන් ද කෙලෙසුන් දුරු කිරීම

[3] ප්‍රතිරූප දේශ වාසය, සත්පුරුෂ සන්සේවනය, නිවැරදි දිවි පැවැත්ම, පෙර කරන ලද පින් ඇති බව

# 7. පාරමිතා ධර්‍මයන්ගේ කෙලෙසීම කෙසේ වේද?

**තෘෂ්ණා දිට්ඨි මාන** යන ප්‍රපඤ්ච ධර්‍මයන්ගෙන් අල්ලා ගන්නා ලද බව දනාදී පාරමිතා ධර්‍මයන් ගේ කෙලෙසීම, බලය අඩු වීම එම කුසල ධර්‍මයන්ගේ සංක්ලේශය නම් වේ.

❖ **"අවිසෙසෙන තණ්හාදීහි පරාමට්ඨභාවො පාරමීනං සංකිලෙසො"**

සාමාන්‍යයෙන් තණ්හා දී ක්ලෙශයෙන්ගෙන් අල්ලා ගන්නා ලද දනා දී කුසල ධර්‍මයන් ගේ කෙලෙසීම නම් වේ. දනාදී කුසල් කිරීමට පෙර හෝ කරන විට හෝ කිරීමෙන් පසුව හෝ මේ පිනෙන් භව භෝග සම්පත් ලබම්, ප්‍රශංසා ලබම්, කීර්තිය ලබම්, අන්‍යයන්ට වඩා උසස් බව ලබම්, සැප ලබම් යනාදී වශයෙන් තෘෂ්ණා සහගත ප්‍රාර්‍ථනාවෙන් යුක්ත වූ චේතනාවෙන් යුක්ත වීමෙන් ඒ කුසලය දුබල වේ.

❖ **"දෙය්‍යධම්ම පටිග්ගාහකවිකප්පා දනපාරමියා සංකිලෙසො"**

මේ වස්තුව දන් දෙමි මේ වස්තුව දන් නොදෙමි යැයි වස්තුව ගැන ද, මේ අයට දන් දෙමි මේ අයට දන් නොදෙමි යැයි පුද්ගලයා ගැන ද භේදයක් ඇති කර ගැනීම වෙන් කොට සිතීම දන පාරමිතාව දුබල වීමට හේතු වේ.

❖ **"සත්තකාලවිකප්පා සීලපාරමියා සංකිලෙසො.**

අසවල් සත්වයා මරවම් අසවල් සත්වයා නොමරවම් යැයි සත්ත්වයන් පිළිබඳ ව ද, අසවල් වෙලාවෙහි මරවම් අසවල් වෙලාවෙහි නොමරවම් යැයි කාලය පිළිබඳ ව ද වස්තූන් පිළිබඳ ව ද විශේෂ කොට කල්පනා කිරීම සීල පාරමිතාවෙහි සංක්ලේශය යි.

❖ **"කාමභව තදුපසමෙසු අභිරති අනභිරති විකපපා නෙකඛමම පාරමියා සංකිලෙසො"**

අසවල් කාම වස්තූන් පරිභෝග කළ යුතුය, අසවල් කාම වස්තූන් පරිභෝග නො කළ යුතුය, හළ යුතුය, අසවල් භවයන්හි ඉපදිය යුතුය, අසවල් භවයන්හි නො ඉපදිය යුතුය, හළ යුතුය යනාදී වශයෙන් කාම වස්තූන් හා භවයන් ගැනීම හා බැහැර කිරීම පිළිබඳ විශේෂයෙන් කල්පනා කිරීම නෛෂ්ක්‍රම්‍ය පාරමිතාවෙහි සංක්ලේශයෝ වෙති.

❖ **"අහං මමාති විකපපා පඤ්ඤාපාරමියා සංකිලෙසො"**

මම ය  අනෙකා ය මගේ ය අනෙකාගේ ය යනාදී ලෙස වෙන් කොට වරදවා කල්පනා කිරීම ප්‍රඥා පාරමිතාවෙහි සංක්ලේශයෝ වෙති.

❖ **"ලීනුදධචචවිකපපා වීරියපාරමියා සංකිලෙසො"**

මේ සඳහා වීයඖය කළ යුතු ය, මේ සඳහා වීයඖය නො කළ යුතු ය, මෙය ඉක්මනින් කළ යුතු ය, මෙය හෙමින් කළ යුතු ය, මේ කාලයෙහි කළ යුතු ය, මේ කාලයෙහි නො කළ යුතු ය යනා දී ලෙස ථිනමිද්ධ වශයෙන් චිත්ත චෛතසික ධර්‍මයන් ගේ හැකිළීම හා උද්දච්ච වශයෙන් නොසන්සිඳුණු බව වීයඖය කිරීම පිළිබඳ ව හා පසුබැසීම පිළිබඳ ව විශේෂ කල්පනා ඇති බව වීයඖය පාරමිතාවෙහි සංක්ලේශයෝ වෙති.

❖ **"අතතපර විකපපා ඛනතිපාරමියා සංකිලෙසො"**

මොහු අපගේ නෑයෙකි, ගමේ කෙනෙකි, රටේ කෙනෙකි එබැවින් මොහු ගේ වැරදි ඉවසිය යුතු ය, මොහු අප ගේ නෑ පරපුරෙහි කෙනෙකු නොවේ, ගමේ කෙනෙකු ද රටේ ජාතියේ කෙනෙකු ද නොවේ, මොහු විසින් කළ වැරදි ඉවසිය හැකි නොවේ යැයි,

මෙසේ තමාගේ ය අනුන්ගේ ය යනා දී ලෙස විශේෂ කොට කල්පනා කිරීම ක්‍ෂාන්ති පාරමිතාවෙහි සංක්ලේශයෝ වෙති.

❖ **"අදිට්ඨාදීසු දිට්ඨාදිවිකප්පා සච්චපාරමියා සංකිලෙසො"**

නො දුටු දෙය දුටුවේ ය, නො ඇසූ දෙය ඇසුවේ ය, නොකී දෙය කීවේය යනාදී ලෙස සත්‍යය මුවහ කොට වරදවා පිළිපැදීම සත්‍යය පාරමිතාවෙහි සංක්ලේශයෝ වෙති.

❖ **"බොධිසම්භාරතබ්බිපක්ඛෙසු දොසගුණවිකප්පා අධිට්ඨාන පාරමියා සංකිලෙසො"**

බෝධි සම්භාර ධර්‍මයන්හි අගුණ හා එයට විරුද්ධ ධර්‍මයන්හි ගුණ කල්පනා කිරීම අධිෂ්ඨාන පාරමිතාවෙහි සංක්ලේශයෝ වෙති.

❖ **"හිතාහිතවිකප්පා මෙත්තාපාරමියා සංකිලෙසො"**

මොවූහු තමාට හිත සත්ත්වයෝ ය, මොවූහු අහිත සත්ත්වයෝ ය යනාදී ලෙස සත්ත්වයන් පිළිබඳ ව මෛත්‍රී චිත්තය අසම කොට සැලකීම මෛත්‍රී පාරමිතාවෙහි සංක්ලේශයෝ ය.

❖ **"ඉට්ඨානිට්ඨවිකප්පා උපෙක්ඛාපාරමියා සංකිලෙසො"**

ප්‍රිය අප්‍රිය අරමුණු, කැමති අකැමැති අරමුණු පිළිබඳ ව අසමකොට සැලකීම කල්පනා කිරීම උපේක්‍ෂා පාරමිතාවෙහි සංක්ලේශයෝ ය.

# 8. පාරමිතාවන්ගේ පිරිසිදු වීම කෙසේ වේ ද?

ප්‍රපඤ්ච ධර්මයන්ගෙන් හා උපක්ලේශ ධර්මයන්ගෙන් පාරමිතා කුසල ධර්ම අපිරිසිදු නොවීම පාරමිතාවන් ගේ ව්‍යවදනය හෙවත් පිරිසිදු බව ය. එහි ප්‍රපඤ්ච යනු තණ්හා දිට්ඨි මාන යන තුනයි. එහිඃ-

- ❖ **තණ්හාවඃ-** කොතෙක් තිබුනත් සෑහීමක් නැති නැවත නැවත වස්තූන්ට ආශා කරන බවය.
- ❖ **දිට්ඨිය** ඃ- නාමරූප, පඤ්ච උපාදනස්කන්ධ, සළායතනාදිය පිළිබඳ ව සත්වයෙක් පුද්ගලයෙක් කියා ද, මම ය අසවලා ය කියා ද මෙලෙස නැති දෙය ඇති හැටියට පනවා වරදවා ගැනීමයි.
- ❖ **මානය** ඃ- පුද්ගලයන් හා සම්බන්ධ වස්තූන් පිළිබඳ ව උස් පහත් කොට මනින ස්වභාවයයි.

උපක්ලේශ වනාහි **අභිජ්ජා ව්‍යාපාද, ක්‍රෝධ, උපනාහ, මක්ඛ, පලාස, ඉස්සා, මච්ඡරිය, මායා, සාඨෙය්‍ය, ථම්භ, සාරම්භ, මාන, අතිමාන, මද, ප්‍රමාද** යන ක්ලේශයෝය. එහි ඃ-

| | | | | | |
|---|---|---|---|---|---|
| අභිජ්ජා | ඃ- | විෂම ලෝභය | මායා | ඃ- | නැති ගුණ හැඟවීම |
| ව්‍යාපාද | ඃ- | තරහව | සාඨෙය්‍ය | ඃ- | කපටි බව |
| ක්‍රෝධ | ඃ- | විරුද්ධ බව | ථම්භ | ඃ- | තද ගතිය (දළදඬු බව) |
| උපනාහ | ඃ- | බද්ධ වෛරය | සාරම්භ | ඃ- | එකට එක කිරීම |
| මක්ඛ | ඃ- | ගුණමකු බව | මාන | ඃ- | මනින බව |
| පලාස | ඃ- | අනුන්ගේ දෙස් කීම | අතිමාන | ඃ- | තමා උසස් කොට දැක්වීම |
| ඉස්සා | ඃ- | ඊෂ්‍යාව | මද | ඃ- | උඩඟු කම |
| මච්ඡරිය | ඃ- | මසුරු බව | පමාද | ඃ- | ප්‍රමාදය |

මේ අකුසල ධර්මයන්ගෙන් තොරව කරන ලද දනාදී කුසල ධර්ම පිරිසිදු වූ ප්‍රභාස්වර වූ බලවත් කුසල් බවට පැමිණේ.

# 9. පාරමිතාවන්ට විරුද්ධ ධර්ම මොනවා ද?

සාමාන්‍යයෙන් සියලු සංක්ලේශ ධර්මයෝ ද සියලු අකුසල ධර්මයෝ ද පාරමිතා ධර්මයන්ට විරුද්ධ වෙති. විශේෂයෙන් මච්ඡරිය ආදී පාප ධර්ම විරුද්ධ ධර්ම වෙති.

තවද දිය යුතු දන වස්තුව එය ලබන ප්‍රතිග්‍රාහකයා හා දන ඵලය පිණිස උපකාර වන අලෝභ අදෝෂ අමෝහ යන ගුණයන්ගේ පිහිටීමට විරුද්ධව ලෝභ දෝෂ මෝහ කෙලෙස් මුල් විරුද්ධ ධර්ම වෙති.

කාය වංකාදී දෙස් සීලය හේතුවෙන් දුරුවන බැවින් සීලය ලෝභාදී අකුසල ධර්මයන්ට විරුද්ධ වේ.

කාම සැප, අනුන් නැසීම, තමාට දුක් දීම යන මේවා දුරු කරන බැවින් නෛෂ්ක්‍රම්‍යය දෝෂත්‍රයටම විරුද්ධ වේ.

ලෝභ දෝෂ මෝහ සිත අඳුරු කරන ධර්ම බැවින් ද, ප්‍රඥාව සිත ආලෝකවත් කරන ධර්ම වන බැවින් ද ප්‍රඥාව ලෝභාදියට විරුද්ධ වේ.

අලස නොවූ බව, නිරහංකාර බව යෝග්‍යතාවය යන මොවුන්ගේ වශයෙන් වීර්‍ය්‍යය ලෝභාදියට ප්‍රතිපක්ෂ (විරුද්ධ) වේ.

ඉෂ්ට අනිෂ්ට ශූන්‍යතා යන ධර්ම ඉවසන හෙයින් ක්ෂාන්ති පාරමිතාව ලෝභාදියට ප්‍රතිපක්ෂ වේ.

අනුන්ගේ උපකාර හා විරුද්ධ කම් ඇති කල්හි ද යථා ස්භාවයෙන් පවත්නා හෙයින් සත්‍ය පාරමිතාව ලෝභාදිය විරුද්ධ වේ.

අෂ්ටලෝක ධර්මදී ලෝක ධර්මතාවයන්ට යට නොවී සමාදන් ව පිහිටා ගත් ලෙස ම බුද්ධ කාරක ධර්මයන් කෙරෙහි නොසෙල්වෙන ලෙස පිහිටන හෙයින් අධිෂ්ඨාන පාරමිතාව ලෝභාදීන්ට විරුද්ධ වේ.

මෛත්‍රිය වැඩීමෙන් ධ්‍යාන සමාධි භාවයට පැමිණීමෙන් නීවරණ විෂ්කම්භන වශයෙන් ප්‍රහාණය වන බැවින් මෛත්‍රි පාරමිතාව ලෝභාදියට විරුද්ධ වේ.

හිත අහිත සියල්ල කෙරෙහි ම ඇලීම හා ගැටීම වළක්වන හෙයින් ද සමව පවත්නා බැවින් ද උපේක්ෂා පාරමිතාව ලෝභාදියට විරුද්ධ වේ.

# 10. පාරමිතා ධර්මයන්ගේ ප්‍රතිපත්තිය කවරේද?

## ❄ දන පාරමිතාවේ ප්‍රතිපත්ති ක්‍රමය

සැප ලැබීමට හේතු වන බාහිර වස්තූන් දන් දීම, ශරීරාවයව දන් දීම, ජීවිතය දන් දීම, සත්ත්වයන්ට පැමිණියා වූ ද පැමිණෙන්නට ඇත්තා වූ ද භය දුරු කිරීම, ධර්මයෙන් අනුශාසනා කිරීමෙන් උපදෙස් දීමෙන් නිවැරදි මග පෙන්වීම, පිදිය යුත්තන් පිදීමාදී ලෙස සත්ත්වයන්ට අනුග්‍රහ දක්වීම දන පාරමිතාවෙහි ප්‍රතිපත්තියයි.

දනය වනාහි "**ආමිස දනය, අභයදනය, ධර්මදනය**" යැයි දිය යුතු වස්තු වශයෙන් ත්‍රිවිධ වේ. මහා බෝධිසත්ත්වයන් වහන්සේලා විසින් දිය යුතු වස්තු වනාහි **බාහිර වස්තු දනය, අභ්‍යන්තර වස්තු දනය** යැයි ද්විධ වේ. එහිඃ-

**බාහිර වස්තු දනය** වනාහි "**ආහාර දනය, පාන දනය, නිවාස දනය, වස්ත්‍ර දනය, යාන දනය, මාලා විලේපන දනය, ගන්ධ දනය, ඇතිරිලි දනය, ආවාස දනය, ප්‍රදීප දනය**" යැයි දසවිධ වෙති.

එසේම **රූපාරම්මණ, ශබ්දරම්මණ** ආදී අරමුණු වශයෙන් සයවිධ වෙති. රූපාරම්මණය ද **නීල පීතාදී** ලෙස විවිධ වේ. එසේම **රන් රිදී මුතු මැණික් පබළු ආදිය ද, ආරාම කෙත් වතු ආදිය ද, දස, දසී, ගව, මහිෂාදී** ධන උපකරණ වශයෙන් විවධ වේ.

මහා පුරුෂයන් වහන්සේලා බාහිර වස්තූන් දන් දෙන කල්හි යමෙකුට යමකින් ප්‍රයෝජන වේද එයම දන් දෙති. දෙන විට ද ඔහුට මෙය ප්‍රයෝජන වේ යැයි තමා ම දන ඔහුගේ ඉල්ලීමක් නැතිවම දෙයි. ඉල්ලූ කල්හි දීම ගැන කියනු ම කවරේ ද? කිසිවක් අපේක්ෂා නොකොටම දෙති. කිසිවක් ප්‍රමාණ වශයෙන් නො සලකා සිතෙහි කැමැත්ත පරිදි ඇති තාක් දෙති. දිය යුතු වස්තු ප්‍රමාණවත් ලෙස නොමැති විට සුදුසු පරිදි බෙද දෙති.

අනුන් නසන්නට හේතුවන ආයුධ වස විෂ මත් ද්‍රව්‍ය ආදිය ද යමක් අනර්ථයෙන් යුක්ත වේ ද, ප්‍රමාදයට හේතුවේ ද, එසේ වූ ක්‍රීඩා භාණ්ඩයන් ද උපකරණයන් ද නොදෙති. ගිලන් අය යමක් ඉල්ලන්නේ ද එසේ වූ ආහාර පාන බෙහෙත් ආදිය අතර නොගැළපෙන දේ ද, පමණ ඉක්මවා ද නොදෙති. යෝග්‍ය දෙය ප්‍රමාණයෙන් යුක්තව දෙති. ගිහි හෝ පැවිදි හෝ යම් කෙනෙකු යමක් ඉල්ලන්නේ ද සාරූප්‍ය දෙයම දෙති. යමක් දෙන විට ද මව්පියෝ ලේ නෑයෝ මිත්‍ර මහාමාත්‍ය යෝ අඹු දරුවෝ දස කම්කරුවෝ ආදී කිසිවකුට පීඩාවක් අලාභයක් නො කොට දෙති. ප්‍රණීත දෙයක් දීමට පොරොන්දු වී ලාමක දෙයක් නොදෙති. ප්‍රත්‍යුපකාර අපේක්ෂා නො කොට දෙති. අන් කිසිවක් අපේක්ෂා නො කොට සම්‍යක් සම්බුද්ධත්වය ම එකම අපේක්ෂාව කොට දෙති. යාචකයන් කෙරෙහි හා දෙන වස්තුව කෙරෙහි පිළිකුලක් නො කොට දෙති. කළෙහි ගුණ නොදත් සංයමයක් නැත්තා වූ අක්‍රෝෂ පරිභව කරන්නා වූ යාචකයන්ට පවා ඉවත දැමූවක් නොදී පැහැදුණු සිතින් යුතුව

අනුකම්පා සහගත ව සකස් කොට ම දෙති. දුටු දෙය ඇසූ දෙය මංගලය යනාදී කෝතුහල මංගලික නොවී කර්‍ම ඵල විශ්වාසයෙන් ම දෙති. යාචකාදීන් වෙහෙසට පත් නො කොට දෙති. අන්‍යයන්ට වඤ්චා කිරීමේ බිඳුවීමේ අදහස් නැතිවම දෙති. අන්‍යයන්ට ප්‍රිය භාවයෙන් ප්‍රිය වචනයෙන් යුක්තව ප්‍රමාණයෙන් යුත් වචන ඇතිව නොකිලිටි සිතින් යුතුවම දෙති.

තව ද යම් වස්තුවක් මහත් වටිනාකම් ඇත්තේ ද සිත් ගන්නා සුළු වේ ද බොහෝ කල් ප්‍රයෝජන ගන්නා ලද බැවින් ඇලුම් කරන සුළු වූයේ වේ ද, මහ බෝසතාණන් වහන්සේලා එම වස්තූන් කෙරෙහි ප්‍රතිග්‍රාහකයෙක් පැමිණි කල්හි එම වස්තූන් කෙරෙහි ලෝභය දුරු කොට තමන්ට ම පීඩාව අලාභය පාඩුව ඇති කර ගෙන ඒ ගැන නො සිතා අන්‍යයන්ට ගෞරව ඇතිව දෙති.

තවද මහා පුරුෂයන් වහන්සේලා වනාහි තම දූ පුතුන් භාර්‍යාව දාස දාසීන් කම්කරුවන් යමෙක් ඉල්ලන්නේ ද, තම දූ පුතුන් ආදීන්ගේ අකමැත්ත ඇති කල්හි ඔවුන් නොදෙති. ඔවුන් සතුටු සිතින් ඉදිරිපත් වූ විටම ගෞරව සම්ප්‍රයුක්ත ව දෙති. එසේ දෙන කල්හි ද යක්‍ෂ රාක්‍ෂ පිසාචාදීන්ට ද රෞද්‍ර මිනිසුන්ට ද දූන දූන නොදෙති. යමෙක් අන්‍යයන්ට දුක් පිණිස අනර්ථය පිණිස පිළිපදිත් ද එබඳු වූවන්ට රාජ්‍යය නොදෙති. යමෙක් දැහැමින් ලෝකය පාලනය කරයි ද ඔවුන්ට ම රාජ්‍යය දන් දෙති. මේ බාහිර දානය පිළිබඳ වූ මහා බෝධිසත්ත්වයන් වහන්සේලාගේ ප්‍රතිපත්ති ක්‍රමයයි.

මහා බෝධිසත්ත්වයන් වහන්සේලාගේ **ආධ්‍යාත්මික දානය** ද දෙපරිදි වෙති.

යම් කෙනෙකු දුගී බව හේතුවෙන් කෑම බීමට ආහාර පාන හා ඇඳීමට වස්ත්‍ර නොමැති කමින් අන්‍යයන්ට බැල මෙහෙවර කරමින් දාස භාවයට පැමිණේ ද, එසේම මහා පුරුෂයන් වහන්සේලා ද සම්‍යක් සම්බෝධිය හේතු කොට ගෙන ලෞකික ආශා ප්‍රාර්ථනා නැතිව සත්ත්වයන්ට උත්තරීතර සුවය ලබා දීමේ කැමැත්තෙන් දාන පාරමිතාව සම්පූර්ණ කරනු පිණිස තම ශරීරාංග හා ජීවිතය අනුන්ට

පාවා දෙති. අනුන්ගේ දස භාවයට පැමිණෙති. අත් පා ඇස් හිස් මස් ලේ ආදී ශරීරාංග ප්‍රයෝජන ඇතියවුන්ට අවශ්‍ය ලෙස කටයුතු කර ගැනීමට ඒ ඒ දෙය පරිත්‍යාග කරති. අකම්පිත ව හැකිළීමක් නැතිව දෙති.

බාහිර වස්තු පරිත්‍යාග කිරීමෙහි දී යම් සේ පිළිපදිත් ද, ආධ්‍යාත්මික වස්තු පරිත්‍යාගයෙහි දී ද එසේම කරති. මහා පුරුෂයන් වහන්සේලා දෙයාකාරයකින් බාහිර වස්තු පරිත්‍යාග කරති. එනම් අනුන්ගේ අපේක්ෂාව යම් සේ සම්පූර්ණ වෙත් ද එලෙසටම දෙති. තමන්ගේ දනා දී කුසල පුරුද්ද යම් සේ වශී භාවයට ප්‍රගුණත්වයට යයි ද එලෙස දෙති. මෙලෙස සර්වප්‍රකාරයෙන් දන් දීම අනපේක්‍ෂකව කිරීමට ප්‍රගුණ වූ විට, **"මෙසේ මම නො ඇලීම දන් දීම හේතුකොටගෙන සම්බුද්ධත්වයට පැමිණෙන්නෙමි"** යැයි දන් දෙති. ආධ්‍යාත්මික වස්තු දෙන කල්හි ද මෙසේ ම දෙති.

ආධ්‍යාත්මික වස්තුවක් දන් දෙන කල්හි ද යමක් යාචකයාට හිත පිණිස ප්‍රයෝජනය පිණිස වේ ද එය ම දන් දෙති. අනිකක් නොදෙති. තව ද මහා පුරුෂයන් වහන්සේලා මාරයාට හෝ විහිංසා අදහස් ඇති මාර පාක්ෂික දෙවියන්ට හෝ දූන දූන තම ආත්මභාවය හෝ අඟපසඟ ඔවුන්ට අනර්ථයක් නොවේවා යැයි දන් නොදෙති. මාර පාක්ෂික දෙවියන් ආවේශ වූ අයට ද නොදෙති. උමතු වූවන්ට නොදෙති. ප්‍රකෘතිමත් අයට ඉල්ලීම සමගම දන් දෙති. කුමක් හෙයින් ද යත්? එබඳු ඉල්ලීම ද දීම ද දුෂ්කර දෙයක් වන හෙයිනි.

**අභයදනය** වනාහි රජුන්ගෙන් ද, සොරුන්ගෙන් ද, ගින්නෙන් ද, ජලයෙන් ද, වෛරී පුද්ගලයන්ගෙන් ද, සිංහ ව්‍යාඝ්‍රාදී චණ්ඩ මෘග සත්වයන්ගෙන් ද, යක්‍ෂ රාක්‍ෂ පිසාචාදීන්ගෙන් ද සත්ත්වයන්ට බියක් තැති ගැනීමක් ඇති වූ කල්හි ඒ උපද්‍රවවලින් ආරක්ෂා කිරීම තුළින් සිදු කරති.

**ධර්මදනය** වනාහි නොකිලිටි සිත් ඇති විපර්යාස නොවූ සිත් ඇති නිවැරදි අර්ථ සහිත ධර්ම දේශනාවයි. තව ද මෙලොව පරලොව

අර්‍ථය, නිර්‍වාණ සුවය යන අර්‍ථයන් පිණිස වූ මනා උපදේශයයි. එය බුදු සසුනෙහි නො බැස ගත්තවුන්ට බැස ගැනීම පිණිසත් බැස ගත්තවුන්ට එය මුහුකරවීම පිණිසත් උපකාර වේ. එහි ක්‍රමය මෙසේ ය. :-

පළමුකොටම සාරාංශ වශයෙන් **දන කථා, සීලකථා, ස්වර්‍ගකථා, කාමයන්ගේ ආදීනව කෙලෙසීම පිළිබඳ කථා, නෛෂ්ක්‍රම්‍යයෙහි ආනිශංස කථා** යන ක්‍රමයයි. එය විස්තර වශයෙන් වනාහි **ශ්‍රාවක බෝධියෙහි ඇලුණු සිත්** ඇත්තවුන්ට **සරණාගමනය, සීල සංවරය, ඉන්ද්‍රිය සංවරය, ආහාරයෙහි පමණ දන්නා බව, නිදි වර්ජිත බව, සප්ත ධර්‍මය**[1] **අට තිස් ආරම්මණ (සමථ කර්‍මස්ථාන), රූපස්කන්ධාදී විදර්‍ශනාව, විශුද්ධි ප්‍රතිපදව**[2] **මනා කොට ග්‍රහණය කර ගැනීම, ආර්‍ය අෂ්ටාංගික මාර්‍ගය, ත්‍රී විද්‍යාව, ෂට් අභිඥව, සිවුපිළිසිඹියා ඤාණ, ශ්‍රාවක බෝධිය** යන මේවායේ ගුණ වර්‍ණනා කිරීමෙන් ධර්‍මයෙහි පිහිටුවීමයි.

එසේම පසේ බුදු බව ලොව්තුරා බුදු බව කෙරෙහි ඇලුණු සිත් ඇති සත්ත්වයන්ට දනාදී පාරමිතාවන්ගේ ස්වභාවය එහි ලක්‍ෂණ රස පච්චුපට්ඨාන පදට්ඨාන ආදිය වර්‍ණනා කිරීම, අතීත අනාගත වර්‍තමාන කාලත්‍රය පිළිබඳවම බුදුරජාණන් වහන්සේලාගේ මහානුභාවය විස්තර කිරීම, යාන දෙකෙහි (බුදු, පසේ බුදු) පිහිටුවීම එහි පිළිවෙළයි. මේ ක්‍රමයෙන් මහා පුරුෂයන් වහන්සේලා සත්ත්වයන්ට ධර්‍මදනය දෙති.

තව ද මහා සත්ත්වයන් වහන්සේලා සත්ත්වයන්ට ආමිස දනය දෙන කල්හි **"මම මේ දනයෙන් සත්ත්වයන්ට ආයුෂය, ශරීර වර්‍ණය, කායික මානසික සුවය, කායික බලය, ප්‍රඥව යන සම්පත් ද, රමණීය වූ අග්‍රඵල සම්පත්තිය යැයි කියන ලද අර්‍හත්වය සිද්ධ කරමි"** යැයි ආහාර දන් දෙති.

---

[1] ශ්‍රද්ධාව, හිරිය, ඔත්තප්පය, බහුශ්‍රැතතාවය, ආරද්ධ වීර්‍යය, සිහිය, ප්‍රඥව යන සප්ත ධර්‍මයයි.

[2] සමථ විපස්සනා භාවනාවන්හි යෙදී තණ්හා දිට්ඨි විෂ්කම්භන වශයෙන් යට කොට සංස්කාර ධර්‍ම අනිත්‍යාදී වශයෙන් දැකීම

සත්ත්වයන්ගේ කාම පිපාසය ක්ලේශ පිපාසය සන්සිඳුවමි යැයි අෂ්ටපානාදී පාන ගිලන්පස වර්‍ග දන් දෙති. එසේම රන්වන් ශරීර වර්‍ණය ලැබීම පිණිස ද හිරි ඔත්තප්ප නැමැති ආභරණය ඇතිවීම පිණිස ද වස්ත්‍ර දන් දෙති. ඍද්ධිවිධ ඥාණය ලැබීම පිණිස ද නිවන් සුව සමෘද්ධ වීම පිණිස ද පාවහන් සැරයටි ගමන් මලු කුඩ ආදී ගමන් උපකරණ ද යාන වාහන ද දන් දෙති.

එසේම සීල සුගන්ධය ලැබීම පිණිස සුවඳ වර්‍ග දන් දෙති. බුද්ධ ගුණ සෝභාව ලැබීම පිණිස මල් ද සුවඳ විලවුන් ද දන් දෙති. බෝධි මූලය ද වජිරාසනය ද තෘණ ඇතිරිය ද ලැබීම පිණිස ඇඳ පුටු ආදී ආසන දන් දෙති. එසේම තථාගත සෙය්‍යාව හෙවත් සිංහ සෙය්‍යාව ලැබීම පිණිස නින්දට අවශ්‍ය දේ දන් දෙති. ධර්‍මයෙහි සරණ පිහිට රැකවරණය ලැබීම පිණිස ආවාස දන් දෙති. **බුද්ධචක්‍ෂු[1] ධම්මචක්‍ෂු[2] දිබ්බචක්‍ෂු[3] ඥාණචක්‍ෂු[4] සමන්තචක්‍ෂු[5]** යන පඤ්ච විධ නුවණැස ලැබීම පිණිස පහන් දැල්වීම පිණිස තෙල්, තිර ආදී ආලෝක පූජාවට අවශ්‍ය දේ දන් දෙති.

ව්‍යාම ප්‍රභාව හෙවත් බුද්ධ රශ්මිය ලැබීම පිණිස රූප දානය දෙති. බ්‍රහ්ම ස්වරය ලැබීම පිණිස ශබ්ද දානය දෙති. සියලු ලෝක සත්ත්වයන්ට තමන් ප්‍රිය වීම පිණිස රස දානය දෙති. බුද්ධ සුකුමාල භාවය පිණිස (මෘදු මොලොක් අඟ පසඟ) ලැබීම පිණිස ස්පර්‍ශ දානය දෙති. ජරා මරණ නැති වනු පිණිස ඖෂධ දානය දෙති. ක්ලේශ දාසත්වයෙන් මිදෙනු පිණිස දාසයන් නිදහස් කරති. සද්ධර්‍මයෙහි විශේෂයෙන් පිහිටීම පිණිස නිවැරදි වූ ක්‍රීඩා රතියට අවශ්‍ය දේ දන්

---

[1] ආසයානුසය ඥාණය, ඉන්ද්‍රිය පරෝපරිය ඥාණය යන දෙක

[2] සෝවාන්, සකෘදගාමී, අනාගාමී මාර්‍ග තුන පිළිබඳ වූ ඥාණය

[3] අභිඥාවන් පිළිබඳ ඥාණය

[4] චතුරාර්‍ය්‍ය සත්‍යය පිළිබඳ ව සත්‍ය කෘත්‍ය කෘත වශයෙන් ඇති දෙළොස් ආකාර දර්‍ශනය

[5] ස්කන්ධ ධාතු ආයතනාදී වශයෙන් සංඛත අසංඛත සියල්ල පිළිබඳ ඥාණය

දෙති. සියලු සත්ත්වයන් ආයර්‍ය ජාතියෙහි[1] දී තම පුත්‍ර භාවයට පමුණුවනු පිණිස දූ පුතුන් දන් දෙති. සකල ලෝක සත්ත්වයන්ගෙන් ඉසුරුමත් බව අධිපති බව ලබනු පිණිස භාර්‍යාව දන් දෙති. දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණ සම්පත්තිය ලබනු පිණිස රන් රිදී මුතු මැණික් ආදිය දන් දෙති. අසූවක් අනු ව්‍යඤ්ජන සම්පත්තිය ලබනු පිණිස විවිධ වූ ආභරණ දන් දෙති.

එසේම සියලු ධර්‍ම අවබෝධය නම් වූ සද්ධර්‍ම භාණ්ඩාගාරය ලබනු පිණිස ධාන්‍යාගාර දන් දෙති. ධර්‍ම රාජ්‍ය සම්පත්තිය ලබනු පිණිස රාජ්‍ය දන් දෙති. ධ්‍යාන අභිඥා සම්පත්තීන් ලබනු පිණිස ආරාම උද්‍යාන පොකුණු වන ආදිය දන් දෙති. චක්‍ර ලක්‍ෂණයන්ගෙන් යුත් ශ්‍රී පාදයන් ගෙන් මහා බෝධි මණ්ඩලය වෙත එළඹීම පිණිස පාද දන් දෙති. සතර ඕඝයෙන් එතරවනු පිණිස ද සත්ත්වයන්ට සද්ධර්‍මය නම් වූ අණ දීම පිණිස ද අත් දන් දෙති.

ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන්ගේ ප්‍රතිලාභය පිණිස කන් නාසාදිය දන් දෙති. සර්‍වඥතාඥන ලබනු පිණිස ඇස් දන් දෙති. බුද්ධ ශරීරය දකින්නා වූ ද, බ්‍රහ්ම ස්වර විහිදුවා කරන්නා වූ ධර්‍මය අසන්නා වූ ද, බුදුගුණ සිහි කරන්නා වූ ද, උපස්ථාන කරන්නා වූ ද සියල්ලන්ට ම ප්‍රිය මනාප වූ හිත සුව පිණිස පවතින්නා වූ බුද්ධ ශරීරය ලබනු පිණිස ලේ මස් දන් දෙති. සියලු ලෝකයාට ම උතුම් වනු පිණිස උත්තම අංගය වූ හිස දන් දෙති.

මෙලෙස දන් දෙන්නා වූ මහා සත්ත්වයන් වහන්සේලා එක් විසි අන්වේසනයන්ට යට නොවී ගැති නොවී දන් දෙති. අනුන් පීඩාවට පත් නො කොට දන් දෙති. අනුන්ට භය නිසා නොදෙති. ලැජ්ජාව නිසා නොදෙති. දක්ෂිණාර්හ උතුමන්ට කිපී නොදෙති. ප්‍රණීත දෙය සඟවා කටුක දෙය නොදෙති. තමන් උසස් බව පෙන්වීමට නොදෙති. අනුන් පහත් කරනු පිණිස නොදෙති. විපාක ඵල බලාපොරොත්තුවෙන් නොදෙති. යාචකයන් පිළිකුල් කොට පහත් කොට සලකා නොදෙති. ආදර ගෞරව නැතිව නොදෙති.

[1]බුදු වන ආත්ම භාවයෙහි දී

මනාව සකස් කොට ම දන් දෙති. අනුන් ලවා නොදී සියතින් ම දෙති. සුදුසු කල්හි ම දෙති. ගරු කොට ම දෙති. බෙදීමක් තරාතිරමක් නොබලා සියල්ලන්ට ම දෙති. තුන් සිත පහදවාගෙන ම දෙති. දුන් දෙය කෙරෙහි පසුතැවිලි නොවෙති. ප්‍රතිග්‍රාහකයන් හා තමන් අතර මානයෙන් මැනීමක් නො කොට දෙති. ප්‍රතිග්‍රාහකයන්ට ප්‍රිය වචනයෙන් ම කථා කොට දෙති. යාචකයන් යාඥාවට (ඉල්ලීමට) සුදුසු වෙති. ආහාර දන් දෙන කල්හි වස්ත්‍රාදී පරිවාර වස්තු සමග දෙති. වස්ත්‍ර දෙන කල්හි ආහාර දනාදිය පිරිවර කොට දෙති. යානාදිය දෙන කල්හි එයට පරිවාර වස්තු සහිතවම දෙති.

තව ද රූප දනය දෙන කල්හි නිල් රතු කහ සුදු ආදී වර්ණයන්ගෙන් යුත් මල් වස්ත්‍රාදී වස්තූන් අතුරින් යමක් වේ ද, ඒවා රූප දනය දෙන්නෙමි යැයි සලකා දක්ෂිණාර්හයන් කෙරෙහි දෙති. ශබ්ද දනය වනාහි බෙර මිහිඟු බෙර ආදිය රත්නත්‍රයට උපකාර කිරීම් වශයෙන් "**මේ මාගේ ශබ්ද දනය**" යැයි සලකා වාදනය කරයි ද, ධර්ම කථිකයන්ට මිහිරි හඬ ඇතිවීම පිණිස තෙල් පැණි ආදිය ද අනෙකුත් ඖෂධයන් දෙයි ද, ධර්ම ශ්‍රවණය සඳහා කාල ඝෝෂා කරත් ද, උස් හඬින් පැහැදිලිව දේශනා කිරීමට ශබ්ද විකාශන යන්ත්‍රාදිය පූජා කරත් ද, ධර්ම දේශනා කරත් ද, ධර්ම සාකච්ඡා කරයි ද, අනුමෝදනා බණ කියත් ද, සජ්ඣායනා කරත් ද මේ ආදී සියල්ල **ශබ්ද දනය** නම් වේ.

ගන්ධ දනය වනාහි සුවඳ ඇති මුල් වර්ග, ගෙඩි වර්ග, මල් වර්ග, පොතු වර්ග, අරටු වර්ග, කොළ වර්ග ආදිය ද හඳුන්කූරු වැනි සකසන ලද දේවල් ද රත්නත්‍රය විෂයෙහි ගන්ධ දනය පූජා කරමි යැයි පරිත්‍යාග කරත් ද මේ සියල්ල **ගන්ධ දනය** නම් වේ.

එසේම රස ඇති මුල්, කොළ, ගෙඩි, පොතු, හර, මල් ආදිය ද, ධාන්‍ය වර්ග ද මාංශාදිය ද කිරි හා කිරි පිණිස දෙනුන් පූජා කරත් ද මේ සියල්ල **රස දනය** නම් වේ.

එසේම ඇඳ, පුටු, කොට්ට, මෙට්ට, ඇතිරිලි, පොරෝනා, වස්ත්‍ර, වහන්, විදුලි පංකා, වායු සමීකරණ උපකරණ ආදිය ස්පර්ශදනය දෙන්නෙමි යැයි ද දක්ෂිණාහීයන්ට පුදත් ද මෙය **ස්පර්ශ දනය** නම් වේ.

ධර්මදනය වනාහි ධර්මාරම්මණය අදහස් කළ බැවින් ඕජා දනය දෙන්නෙමි යැයි ගිතෙල්, තලතෙල්, හකුරු, පැණි, වෙඬරු, චතුමධුර ආදිය දෙයි ද, පාන දන වශයෙන් අඹ පැන් ආදී පාන වර්ග දන් දෙයි ද, ජීවිත දන වශයෙන් සලාක බත, පක්ෂ බත, උපෝසථ බත, පැලවිය බත පක්ෂ බත ආදී ලෙස දන් දෙයි ද, ලෙඩුන් වෙත වෙදුන් පමුණුවත් ද, මාළු දැල් කෙම් උගුල් ඉවත් කරවයි ද, පක්ෂීන් රඳවන කූඩු ඉවත් කරවයි ද, බන්ධන ගත සතුන් ඒ බන්ධනවලින් මුදා හරී ද, "**කිසිවෙකු නොනසව**" යි බෙර හසුරුවයි ද මෙලෙස සත්ත්වයන්ගේ ජීවිතාරක්ෂාව උදෙසා යම් යම් දේ කරයි ද කරවයි දමේ සියල්ල **ධර්ම දනය** නම් වේ.

මේ කියන ලද දනයන් සියල්ල සියලු සත්ත්වයන්ට හිත සුව පිණිස පිරිනමන ලද්දාහු වෙති. මේ සියල්ල සම්මා සම්බුද්ධත්වය ලැබීම පිණිස ක්‍ෂය නොවන්නා වූ **ඡන්ද චිත්ත විරිය විමංසා** ආදී ගුණයන්ට ද, ක්‍ෂය නොවන්නා වූ **ශ්‍රද්ධා** ආදී ඉන්ද්‍රියයන්ට ද හේතු වේ.

මේ දන පාරමිතාව පූර්ණය කරන්නා වූ මහා සත්ත්වයන් වහන්සේලා විසින් ජීවිතය පිළිබඳ ව අනිත්‍ය සංඥාව ඇති කර ගත යුතු ය. භෝග සම්පත් සියල්ලන්ට ම සාධාරණ බව මෙනෙහි කළ යුතු ය. සත්ත්වයන් කෙරෙහි කරුණාධ්‍යාශය උපදවා ගත යුතු ය. මෙසේ වස්තූන් හි සියලු ආකාර සාරය ගන්නා වූ මහා සත්ත්වයන් වහන්සේලා ගිනි ඇවිලගත් ගෙයකින් පිටතට ගත් වස්තුවක් මෙන් ඒ සියලු වස්තුවත් තමාත් පිටතට ගෙන කිසිවක් ඉතිරි නොකරති. කිසිවක් කෙරෙහි උස් පහත් භේදයක් නොකරති. ඒකාන්තයෙන් ම සියල්ල අපේක්ෂා රහිතව පරිත්‍යාග කරති. මේ වනාහි දන පාරමිතාවෙහි මහා සත්ත්වයන් වහන්සේලා ගේ ප්‍රතිපත්තිය යි.

# ❄ සීල පාරමිතාවේ ප්‍රතිපත්ති ක්‍රමය

සීලාලංකාරයෙන් සත්ත්වයන් සරසන්නට කැමති මහා සත්ත්වයන් වහන්සේලා විසින් ප්‍රථමයෙන් තමාගේ ම සීලය පිරිසිදු කළ යුතු ය. එහි සීලය පිරිසිදු වන ක්‍රම සතරකි. එනම් **"අධ්‍යාශ විශුද්ධිය, සමාදනය, නොයික්මවීම, ආයති සංවරය"** යනුයි.

1. විශුද්ධ (පිරිසිදු) අධ්‍යාශය (ප්‍රාර්ථනාව) හේතුවෙන් ඇතමෙක් පව පිළිකුල් කරමින් තමාගේ සිතෙහි කෙලෙස් හට ගැනීමට ලැජ්ජාව උපදවා පිරිසිදු පැවතුම් ඇත්තාහු වෙත් ද එය **අධ්‍යාශ විශුද්ධිය** නම් වේ.

2. ඇතැම් කෙනෙකු අනුන් වෙතින් සිල් සමාදන් ව, අන්‍යයන් තමාගේ යම් වරදක් දැක චෝදනා කරත් ද යැයි බිය ඇතිව පිරිසිදු පැවතුම් ඇත්තාහු වෙති. මෙය **සමාදනය** නම් වේ.

3. ඉහත කී දෙයාකාරයම සිහි කොට හිරි ඔත්තප්ප ධර්ම ඇතිව සීලය නො බිඳීම **නොයික්මවීම** නම් වේ.

4. සිහි මුලාවට පැමිණ යම් විටෙක සීලය බිඳෙත් ද එය සිහි කොට හිරි ඔත්තප්ප ධර්මයන්හි පිහිටා නැවත නොබිඳෙන ලෙස අධිෂ්ඨාන කොට ගෙන සීලය ප්‍රකෘතිමත් කරගැනීම **ආයති සංවරය** නම් වේ.

මෙලෙස පිහිටා ගන්නා ලද සීලය වාරිත්‍ර සීලය, චාරිත්‍ර සීලය යැයි ද්විධ වේ.

## ☸ වාරිත්‍ර සීලයෙහි ප්‍රතිපත්ති ක්‍රමය

භාග්‍යවතුන් වහන්සේ විසින් පනවා වදාළ සිකපදයන්හි **"වෙරමණී"** යනුවෙන් යමක් කය වචනය තුළින් නො කළ යුතු යැයි

පනවා වදාළ සේක් ද, එසේ වූ නොකළයුතු දෙයින් වැළකීම වාරිත්‍ර සීලය නම් වේ.

සීලය සම්පූර්ණ කර ගැනීමට ශ්‍රද්ධා දී ගුණයන්හි පිහිටා වත් පිළිවෙත් කිරීම වැඩිහිටි ගෞරවය ආදී වූ කළ යුතු දේ කිරීම චාරිත්‍ර සීලය නම් වේ.

එහි මහා බෝධිසත්ත්වයන් වහන්සේලාගේ චාරිත්‍ර සීලය මෙසේ ය. සියලු සත්ත්වයන් කෙරෙහි සිහිනයෙන් පවා ක්‍රෝධ සිතක් ඇති නොවීමට දයා සිතින් යුතුව විසිය යුතු වෙති. පරෝපකාරය කිරීම පිණිස පිළිපන් බැවින් අන්සතු දෙය පිළිබඳ ව සර්පයෙකු සේ සලකා ස්පර්ශ නො කළ යුතු වෙති. පැවිදි ව සිටින්නේ නම් සප්තවිධ මෛථුනයෙන් වැළකුණු බැවින් අබ්‍රහම චයර්‍යාවෙන් වෙන් වූවාහු වෙති. පරදාර සේවනය නොකරන්නාහු වෙති. ගිහිව සිටින්නේ නම් සැම කල්හි පව්ටු හැඟීමකුදු නූපදවති. කථා කරන විට ද සත්‍ය වූ හිත වූ ප්‍රිය වූ වචන ඇත්තාහු, ප්‍රමාණයෙන් යුක්තව දැහැමි කථා ඇත්තාහු වෙති. එය ද සුදුසු කල්හි ම කියති. හැම කල්හි ම දැඩි ලෝභ නැති ව්‍යාපාදයෙන් තොර වැරදි දර්ශනයෙන් තොර වූ කම්මස්සකථා ඥානයෙන් [1] යුක්තව මනා කොට නිවැරදි ප්‍රතිපදව ඇති අය කෙරෙහි පිහිටි ශ්‍රද්ධාවෙන් යුක්ත වූවාහු වෙති. මෙසේ සතර අපායට සංසාර දුකට මාර්ගය වූ අකුසල කර්ම පථයන්ගෙන් වැළකී අකුසල ධර්මයන්ගෙන් වැළකී ස්වර්ගයට නිවනට මාර්ගය වූ ප්‍රතිපදාවෙහි පිහිටියා වූ මහා පුරුෂයන් වහන්සේලා කෙරෙහි පිරිසිදු කාය වාක් පැවතුම් ඇති බැවින් ප්‍රාර්ථනා පරිදි සත්ත්වයන්ට හිත සැප එළවීම පිණිස වූ අධ්‍යාශය වහ වහා සමෘද්ධ වෙති. පාරමිතා ගුණය පිරෙති.

මෙසේ මහා බෝධිසත්ත්වයන් වහන්සේලා හිංසාවෙන් වැළකීම හේතුවෙන් සියලු සත්ත්වයන්ට අභයදානය දෙති. අපහසුවකින් තොරව මෛත්‍රී භාවනා සිත උපදවති. එකොළොස් වැදෑරුම් මෛත්‍රී ආනිශංස ලබති. අල්ප ආබාධ ඇත්තාහු වෙති. දීර්ඝායුෂ ඇතිව බොහෝ සැප ඇතිව මහා පුරුෂ ගුණ විශේෂයන්ට පැමිණෙති. ද්වේෂයෙන් තොරව වාසය කරති.

---

[1] මේ මේ කර්මයන්ගෙන් මේ මේ විපාක ලැබෙන්නේ ය යැයි දක්නා නුවණ

එසේම නුදුන් දෙය නො ගැනීම හෙවත් සොරකමින් වැළකීම හේතුවෙන් සොර සතුරන්ට පැහැර ගැනීමට නොහැකි සම්පත් ලබති. අනුන්ට සැක නූපදවන විශ්වාසවන්ත පැවතුම් ඇතිව ප්‍රිය මනාපව ධන සම්පත්තීන් කෙරෙහි ලෝභයෙන් නො ඇලුණු සිත් ඇතිව පරිත්‍යාගශීලී ව වාසය කරති.

අබ්‍රහ්මචර්‍යාවෙන් වැළකීම හේතුවෙන් වස්තු සම්පත් කෙරෙහි ලොල් නොවූයේ වෙති. ශාන්ත වූ කාය චිත්ත පැවතුම්වලින් යුක්ත වෙති. සත්ත්වයන්ට ප්‍රිය මනාප වෙති. සැක නොකළයුතු පැවතුම්වලින් යුක්ත වෙති. යහපත් කීර්තිය ඇති වෙති. ස්ත්‍රීන් කෙරෙහි නො ඇලුණු සිත් ඇත්තෝ වෙති. ලෝභී අදහස් නැතිව අත්හැරීම පිළිබඳ අදහස් ඇතිව ප්‍රතිපදාවෙහි යෙදෙන බැවින් මහා පුරුෂ විශේෂයන්[1] ලබති.

මුසාවාදයෙන් වැළකීම හේතුවෙන් සත්ත්වයන්ට උසස් වෙති. විශ්වාස කළ හැකි ඇදහිය යුතු වෙති. පිළිගත හැකි වචන ඇති වෙති. දෙවියන්ට ප්‍රිය වෙති. සුවඳවත් වූ මුඛයක් ඇති වෙති. හික්මුණු කාය වාක් සමාචාර (හැසිරීම) ඇති වෙති. මහා පුරුෂ ලක්‍ෂණ ඇති වෙති. වාසනා සහිත කෙලෙස් (කෙලෙස් පුරුදු) දුරු කිරීමට හැකි වෙති.

කේලාම් කීමෙන් වැළකීම තුළින් පරෝපක්‍රම හේතුවෙන් නොබිඳිය හැකි ශක්ති සම්පන්න ශරීර ඇති වෙති. නොබිඳිය හැකි පිරිස් ඇති වෙති. ධර්‍මය කෙරෙහි නොබිඳෙන ශ්‍රද්ධාවෙන් යුක්ත වෙති. වෙනස් නොවන මිත්‍ර සම්පත්තිය ඇති වෙති. භවයෙන් භවයට ඒකාන්ත වශයෙන් ප්‍රිය වූ මිත්‍රයන් ඇති වෙති.

ඵරුෂවචන කීමෙන් වැළකීම හේතුවෙන් සත්ත්වයන්ට ප්‍රිය මනාප වෙති. සැප විඳින්නෝ වෙති. මිහිරි වචන ඇත්තෝ වෙති. ගරු කළ යුතු වෙති. අෂ්ටාංග සමන්වාගත බ්‍රහ්ම ස්වරයෙන් යුක්ත වෙති.

---

[1] දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණ ආදී ශරීර සෝභාව

හිස් වචන කීමෙන් වැළකීමෙන් සත්ත්වයන්ට ප්‍රිය මනාප වෙති. ගරු කළ යුතු සම්භාවනා කළ යුතු වෙති. පිළිගත හැකි වචන ඇති වෙති. මහේශාක්‍ය මහානුභාව සම්පන්න වෙති. ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුක්ත වෙති. බුද්ධත්වයට පැමිණ එකම පාළි භාෂාවෙන් ධර්‍ම දේශනා කරන විට විවිධ වූ සත්ත්වයන්ට ඔවුනොවුන්ට වැටහෙන භාෂාවලින් ප්‍රශ්න විසඳ ගත හැකි වෙති.

අභිද්‍යාවෙන් වැළකීම හේතුවෙන් කැමති දෙය ලබති. උදාර වූ දෙය[1] කැමති ලෙස ලබති. ක්‍ෂත්‍රිය මහාසාරාදී උසස් කුලවතුන්ගෙන් ගෞරව ලබති. සතුරන්ට මැඩලීමට නොහැකි වෙති. විකල ඉන්ද්‍රිය නැත්තෝ වෙති. තමා හා සම වූයෙක් නැත්තේ වේ.

ව්‍යාපාදයෙන් දුරු වීමෙන් ප්‍රිය වූවාහු දකුම් කළු වෙති. සත්ත්වයන්ගේ සම්භාවනා ලබන්නෝ වෙති. අන්‍යයන්ගේ හිත සුව පිණිස කටයුතු කරන බැවින් නිරායාසයෙන් ම අනුන්ගේ පැහැදීම ඇති වෙති. දළදඬු ගති නැත්තෝ වෙති. මෛත්‍රියෙන් වාසය කරති. මහේශාක්‍ය ද මහානුභාව සම්පන්න ද වෙති.

මිථ්‍යා දෘෂ්ටියෙන් වැළකීමෙන් යහපත් මිත්‍රයන් ඇති වෙති. හිස සිඳීමට පැමිණියේ නමුත් අන්‍යයන්ට එය කළ නොහැකි වෙති. තමන් කරන කර්‍මයෙහි විපාක තමන්ට ම විඳීමට සිදුවන බව දන්නා නුවණින් යුක්ත බැවින් මිථ්‍යා විශ්වාස නැත්තෝ වෙති. ධර්‍මය කෙරෙහි බැස ගත් ස්ථිර ශ්‍රද්ධාවෙන් යුක්ත වෙති. තථාගත බෝධිය හෙවත් සම්මා සම්බුද්ධත්වය පිළිබඳ මනා සම්‍යක් දර්‍ශනයෙන් යුක්ත වෙති. හංස රාජයෙකු කසල ගොඩෙහි නො ඇලෙන්නා සේ මිථ්‍යා දෘෂ්ටියෙහි නො ඇලෙති. අනිත්‍යාදි ලක්‍ෂණ දැනීමෙහි සමර්‍ථ වෙති. පහසුවෙන් අනාවරණ ඥානය[2] ලැබීමට සමර්‍ථ වෙති. බුද්ධත්වය ලැබීම දක්වා යන ගමනෙහි දී උසස් තත්වයකට පත් වෙති. උදාර වූ සම්පත්තීන්ට පැමිණෙති.

මෙසේ සීලය වනාහි සියලු සම්පත්තීන්ට උතුම් පිහිට වේ. සියලු බුද්ධ ගුණයන් ලැබීමට උත්පත්ති ස්ථානය (මූල කාරණය) වේ.

---

[1] උසස් යැයි සම්මත වූ, ශ්‍රේෂ්ඨ යැයි පිළිගත් වස්තු ආදිය.

[2] ආවරණයක් නැති සියල්ල දන්නා ඥානය

දෙරටුව වේ. මෙසේ සීලය කෙරෙහි ගෞරව උපදවා **කාය වාක් සංවරය, ඉන්ද්‍රිය සංවරය, ආජීව පාරිශුද්ධිය, ප්‍රත්‍ය පරිභෝගය** යන මේ සියල්ල සිහිය නුවණ ඇතිව අප්‍රමාදී ව ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා යන මේවා මිතුරු බසින් පැමිණෙන සතුරන් සේ සලකා මනා කොට සීලය සම්පාදනය කළ යුතු ය. මේ වාරිත්‍ර සීලයෙහි ප්‍රතිපත්ති ක්‍රමය වේ.

## ☸ චාරිත්‍ර සීලයෙහි ප්‍රතිපත්ති ක්‍රමය

මේ ලෝකයෙහි මහා බෝසතාණන් වහන්සේලා ගරු කළ යුතු කල්‍යාණ මිත්‍රයන්ට කලින් කල සකසා වැඳීම දැක හුනස්නෙන් නැඟිටීම ඇඳිළි බැඳීම සුදුසු ලෙස කථා කිරීම උපස්ථාන කිරීම සිදු කරති. කලින් කල ගිලනුන්ට උපස්ථාන කරති. සුභාෂිත වචන අසා සාධුකාර දෙති. ගුණවතුන්ගේ ගුණ වර්ණනා කරන්නාහු වෙති. අනුන් කරන පින් අනුමෝදන් වෙති. තමන් කරන පින් සම්මා සම්බුද්ධත්වය ලැබීම පිණිස ප්‍රාර්ථනා වශයෙන් යොමු කරති. සැම කල්හි කුසල් කිරීමෙහි අප්‍රමාදී වෙති. තම කයින් වචනයෙන් වරදක් වූ කල්හි එය වරද වරද වශයෙන් දැක එක්ව වසන්නන්ට එය ඇතිලෙස ප්‍රකාශ කරති. ආයති සංවරයෙහි පිහිටා මත්තෙහි මනා කොට පිළිවෙත් පුරති. තමාට ගැලපෙන හිත මිත්‍ර අර්ථවත් ජීවිත ගත කරන සත්පුරුෂයන්ට මෙසේ කළ යුතු ය, මෙසේ නො කළ යුතු යැයි අවවාද අනුශාසනා කරමින් අනලස්ව සහය වෙති. සත්ත්වයන්ට රෝග දුක් පැමිණි කල්හි ඒවාට ගැලපෙන ලෙස පිළියම් කරති. ඤාති මිත්‍රාදීන්ට රෝග ව්‍යසන භෝග ව්‍යසන පැමිණි කල්හි එයින් නැගී සිටීමට ශෝක දුක් දුරුකර ගැනීමට උපකාර වෙති. වරදෙහි යෙදෙන්නන්ට ඒවායෙහි ආදීනව දක්වමින් වරදට නිග්‍රහ කොට ධර්මයෙහි පිහිටුවති. ධර්මයෙන් සංග්‍රහ කළ යුත්තන්ට සැම කල්හි ධර්මයෙන් සංග්‍රහ කරති.

එසේම පූර්වයෙහි මහා බෝසතාණන් වහන්සේලා ඉතා දුෂ්කර වූ උදාර පැවතුම් ඇතිව නොසිතිය හැකි ආනුභාව සම්පන්න ව

සත්ත්වයන්ට හිතසුව ගෙන දීම පිණිස පිළිපන්නාහු ද, එසේ වූ උත්තම හැසිරීම් ඇතිව මනා කොට බුද්ධ කාරක ධර්මයන් සම්පූර්ණ කරගන්නා ලද්දේ වෙත් ද, ඒ පිළිබඳ අසා දැන **"මට මෙසේ කළ නොහැකි යැයි"** උද්වේගයට පසුබැසීමට නොපැමිණ තැති නොගෙන **"ඒ මහා පුරුෂයෝ ද මිනිස්සුමය, ක්‍රමයෙන් ශික්ෂා සම්පූර්ණ කරමින් වැඩීගිය භාවනා ඇතියෝය. එබඳු උදාර වූ ආනුභාව සම්පත්තියෙන් යුක්තව පාරමී ධර්ම සම්පූර්ණ කළහ. එබැවින් මම ද එලෙස ම ශික්ෂා සම්පූර්ණ කළ යුතු ය. යම් ප්‍රතිපත්තියකින් මම ද පිළිවෙලින් ශික්ෂා සම්පූර්ණ කොට ඒකාන්තයෙන් ම ඒ බුදු පදවිය ලබන්නෙමි"** යැයි ශ්‍රද්ධාව උපදවා ගෙන වීර්‍ය්‍යය අත් නො හරිමින් මනා කොට සීලය සම්පූර්ණ කරති.

තව ද මහ බෝසතාණන් වහන්සේලා වනාහි සිතෙහි දියුණු කරගන්නා ලද උත්තරි මනුෂ්‍ය ධර්මයන් සඟවන සුළු වෙති. තමා තුළ ඇති අගුණ ප්‍රකට කරන සුළු වෙති. ලද දෙයින්, ලද පමණින් සතුටු වෙති. භාවනාවෙහි ඇලුණු සිතින් යුක්ත වෙති. දුක් ඉවසන්නාහු වෙති. තැති නොගන්නා ස්වභාවයෙන් යුක්ත වෙති. උඩඟු නොවෙති. උස් වූ මානය නැත්තෝ වෙති. සන්සුන් ඉඳුරන් ඇති ශාන්ත සිත් ඇත්තෝ වෙති. කුහනා ලපනා දී මිථ්‍යා පැවතුම් නැත්තෝ වෙති. යහපත් වූ ආචාර ගෝචර භාවයෙන් යුක්තව කුඩා වරදෙහි ද බිය දක්නා සුළුව මනා කොට සීලය සම්පූර්ණ කරති. පටන් ගන්නා ලද අත් නොහරින වීර්‍ය්‍යය ඇත්තෝ වෙති. අත්හරින ලද ජීවිත ආශාව ඇත්තෝ වෙති.

දුස්සීල භාවයට හේතු වූ ක්‍රෝධ උපනාහ ආදී පාප ධර්ම දුරු කරති. ස්වල්ප මාත්‍ර වූ ද විශේෂාධිගමයකින් සතුටු නොවෙති. මතු ලැබිය යුතු විශේෂාධිගමයන් පිණිස උත්සාහ ඇති වෙති. තව ද මහා පුරුෂයන් වහන්සේලා අඳ ගොළු බිහිරි අංගවිකලාදී අභාග්‍ය සම්පන්න වූවන්ට සුදුසු ලෙස සත්කාර කරති. අත් පා අහිමි වූ කොර වූ අයට යාන වාහන හෝ පුටු ආදිය දන් දෙති. එසේම උසුලා ගෙන යති. තව ද ශ්‍රද්ධාව නැතියවූන් ශ්‍රද්ධාවෙහි පිහිට වනු පිණිස ද, අලස වූවන් වීර්‍ය්‍යයෙහි පිහිට වනු පිණිස ද, මුලා වූවන් සිහියෙහි පිහිට වනු

පිණිස ද, භ්‍රාන්ත වූ සිත් ඇත්තවුන් සමාධියෙහි පිහිට වනු පිණිස ද, දුෂ්ප්‍රාඥ වූවන් ප්‍රඥවෙහි පිහිට වනු පිණිස ද උත්සාහවත් වෙති.

එසේම කාමච්ඡන්ද දී නීවරණයන්ගෙන් මැඩුණවුන් ඒවායෙන් නැගී සිටවනු පිණිස ද, කාම විතර්කාදී පාප විතර්ක ඇතියවුන් එම මිථ්‍යාවන්ගෙන් අත මුදවනු පිණිස ද උත්සාහවත් වෙති. එසේම පෙර උපකාර කළවුන්ට ප්‍රථමයෙන් කථා කොට ප්‍රිය වචන ඇතිව සංග්‍රහ කරති. කළ උපකාරයන්ට සමානව හෝ අධික ව හෝ උපකාර කරති. විපතක් වූ විට සහය වෙති. ඒ ඒ සත්ත්වයන්ගේ ඇතතා වූ ස්වභාවයන් දැන ඒ අනුව උපකාර වෙති. ඒ සියල්ල අකුසලයෙන් නගා සිටුවා කුසල ධර්මයන්හි පිහිටුවීම් වශයෙන් ම කරති.

අන්‍යයන්ගේ සිත් ගුණ ධර්මයන්හි පිහිටා ආරක්ෂා කරවීම් වශයෙන් උපකාර වීම සැමවිටම මහා බෝධිසත්ත්වයන් වහන්සේලාගේ කුසලාභිවෘද්ධිය පිණිස ම වෙති. එසේ යහපත් අදහස් ඇතිව වූව ද අන්‍යයන්ට හිංසා පීඩා නො කළ යුතු ය. කුකස් නූපදවිය යුතු ය. නිග්‍රහ කළ යුතු තැන්හි දී චෝදනා නො කළ යුතු ය. ඉතා පහත් ලෙස හැසිරීම් ඇත්තවුන් හමුවෙහි දී තමන් උසස් තැන තබා නො හැසිරිය යුතු ය. සියලු ආකාරයෙන් අන්‍යයන් ඇසුරු නොකරන්නෙකු නොවිය යුතු ය. නොකල්හි අන්‍යයන් සේවනය නො කළ යුතු ය. ඇසුරු කරන්නන් ද කාලයට ප්‍රදේශයට අනුව පමණ දැන ඇසුර පැවැත්විය යුතු ය. අන්‍යයන් ඉදිරියෙහි ප්‍රියයන්ට ගර්හා නො කළ යුතු ය. අප්‍රියයන්ට ප්‍රශංසා නො කළ යුතු ය. විශ්වාසය අත්හැර නො දැමිය යුතු ය. කවරෙකු ගේ වූව ද ධාර්මික ආරාධනා ප්‍රතික්ෂේප නො කළ යුතු ය. ඉල්ලා කිසිවක් නොගත යුතු ය. ප්‍රමාණය ඉක්මවා අධික ව අවශ්‍ය දේ වූව ද පිළි නොගත යුතු ය. ශ්‍රද්ධා වීර්‍ය්‍යය සති සමාධි ප්‍රඥ ගුණ ඇත්තවුන්ට ඒ ඒ ගුණ ආනිශංස කථා කීමෙන් අතිශයින් සතුටු කරවිට යුතු ය.

තව ද මහා බෝධිසත්ත්වයන් වහන්සේලා අභිඥ විශේෂයන් දියුණු කර ඇති අවස්ථාවන්හි දී ප්‍රමාදයට පත් සත්ත්වයන්ට එම අභිඥ බලයෙන් නිරය දුක් ආදිය දක්වා සංවේගයට පමුණුවා ශ්‍රද්ධාව

වීර්‍ය්‍යය සතිය සමාධිය ප්‍රඥාව යන ගුණ නැතියවුන් ඒ ඒ ධර්‍මයන්හි පිහිටුවති. ශ්‍රද්ධා දී ගුණ ඇතියවුන්ගේ ඒ ගුණ මුහු කරවති. මෙසේ චාරිත්‍ර සීලයෙහි පිහිටි මහා බෝසතාණන් වහන්සේලාගේ චාරිත්‍රමය වූ අප්‍රමාණ පුණ්‍යස්කන්ධ කුසලස්කන්ධ දියුණු වෙති.

මෙසේ සීලය පාරමිතාවක් වශයෙන් ප්‍රගුණ කරන මහා බෝධිසත්ත්වයන් වහන්සේලා ඒ සීලස්කන්ධ පුණ්‍යස්කන්ධ දියුණු කිරීමෙන් දුගතියෙන් මිදීම සුගතියෙහි රාජ්‍ය සම්පත්තිය, චක්‍රවර්ති රාජ්‍ය සම්පත්තිය, ශක්‍ර දේවේන්ද්‍ර සම්පත්තිය, දෙවු සැප සම්පත්, මාර සම්පත්, බ්‍රහ්ම සම්පත් බලාපොරොත්තු නොවෙති. ඒ සීල ගුණයෙන් ත්‍රි විද්‍යා ෂඩ් අභිඥා චතු ප්‍රතිසම්භිධා ශ්‍රාවක බෝධිය පසේ බුදු බව බලාපොරොත්තු නොවෙති. සියලු සත්ත්වයන් සීලාලංකාරයෙන් සරසනු පිණිස සර්‍වඥතාඥාන ඥානාවබෝධයෙන් සම්මා සම්බුද්ධත්වය ම බලාපොරොත්තු වෙති. ප්‍රාර්‍ථනා කරති. මේ සීල පාරමිතාවෙහි ප්‍රතිපත්ති ක්‍රමයයි.

## ❄ නෛෂ්ක්‍රම්‍ය පාරමිතාවේ ප්‍රතිපත්ති ක්‍රමය

කරුණාව හා උපාය කෞශල්‍ය ඥානයෙන් යුක්ත වූ කාම සම්පත්ති හා භවයෙහි ආදීනව දකීමෙන් යුක්ත වූ ඒ සියල්ලෙන් නික්මීම වෙන්වීම පිණිස හටගන්නා වූ කුසල චිත්තය නෛෂ්ක්‍රම්‍යය පාරමිතාව නම් වේ.

සියලු කෙලෙස් ධර්‍මයන්ට වාසස්ථාන වූ හෙයින් ද අඹු දරු ආදීන්ගෙන් මහත් ගැහැට ඇති බැවින් ද, ගොවිතැන් වෙළඳම් ආදී විවිධ වූ කර්‍මාන්ත කිරීමෙන් ව්‍යාකුල වන බැවින් ද, ගිහිගෙයි වාසය නෛෂ්ක්‍රම්‍යයට අවකාශ නැති තැනක් යැයි සැලකිය යුතු ය. කඩු මුවහතෙහි ගල්වන ලද මී පැණි බිඳුවක් ලෙවීමක් බඳු වූ හෙයින් ද, බොහෝ අවැඩ ගෙන දෙන බැවින් ද, විදුලි ආලෝකයෙන් නැටුමක් දකීමක් මෙන් ද කාමයන් හි අල්ප ආශ්වාද ඇති බව සැලකිය යුතු ය. උමතු වූවෙකු පැළඳගෙන ඇති ආභරණ ඔහුට හඳුනාගත නො

හැක්කා සේ විපරිත සිතින් අනුභව කළ යුතු ය. මළ මුත්‍රාදී අසූචි සැඟවීමෙන් ලැබෙන සුවයක් මෙන් නැවත පිළියම් කළ යුතු ය. ඇඟිල්ලෙන් ජලය ගෙන පානය කිරීමක් බඳු බැවින් තෘප්තියකට නොපැමිණේ. කුස ගින්නෙන් පීඩිත ව සිට අනුභව කළ භෝජනයක් මෙන් ආබාධ සහිතය. බිලී කොක්කෙහි අමුණන ලද ඇමක් මෙන් විපත් ගෙන දේ. ගින්නෙන් තැවීමක් මෙන් අතීත අනාගත වර්‍තමාන කාලත්‍රයෙහි ම දුක් හට ගැනීමට හේතු වේ. වඳුරු ආලේපයක් (ලාටුවක්) මෙන් බන්ධන ඇතිවීමට හේතු වේ. ඝාතකයන් විසින් වසන ලද ලාපත් මෙන් අනර්‍ථයන් සඟවන්නේ වේ. සතුරන් වසන ගමක විසීමක් මෙන් භය ගෙන දෙන්නේ වේ. සතුරන් පෝෂණය කරන්නෙකු මෙන් කාම වස්තූන් ක්ලේශ මාරාදීන්ට ගොදුරු වේ. උත්සව සම්පත්තියක් මෙන් පරිවර්‍තනය වීමෙන් දුක් සහිත වේ. බෙනයක හටගත් ගින්නක් මෙන් ආධ්‍යාත්මය දවන්නේ වේ. බිරණ [1] (බෙරුතණ හෙවත් සැවැන්න) නම් වැල් ගොනුවක බැඳි මී වදයක් මෙන් නොයෙක් පීඩා ඇත්තේ වේ. ලුණු දිය පානය කිරීමක් මෙන් පිපාසයට හේතු වේ. මහමෙර (සුරා) පානය කිරීමක් මෙන් හීන ජනයන් පරිභෝග කරන්නක් වේ.

අල්ප වූ ආස්වාද ඇති බැවින් මස් නැති ඇට කැබැල්ලකට සමාන වේ. මෙසේ බොහෝ ආදීනව ඇති බව සිහිකට යුතු ය. මෙසේ කාමයන් හි ආදීනව සලකා අනතුරුව නෛෂ්ක්‍රම්‍යයෙහි ආනිශංස සැලකිය යුතු ය. එය වනාහි **නෛෂ්ක්‍රම්‍යය සැපය** (අත්හැරීම), **පවිවේක සැපය** (භාවනාව), **උප සම සැපය** (කෙලෙස් සන්සිඳවීම) ආදී සැපයන්හි නැඹුරු වූ යම් සුවයක් වේ ද, ඒ සියල්ල පැවිද්ද මුල්කොට ඇත්තේ ය. එබැවින් පළමු ව පැවිදි විය යුතු ය. එසේ පැවිද්ද ලබන්නා වූ මහා සත්ත්වයන් වහන්සේලා බුද්ධ ශාසනයක් ලොව නැති කලෙක නම් කර්‍මවාදී හා ක්‍රියාවාදී [2] තාපස හෝ පරිබ්‍රාජක (බුදු සසුනෙන් බැහැර) පැවිද්දෙන් පැවිදි විය යුතු ය. බුද්ධෝත්පාද ඇති කලෙක වනාහි මිනිසත් බව ලබා සිටියේ වේ නම්

---

[1] බෙරුතණ විස සහිත බැවින් පැහීමෙන් බොහෝ දුක් ඇති වේ. යන ගමන පවා යා හැකි නොවේ.
[2] කර්‍ම විපාක විශ්වාස කරන

ඒ බුදු සසුනෙහි පැවිදි විය යුතු ය. ඉහත කියන ලද ලෙසින් සීලයෙහි පිහිටා ඒ සීලය පිරිසිදු කිරීම පිණිස ධුතාංග ගුණ සමාදන් ව රැකිය යුතු ය. එසේ ධුතාංග පූර්‍ණයෙහි යෙදී **අල්පේච්ඡතාව** (ලද දෙයින් සතුටු වීම), **සන්තුට්ඨිතාව** (ලද පමණින් සතුටු වීම), **පවිවේකතාව** (භාවනාවෙහි යෙදීම), **සල්ලේඛතාව** (සැහැල්ලු පැවතුම් ඇති බව), **අසංසග්ගතාව** (පිරිසෙහි සිත් නො ඇලීම), **විරියාරම්භතාව** (ඇරඹූ වීයර්‍ය ඇති බව), **සුභරතාව** (පහසුවෙන් පෝෂණය කළ හැකි බව) ආදී ගුණ පුහුණු කරමින් මනා කොට සීලය සම්පූර්‍ණ කර හික්මුණු දමුණු සන්සිඳුණු කාය වාක් සමාචාර (හැසිරීම) ඇතිව ඉතරීතර චීවර, ඉතරීතර පිණ්ඩපාත, ඉතරීතර සේනාසන යන අරියවංස ධර්‍මයන්හි පිහිටා භාවනාරාමතාවය නම් වූ සතර වන අරියවංසය ලබනු පිණිස සම සතළිස් කර්‍මස්ථාන අරමුණුවලින් උපචාර අපර්‍ණා සමාධි උපදවා ධ්‍යාන ලාභීව වාසය කරති. මෙලෙස මහා සත්ත්වයන් වහන්සේලා මනා කොට නෛෂ්ක්‍රම්‍යය පාරමිතාව සම්පූර්‍ණ කරති. මේ වනාහි මහා බෝධිසත්ත්වයන් වහන්සේලාගේ නෛෂ්ක්‍රම්‍යය පාරමිතාවෙහි ප්‍රතිපත්ති ක්‍රමයයි.

තව ද මජ්ඣිමනිකාය අට්ඨකථාවේ සටීකාර සූත්‍ර වර්‍ණනාවෙහි මෙසේ දැක්වේ.

**"බොධිසත්තා හි බුද්ධානං සම්මුඛෙ පබ්බජන්ති. පබ්බජිත්වා ච පන ඉත්තරසත්තා විය පතිතසිඞ්ගා න හොන්ති, චතුපාරිසුද්ධිසීලෙ පන සුපතිට්ඨාය තෙපිටකං බුද්ධවචනං උග්ගණ්හිත්වා තෙරස ධුතඞ්ගානි සමාදය අරඤ්ඤං පවිසිත්වා ගතපච්චාගතවත්තං පූරයමානා සමණධම්මං කරොන්තා විපස්සනං වඩ්ඪෙත්වා යාව අනුලොමඤාණං ආහච්ච තිට්ඨන්ති, මග්ගඵලත්ථං වායාමං න කරොන්ති".**

මහ බෝසතාණන් වහන්සේලා වනාහි සම්මා සම්බුදු රජාණන් වහන්සේලා සම්මුඛයෙහි පැවිදි වෙති. පැවිදි වී ද, අන් පැවිද්දන් සේ අං හැලිච්ච ගෝන මුව සත්ත්වයන් මෙන් නොවෙති. (අං හැලිච්ච ගෝන මුව ආදී වන සතුන්ට අන් දරුණු සත්ත්වයන්ගෙන් වන අනතුරු ආදියෙන් ආරක්‍ෂා වීමට අං ඇති

ඨලෙහි නායක සතුන් ගේ ඨකවරණය හැර අන් පිහිටක් නැත. බුද්ධ ශාසනයෙහි පැවිදි වූ බොහෝ පැවිද්දන්ට ද ධම් ඥනයෙන් ප්‍රතිපත්ති ඥනයෙන් අගතැන්පත් මහ බෝසතාණන් වහන්සේලා ගේ පිහිට හැර අන් පිහිටක් නැත.) මහ බෝසතාණන් වහන්සේලා වනාහි චතු පාරිශුද්ධි සීලයෙහි මනාව පිහිටාගෙන ත්‍රිපිටක බුද්ධ වචනය පරිපූණිව ඉගෙන ගෙන තෙළෙස් ධුතාංග ගුණයන් සමාදන් ව ගෙන ආරණ්‍යයට පිවිස ගත පච්චාගත වත පුරමින් ශ්‍රමණ කෘත්‍යයන් සම්පාදනය කරන්නේ අනුලෝම ඤණය දක්වා විපස්සනා භාවනාව දියුණු කරති. මාගී ඵල නිවීාණ ය පිණිස උත්සාහවත් නොවෙති.

## ❄ ප්‍රඥා පාරමිතාවෙහි ප්‍රතිපත්ති ක්‍රමය

ප්‍රඥා පාරමිතාව සම්පාදනය කිරීමට කැමති වන්නවුන් විසින් අන්ධකාරය සමග නොපවතින්නා වූ ආලෝකයක් මෙන් ප්‍රඥාව මෝහය සමග නොපවතින බව සිහිකට යුතු ය. එබැවින් මහ බෝසතාණන් වහන්සේලා විසින් ප්‍රථමයෙන් මෝහයට හේතු වූ කරුණු දුරු කළ යුත්තාහ. එය මෙසේ කළ යුතු ය.

මෝහය වනාහි කුසල ධමීයන්හි නො ඇලීම, කුසල ක්‍රියාවන්හි හැකිළෙන (මැලි) බව, විජම්භිකා (අලස බව), පිරිසෙහි ඇලුණු සිත් ඇති බව, නිදන සුළු බව, නිෂ්චය නැති (ස්ථිර අදහස් නැති) බව, ඥනයෙහි කුතුහලයෙන් (විමසිලිමත් බැවින් තොර නුවණ) තොර බව, මිථ්‍යා මානය, නො විමසා කථා කරන බව, මනාව කය පිළිදැගුම් නොකිරීම, එකඟ සිත් නැති බව, අඥන පුද්ගලයන් සේවනය කිරීම, ප්‍රඥවන්ත පුද්ගලයන් සේවනය නොකිරීම, තමාව අවඥ කිරීම, මිථ්‍යා විකල්ප (අසත්‍ය විශ්වාස) ඇති බව, විපරීත ආශා (අධමී රාග) ඇති බව, දළදඬු වූ කායික පැවතුම් ඇති බව, සංවේග නැති බව, නීවරණ ඇසුරු කරන බව, මෙලෙස යම් ධමීයක් ඇසුරු කිරීමෙන් නූපන් ප්‍රඥව නූපදී ද, උපන් ප්‍රඥව පිරිහේ ද මේසේ වූ

මෝහයට හේතු වූ කාරණාවන් දුරු කිරීමට බහුශ්‍රැත භාවය හා ධ්‍යාන වැඩීම කළ යුත්තාහ. මේ එහි බහුශ්‍රැත භාවය ලැබීමේ හේතුවයි.

පඤ්චස්කන්ධය, දෙළොස් ආයතන, අටලොස් ධාතූන්, ආය්‍යා සත්‍ය සතර, දෙවිසි ඉන්ද්‍රිය, පටිච්ච සමුප්පාදංග දෙළොස, සතර සතිපට්ඨාන, සතර සෘද්ධිපාද, සතර සම්‍යප්‍රධාන, පඤ්ච ඉන්ද්‍රිය, පඤ්ච බල, සප්ත බොජ්ඣංග, ආය්‍යා අෂ්ටාංගික මාර්‍ගය ආදී කුසල ප්‍රභේදයෝ ද, ලොව යම් නිවැරදි විද්‍යාස්ථාන වේ ද ඒවා ද, සත්ත්වයන්ට හිතසුව පිණිස හේතුවන අවබෝධයට හේතුවන ව්‍යාකරණ විශේෂයෝ ද යනාදි ප්‍රඥාව වැඩීමට හේතුවන උපාය කෞෂල්‍ය ඥානයෙන් යුතුව සිහියෙන් වීය්‍යායෙන් යුතුව මනා කොට ඉගෙනීම ඇසීම හැදෑරීම නැවත විචාරීම ආදී ක්‍රමවලින් දැන ඉගෙන ඒ තමා උගත් ධර්‍මයන්හි අන්‍යයන් ද පිහිටුවා ශ්‍රැතමය ප්‍රඥාව නිපදවිය යුතු ය. වැඩිය යුතු ය.

එසේම මහා බෝධිසත්ත්වයන් වහන්සේලා විසින් කරුණා පෙරදැරිව තමන් දැන උගත් විද්‍යා ශිල්පාදියෙන් අන්‍යයන්ගේ යහපත උදෙසා වැඩ කළ යුතු ය. ඒවා අන්‍යයන්ට ද පුහුණු කරවිය යුතු ය. තමන්ගේ ස්ථානෝචිත ප්‍රඥාවෙන් අනුන්ගේ යහපත සිදුකළ යුතු ය. තමන් දැන උගත් ධර්‍මයන් අන්‍යයන්ට කියා දිය යුතු ය. ධ්‍යාන භාවනා විපස්සනා භාවනා අන්‍යයන්ට පුහුණු කරවිය යුතු ය.

එසේම පඤ්චස්කන්ධාදී පරමාර්‍ථ ධර්‍මයන්ගේ ඇත්තා වූ ස්වභාවයන් දැන තම නුවණින් විමසා චින්තාමය ඤාණය දියුණු කළ යුතු ය.

එසේම ස්කන්ධ ධාතු ආයතනාදීන්ගේ ලක්‍ෂණ හා සාමාන්‍ය ලක්‍ෂණ විමසීම් වශයෙන් ලෞකික ප්‍රඥාව ඉපදවීමට පූර්‍ව භාග භාවනාව වැඩිය යුතු ය. ඒ ස්කන්ධ දී ධර්‍මයන්හි අනිත්‍යාදී ලක්‍ෂණ ආධ්‍යාත්මික බාහිර වශයෙන් ඉතිරි නො කොට දැන ශරීරාලය හැර අන්‍යයන් ද එහි යොදවමින් කරුණා පෙරදැරිව අන්‍යයන්ගේ යහපත මුල්කොට සිදුකරමින් බුද්ධ ගුණ වර්‍ධනය කරමින් ධ්‍යාන සමාධි

සමාපත්ති විමෝක්‍ෂ අභිඥ ගුණ වඩමින් ඒවා මුදුන්පත් කර ගත යුතු ය.

තව ද සෘද්ධිවිධ ඥාණ, දිබ්බසෝත ඥාණ, පරසිත් දන්නා නුවණ, පෙර විසූ ආත්ම දන්නා නුවණ, සත්ත්වයන්ගේ චුති උත්පත්ති දන්නා නුවණ, යථා කම්මූපග ඥනය[1], අනාගතංශ ඥනය ආදී ලෞකික ඥනයන් පුරුදු කරමින් භාවනාමය ප්‍රඥව දියුණු කොට ස්කන්ධ ධාතු ආයතනාදිය ඉගෙනීම විමසීම කොට මූලික ව සීල විශුද්ධි, චිත්ත විශුද්ධි දෙකෙහි පිහිටා දිට්ඨි විශුද්ධි, කංකාවිතරණ විශුද්ධි, මග්ගාමග්ග ඥාණදස්සන විශුද්ධි, ප්‍රතිපද ඥාණදස්සන විශුද්ධි, ඥාණදස්සන විශුද්ධි යන පඤ්ච විධ විශුද්ධීන් වඩමින් ලෞකික ලෝකෝත්තර ප්‍රඥව වැඩිය යුතු ය. මේ ප්‍රඥ පාරමිතාවෙහි ප්‍රතිපත්ති ක්‍රමයයි.

## ❄ වීර්‍ය්‍යය පාරමිතාවෙහි ප්‍රතිපත්ති ක්‍රමය

සම්‍යක් සම්බෝධිය ලැබීම සඳහා ප්‍රාර්‍ථනා ඇති මහා සත්ත්වයන් වහන්සේලා විසින් පාරමිතා ධර්‍ම සම්පූර්‍ණ කිරීම සඳහා සියලු පාරමී කාලය ඒ සඳහා යෙදවිය යුතු බැවින් කලින් කල "**මා විසින් අද කවර නම් පුණ්‍ය සම්භාරයක් ඥාණ සම්භාරයක් රැස් කරන ලද්දේ ද, මා විසින් අද දවසේ කවර පරාර්‍ථයක් කරන ලද්දේ ද**" යැයි දවසක් දවසක් පාසා ප්‍රත්‍යවේක්‍ෂා කොට බලා සත්ත්වයන්ට හිතසුව සැකසීම පිණිස උත්සාහ කළ යුතු ය. සියලු සත්ත්වයන්ට උපකාර පිණිස තමා සතු වස්තුව කාය ජීවිත නිරපේක්‍ෂකව පරිත්‍යාග කළ යුතු ය. කයින් වචනයෙන් යම් කර්‍මයක් කරත් ද, ඒ සියල්ල සම්මා සම්බුද්ධත්වයට නැඹුරු වූ සිතින් ම කළ යුතු ය. සත්ත්වයන් උතුම් කොට සලකන කාමයන්ගෙන් වෙන් වූ සිතින් වාසය කළ යුතු ය. මෙසේ කළ යුතු ය, මෙසේ පිළිපැදිය යුතු ය යැයි, සියලු කෘත්‍යයන්

[1] කර්‍ම විපාක දන්නා ඥනය

හි උපාය කෞශල්‍ය ඥානයෙන් යුතුව පිළිපැදිය යුතු ය. ඒ ඒ සත්ත්වයන්ට හිතසුව පිණිස වූ කාය්‍යායන් හි පටන් ගත් වීය්‍යාය ඇතිවිය යුතු ය. ඉෂ්ටානිෂ්ට සියල්ල ඉවසීමෙන් යුතුව අවිහිංසාවාදී සියලු සත්ත්වයන් කෙරෙහි සීමාවක් නො කොට මෛත්‍රිය කරුණාව පැතිර විය යුතු ය.

සත්ත්වයන්ට යම් යම් දුක් පැමිණෙත් ද, ඒ සියල්ල තමා කෙරෙහි කැමති විය යුතු ය. සියලු සත්ත්වයන්ගේ පින් තමන් ද අනුමෝදන් විය යුතු ය. බුදුරජාණන් වහන්සේලාගේ මහානුභාව සම්පත්තිය නිතර සිහි කළ යුතු ය. කාය වාක් කර්‍ම සියල්ල බුද්ධත්වය උදෙසා යොමු කරමින් කළ යුතු ය. මේ ක්‍රමයෙන් යුතු මහා සත්ත්වයන් වහන්සේලා දනාදී සියලු කුසල ධර්‍ම ශක්තිමත් ව දැඩි වීය්‍යාය ඇතිව දිනක් පාසා සිදු කරමින් අප්‍රමාණ වූ පුණ්‍ය සම්භාරයන් ද ඥාණ සම්භාරයන් ද රැස් කරන්නාහ.

තව ද සත්ත්වයන්ට පරිභෝග පිණිස පැවැත්ම පිණිස තම ශරීරය හා ජීවිතය පරිත්‍යාග කොට බඩගිනි, පිපාස, ශීත, උෂ්ණ, අව්ව, වැස්ස, සුළඟ ආදී දුක් වලට පිළියම් සෙවිය යුතු ය. ඒවා සැපයිය යුතු ය. එසේ පරහිත ප්‍රතිපත්තියෙහි හැසිරීම හේතු කොට එහි විපාක ඵල වශයෙන් උපන් යම් සැපයක් තමා විඳිත් ද සිත්කලු ආරාම, උද්‍යාන, ප්‍රාසාද, පොකුණු, ආරණ්‍යා දී සියල්ල සිතට කයට තැවීමක් පීඩාවක් නැති නිවුණු ආත්මභාව ඇතිව සැපයට පැමිණෙති. පසේ බුදු රජාණන් වහන්සේලා හා බුද්ධ ශාසනයෙහි පිහිට ලැබූ ශෛක්‍ෂ අශෛක්‍ෂ උතුමන් වහන්සේලා තමා ලැබූ උතුම් ධර්‍ම සුවය අන්‍යයන් ද ලබත්වා යි සියලු සත්ත්වයන් කෙරෙහි මෛත්‍රී කරුණා පූර්‍වකව සිතති. මහා බෝධිසත්ත්වයන් වහන්සේලා ප්‍රථම අභිනීහාරයෙහි පටන් බුද්ධත්වයට පැමිණීම දක්වා ම සියලු සත්ත්වයන් කෙරෙහි එසේ බලාපොරොත්තු වෙති. ප්‍රාර්‍ථනා කරති.

එසේම කෙලෙසුන්ගෙන් මුලාවට පැමිණ තිදෙරින් අකුසල් කොට තිරිසන් අපායට වැටී අපමණ දුක් විඳින සත්ත්වයන් ද, නිජ්ඣාමතණ්හික ක්ප්පිපාසකා දී ප්‍රේත අපායට වැටී අපමණ දුක් විඳින සත්ත්වයන් ද, කාලකඤ්ජික ලෝකාන්තරික ආදී අසුර අපායට

වැටී අපමණ දුක් විඳින සත්ත්වයන් ද, **සඤ්ජීව, කාල සූත්‍ර, සංඝාත, රෞරව, මහා රෞරව, තාපය, ප්‍රතාපය, අවීචිය** යන මහා නරකයන්ට වැටී අපමණ දුක් විඳින සත්ත්වයන් ද විඳින අපමණ දුක් දැක මහත් වූ සංවේගයට පැමිණ මහත් වූ මෛත්‍රී කරුණාව පැතිර විය යුතු ය.

එසේම මනුලොව ඇති ජාති ජරා ව්‍යාධි මරණ බඩගිනි පිපාසා අව්ව වැස්ස සුළඟ මනුෂ්‍ය අමනුෂ්‍යාදීන්ගෙන් පැමිණෙන අපමණ දුක් විඳින සත්ත්වයන් ද, දෙව් ලොව බඹ ලොව දුක් විඳින සත්ත්වයන් ද දැක ඔවුන් එම දුක් වලින් මිදවීමේ අදහස ප්‍රාර්ථනාව ඇතිව මෛත්‍රිය කරුණාව පැතිර විය යුතු ය. මෙසේ කයින් වචනයෙන් මනසින් නිරතුරුව බෝධි සම්භාර ධර්මයන් රැස් කරමින් පාරමිතාවන් පිරීමට පැමිණෙත් ද එලෙසට සකස් කොට නොමැලිව උත්සහය පැවැත්විය යුතු ය.

තවද නොසිතිය හැක්කා වූ, අප්‍රමාණ වූ, විපුල වූ උදර වූ, නිර්මල වූ, උපක්ලේශයන්ගෙන් තොර වූ ගුණ සමූහයට නිදාන වූ බුද්ධත්වය සඳහා උත්සාහ ඇතිව සතුටු වීමට සමත් වීයර්‍යය වනාහි නොසිතිය හැකි ආනුභා ඇත්තේ ය. එය බොහෝ දෙනාට අසන්නට නොහැකි පිළිගැනීමට නොහැකි විස්මය දනවන්නකි. එසේ ඇති කල්හි එබඳු වීයර්‍යයකින් යුක්තව පිළිවෙත් පිරීම ගැන කියනු ම කවරේ ද?

ත්‍රිවිධ වූ බෝධිය උදෙසා චිත්තෝත්පත්තිය ද, චතුර්විධ වූ බුද්ධ භූමි ද[1], සතර සංග්‍රහ වස්තූන් ද, කරුණාවට සැම විට ඉඩ ඇති බව ද, ධ්‍යාන විපස්සනා මාර්ග ඵල ප්‍රතිවේධයට සුදුසු බව ද, සියලු ධර්මයන්හි නො ඇලීම ද, සියලු සත්ත්වයන් කෙරෙහි පුත්‍ර සංඥාව ඇති බව ද, සංසාර දුකෙහි නොකළකිරී බැස ගැනීම ද, සියලු ආකාර දාන වස්තු පරිත්‍යාගය ද, එයින් අභිමානයට නො පැමිණීම ද, අධි ශීල ශික්ෂාව අධිෂ්ඨානය ද, එහි මනා ලෙස ස්ථිරව පිහිටීම ද, කුසල ක්‍රියාවන්හි ප්‍රීතිය හා ප්‍රමෝදය ඇති බව ද, විවේකයට (භාවනාවට)

[1] උත්සාහය -උම්මග්ග - අවත්ථාන - හිතචරියා (30 පිට බලන්න)

නැමුණු සිත් ඇති බව ද, නිතර ධ්‍යාන භාවනාවෙහි යෙදීම ද, නිවැරදි ධර්‍මයෙහි තෘප්තියකට නො පැමිණීම ද, අසන ලද ධර්‍මය අන්‍යයන්ට හිත කැමති ව දේශනා කිරීම ද, සත්ත්වයන් ආය්‍ය මාර්‍ගයෙහි පිහිටුවීම ද, වීය්‍යාරම්භයෙහි ස්ථිර බව ද, ධීර වීර ගුණ ඇති බව ද, පරාපවාද පර අපකාරයන්හි[1] වෙනසකට නො පැමිණීම ද, සත්‍යාධිෂ්ඨානය ද, සමාපත්තීන්හි වශී භාවය ද, අභිඥා බලයට පැමිණීම ද, ත්‍රිලක්‍ෂණ අවබෝධය ද, සතිපට්ඨානාදී බෝධිපාක්‍ෂික ධර්‍මයන්හි යෙදී ලෝකෝත්තර මාර්‍ගය පිණිස පාරමිතා වශයෙන් වැඩීම ද, නව ලෝකෝත්තර ධර්‍මයට බැස ගැනීම ද යන මේ ආදී බෝධි සම්භාර ධර්‍ම වැඩීමේ ප්‍රතිපදාව වීය්‍යාරම්භයෙන් ම සමෘද්ධ වන්නේ යැයි ප්‍රථම අභිනීහාරයෙහි පටන් යම්තාක් කලකින් ලොව්තුරු බුදු බව සිද්ධ වේ ද, ඒ තාක් වීය්‍යය අත නො හැර සකසා වීය්‍යය පාරමිතාව සම්පූර්‍ණ භාවයට පත්කඩ ගත යුතු ය.

මෙසේ වීය්‍යය පාරමිතාව සම්පාදනය කරන කල්හි ක්‍ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන ආදී පාරමිතාවෝ ද, දානාදී සියලු බෝධි සම්භාර ධර්‍මයෝ ද ඒ වීය්‍යය පාරමිතාව හා සමාන පැවතුම් ඇති බැවින් සමෘද්ධ වීම වෙති. මෙසේ ක්‍ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන පාරමිතාවන්ගේ ප්‍රතිපත්තිය වීය්‍යය පාරමිතාව හා සමාන වෙති.

මෙසේ සැලකීමේ දී සත්ත්වයන්ට සැප පිණිස හේතු වන උපකරණ පරිත්‍යාගයෙන් බොහෝ සෙයින් අනුග්‍රහ දක්වීම දාන පාරමිතාවේ ප්‍රතිපත්තිය වේ.

ඒ ඒ සත්ත්වයන්ගේ ජීවිත, සම්පත්, අඹුදරුවන් රැකීම, කේලමින් ඔවුනොවුන් නොබිඳවීම, ප්‍රිය වචන හිත වචන කථා කිරීම, හිංසා නොකිරීම සීල පාරමිතාවේ ප්‍රතිපත්තිය වේ.

සත්ත්වයින්ගේ ආමිස පිළිගැනීම, ධර්‍ම දානාදියෙන් සත්ත්වයන්ට හිත සුව පිණිස පිළිපැදීම නෛෂ්ක්‍රම්‍ය පාරමිතාවේ ප්‍රතිපත්තිය වේ.

---

[1] වරදවා පිළිපදින්නන් කෙරෙහි

සත්ත්වයන්ගේ යහපතට හේතු වූ කරුණාව හා උපාය කෞශල්‍ය ඥානය ඇතිව කටයුතු කිරීම ප්‍රඥා පාරමිතාවේ ප්‍රතිපත්තිය වේ.

ඒ ප්‍රඥාවෙන් යුත් ප්‍රතිපත්තියෙහි උත්සාහ ඇති බව ද, එම වීර්‍ය්‍යයෙහි අධිෂ්ඨානය සම්පූර්ණ වන තෙක් යෙදීම ද වීර්‍ය්‍ය පාරමිතාවේ ප්‍රතිපත්තිය වේ.

සත්ත්වයන්ගේ අපරාධ ඉවසීම ක්ෂාන්ති පාරමිතාවේ ප්‍රතිපත්තියයි.

සත්ත්වයන්ට වංචා නොකිරීම සත්‍යය පාරමිතාවේ ප්‍රතිපත්තිය වේ.

සත්ත්වයන්ට හිතසුව ලබා දීම පිණිස කරන ව්‍යායාමයෙහි අදහස නො හැරීම අධිෂ්ඨාන පාරමිතාවේ ප්‍රතිපත්තිය වේ.

සත්ත්වයන්ට හිතසුව ගෙන දීමට සිතීම මෛත්‍රී පාරමිතාවේ ප්‍රතිපත්තිය වේ.

සත්ත්වයන් විසින් කරනු ලබන හොඳ නරක ඉවසා වෙනසකට නොපැමිණ මධ්‍යස්ථ ව සියල්ල එක සේ පිළිගැනීම උපේක්ෂා පාරමිතාවේ ප්‍රතිපත්තිය වේ.

මෙසේ පෘතග්ජන සත්ත්වයන් හා සාධාරණ නොවන්නා වූ අප්‍රමාණ සත්ත්වයන් කෙරෙහි අනුකම්පා ඇතිව පුණ්‍ය සම්භාර හා ඥාණ සම්භාර රැස් කිරීම මහා බෝධිසත්ත්වයන් වහන්සේලා ගේ ප්‍රතිපත්ති වෙති.

# 11.පාරමිතා ධර්‍මයන්ගේ විභාගය කවරේද?

ලොව්තුරා බුදු බව ලැබීම පිණිස වූ මහා සත්ත්වයන් වහන්සේලාගේ පාරමිතා පූර්‍ණය වනාහි **"දස පාරමිතා, දස උප පාරමිතා, දස පරමත්ථ පාරමිතා"** යැයි පාරමිතා ධර්‍ම තිසක් වේ.

එයින් අඹුදරුවන් හා ධන සම්පත් ආදිය පරිත්‍යාගය **දාන පාරමිතාව** නම් වේ. තම ශරීරාංග පරිත්‍යාගය **දාන උප පාරමිතාව** නම් වේ. තම ජීවිතය පරිත්‍යාගය **දාන පරමත්ථ පාරමිතාව** නම් වේ. මෙසේ දාන පාරමිතා තුනකි.

අඹුදරු වස්තු දේපළ ආදිය හේතුවෙන් කඩ නො කොට රක්නා ලද සීලය **සීල පාරමිතාව** නම් වේ. තම ශරීරාවයව හේතුවෙන් නො බිඳ රක්නා සීලය **සීල උප පාරමිතාව** නම් වේ. ජීවිත පරිත්‍යාගයෙන් රක්නා සීලය **සීල පරමත්ථ පාරමිතාව** නම් වේ. මෙසේ සීල පාරමිතා තුනකි.

අඹුදරු ආදී බාහිර වස්තු අත්හැරීම **නෙක්ඛම්ම පාරමිතාව** නම් වේ. ශරීරාවයව හේතුවෙන් කාමයන් සෙවීමට නො ගොස් එම ශරීරාවයව අත්හැරීම **නෙක්ඛම්ම උප පාරමිතාව** නම් වේ. ජීවිතය වෙනුවෙන් කාමයන් සෙවීමට නො ගොස් ජීවිතය අත්හැරීම **නෙක්ඛම්ම පරමත්ථ පාරමිතාව** නම් වේ. මෙසේ නෛෂ්ක්‍රම්‍ය පාරමිතා තුනකි.

අඹුදරුවන් වස්තු දේපළ කෙරෙහි තෘෂ්ණාව දුරු කොට ප්‍රඥාව දියුණු කිරීම හා තම ප්‍රඥාවෙන් අනුන්ට යහපත සිදු කිරීම **ප්‍රඥා පාරමිතාව** නම් වේ. අත් පා ආදී ශරීරාංග ආශාව අත්හැර ප්‍රඥාව වැඩීම හා තම ප්‍රඥාවෙන් ලොවට යහපත සිදු කිරීම **ප්‍රඥා උප පාරමිතාව** නම් වේ. තම ජීවිත තෘෂ්ණාව හැර ප්‍රඥාව සම්පාදනය කිරීම හා තම ප්‍රඥාවෙන් ලොවට යහපත සිදු කිරීම **ප්‍රඥා පරමත්ථ පාරමිතාව** නම් වේ. මෙසේ ප්‍රඥා පාරමිතා තුනකි.

අඹුදරු වස්තු දේපළ නිසා හෝ පුද්ගලයෙකු නිසා හෝ නො පසු බසින්නා වූ සම්බෝධිය පිණිස වූ වීයඝීය **වීයඝීය පාරමිතාව** නම් වේ. තම ශරීරාවයව නිසාවත් ලිහිල් නො කොට සම්බෝධිය පිණිස පවත්වන්නා වූ නො පසුබට වීයඝීය **වීයඝීය උප පාරමිතාව** නම් වේ. ජීවිතය නිසාවත් නොනවත්වා බුදු බව ලැබීම පිණිස කරන්නා වූ උත්සාහය **වීයඝීය පරමත්ථ පාරමිතාව** නම් වේ. මෙසේ වීයඝීය පාරමිතා තුනකි.

ධනයට අඹු දරුවන්ට වන හානි නොබලා අනුන්ගේ දුක් පීඩා අපරාධ හා සීත උෂ්ණාදිය ඉවසීම **ක්‍ෂාන්ති පාරමිතාව** නම් වේ. අත් පා ආදී ශරීරාවයවයන්ට වන දුක් ගැහැට ඉවසීම **ක්‍ෂාන්ති උප පාරමිතාව** නම් වේ. තම ජීවිතයට ඇතිවන දුක් පීඩා විපත්ති ඉවසීම **ක්‍ෂාන්ති පරමත්ථ පාරමිතාව** නම් වේ. මෙසේ ක්‍ෂාන්ති පාරමිතා තුනකි.

ධන ධාන්‍ය වස්තු දේපළ අඹු දරුවන් නිසාවත් පොරොන්දු කඩ නො කොට සත්‍යයෙහි පිහිටීම **සත්‍ය පාරමිතාව** නම් වේ. තම ශරීරාවයව නිසාවත් බොරු නොකියා සත්‍යයෙහි පිහිටීම **සත්‍ය උප පාරමිතාව** නම් වේ. තම ජීවිතය නිසාවත් බොරු නොකියා සත්‍යයෙහි පිහිටීම **සත්‍ය පරමත්ථ පාරමිතාව** නම් වේ. මෙසේ සත්‍ය පාරමිතා තුනකි.

අඹුදරු වස්තු දේපළ ආදී බාහිර වස්තු හේතුවෙන් අධිෂ්ඨානය නො බිඳීම **අධිෂ්ඨාන පාරමිතාව** නම් වේ. තම ශරීරාංග හේතුවෙන් අධිෂ්ඨානය නො බිඳීම **අධිෂ්ඨාන උප පාරමිතාව** නම් වේ. තම ජීවිතය හේතුවෙන් වත් අධිෂ්ඨානය නො බිඳීම **අධිෂ්ඨාන පරමත්ථ පාරමිතාව** නම් වේ. මෙසේ අධිෂ්ඨාන පාරමිතා තුනකි.

තම වස්තූන්ට අඹු දරුවන්ට පීඩා කරදර අලාභ කරන්නන් කෙරෙහි නො කිපී මෙත් වැඩීම **මෛත්‍රී පාරමිතාව** නම් වේ. තම ශරීරාංගයන්ට හානි කරන්නන්ට නො කිපී මෙත් වැඩීම **මෛත්‍රී උප**

**පාරමිතාව** නම් වේ. තම ජීවිතයට හානි කරන්නන්ට නො කිපී මෙත් වැඩීම **මෛත්‍රී පරමත්ථ පාරමිතාව** නම් වේ. මෙසේ මෛත්‍රී පාරමිතා තුනකි.

තම ධනය අඹුදරු ආදිය හා හිත අහිත මැදහත් පුද්ගලයන් කෙරෙහිත් මැදහත් වීම **උපේක්ෂා පාරමිතාව** නම් වේ. තම ශරීරාංගයන්ට හානි කරන්නා වූ ද ඒවාට උදව් කරන්නා වූ ද සියල්ලන් කෙරෙහි මැදහත් බව **උපේක්ෂා උප පාරමිතාව** නම් වේ. තම ජීවිතයට හානි කරන්නවුන් කෙරෙහි ද උපකාර කරන්නවුන් කෙරෙහි ද මැදහත් බව **උපේක්ෂා පරමත්ථ පාරමිතාව** නම් වේ. මෙසේ උපේක්ෂා පාරමිතා තුනකි.

# 12. පාරමිතාවන් ගේ සංග්‍රහය කවරේ ද?

සියලු පාරමිතාවෝ වනාහි බෙද දක්වීම් වශයෙන් සමතිසක් වේ. **දන පාරමිතාව** - **සීල පාරමිතාව** ආදී වශයෙන් දසයක් වෙති. එසේම "**දන, සීල, ක්‍ෂාන්ති, වීර්‍යය, ධ්‍යාන, ප්‍රඥා**" වශයෙන් සය වැදෑරුම් වෙති.

❖ මේ බෙදීම් අතරින් නෙක්ඛම්ම පාරමිතාව පැවිද්ද ලැබීම් වශයෙන් සීල පාරමිතාවෙහි ම ඇතුළත් වේ.

❖ නීවරණයන්ගෙන් වෙන් වීම් වශයෙන් ධ්‍යාන පාරමිතාවෙහි ඇතුළත් වේ. සෙසු අකුසල්වලින් වෙන් වීම් වශයෙන් දනාදී සයට ඇතුළත් වේ.

❖ සත්‍ය පාරමිතාව සීල පාරමිතාවට අයත් වේ.

❖ වචී විරති (වචනයෙන් සිදුවන අකුසලයන්ගෙන් වැළකීම) ප්‍රත්‍යවේක්ෂා ඤාණය ප්‍රඥා පාරමිතාවෙහි ඇතුළත් වෙති.

❖ මෛත්‍රී පාරමිතාව ධ්‍යාන පාරමිතාවෙහි ඇතුළත් වේ.

❖ අධිෂ්ඨාන පාරමිතාව ඒ සියල්ලෙහි ම ඇතුළත් වේ.

මෙසේ සවැදෑරුම් වූ පාරමිතාවන් පිළිබඳ ව "**සත්‍යාධිෂ්ඨානය, ත්‍යාගාධිෂ්ඨානය, උපසමාධිෂ්ඨානය, ප්‍රඥාධිෂ්ඨානය**" යැයි අධිෂ්ඨාන සතරක් වෙති.

1. පළමු කොට ලෝකෝත්තර වූ බුද්ධත්වය උදෙසා කළ යම් ප්‍රථම අභිනීහාරයක් (ප්‍රාර්ථනාවක්) වේ ද, සත්ත්වයන් කෙරෙහි අනුකම්පාකාරී වූ මහා සත්ත්වයන් වහන්සේලාගේ ඒ ප්‍රතිඥාවට අනුව සියලු පාරමිතා ධර්ම සම්පූර්ණ වීම වන හෙයින් එය **සත්‍යාධිෂ්ඨානය** නම් වේ.

2. ඒ පාරමිතා ධර්මයන්ට විරුද්ධ වූ ධර්මයන් දුරු කිරීම **ත්‍යාගාධිෂ්ඨානය** නම් වේ.

3. සියලු පාරමිතා ගුණයන් හේතුවෙන් කෙලෙසුන්ගේ ප්‍රහාණය සිදු වී චිත්ත චෛතසික ධර්මයන්ගේ සන්සිඳීම **උපසමාධිෂ්ඨානය** නම් වේ.

4. ඒ පාරමිතා ගුණයන් කරණ කොට ගෙන පරවැඩ කිරීමෙහි වූ උපාය කෞශල්‍ය ඥාණය **ප්‍රඥාධිෂ්ඨානය** නම් වේ.

සත්‍යය වනාහි මේ සියලු පාරමිතා ධර්මයන්ගේ **ජනක** (උත්පත්ති) හේතුව වේ. ත්‍යාගය වනාහි පාරමිතා ධර්මයන්ගේ **පරිග්‍රාහක** (අල්ලා ගන්නා ලද) හේතුව වේ. **උපසමය** (සන්සිඳීම) සියලු පාරමිතාවන්ගේ අභිවෘද්ධි කර හේතුව වේ. **ප්‍රඥාව** සියලු පාරමිතා ධර්මයන්ගේ පිරිසිදු වීමේ හේතුව වේ.

එසේම සත්‍ය ප්‍රතිඥා ඇති බැවින් මුලට **සත්‍යාධිෂ්ඨානය** ද, කරන ලද ප්‍රාර්ථනා ඇතිව ආත්ම පරිත්‍යාගය කරන බැවින් මධ්‍යයෙහි **ත්‍යාගාධිෂ්ඨානය** ද, අවසන් ප්‍රතිඵලය සන්සිඳීම ගෙන දෙන බැවින් අවසානයට **උපසමාධිෂ්ඨානය** ද, ප්‍රඥාව ඇති කල්හි සියලු පාරමිතා

ධර්ම ලැබෙන හෙයින් ද, ප්‍රඥාව නැති කල්හි නොලැබෙන හෙයින් ද, ප්‍රතිඥාව පරිදි සියල්ල සිදුවන බැවින් ද **ප්‍රඥාධිෂ්ඨානය** මුල මැද අග සියලු තැන්හි ම තිබිය යුතු ය.

මහා පුරුෂයන් වහන්සේලා ගිහිව සිටින කල්හි නිරන්තරයෙන් ආත්ම හිත වූ ද, පරහිත වූ ද, ගරු ප්‍රිය භාවය කරන්නා වූ **සත්‍යාධිෂ්ඨානයෙහි** පිහිටාගෙන ආමිස දානයෙන් අනුන්ට අනුග්‍රහ කරති. පැවිදි වූයේ නම් ආත්ම හිත පරහිත වූ ගරු ප්‍රිය භාවය කරන්නා වූ **උපසමාධිෂ්ඨානයෙහි** හා **ප්‍රඥාධිෂ්ඨානයෙහි** පිහිටා ධර්ම දානයෙන් අනුන්ට අනුග්‍රහ කරති.

මෙලෙස නොයෙක් භවයන්හි දී පාරමී ගුණයන් පූර්ණය කිරීමෙන් මහා බෝසතාණන් වහන්සේලාගේ සතර අධිෂ්ඨානයන් සම්පූර්ණ කිරීම සිදු වෙති. මෙසේ සම්පූර්ණ කළ සතර අධිෂ්ඨාන ඇති මහ බෝසතාණන් වහන්සේලාට ම පශ්චිම භවයෙහි උත්පත්තිය සිද්ධ වෙති. එහි දී මව්කුස ප්‍රතිසන්ධිය, මව් කුසෙහි වාසය, අභිනිෂ්ක්‍රමණය යන මේ අවස්ථාවන් **ප්‍රඥාධිෂ්ඨානය** සම්පූර්ණ වීමෙන් මනා සිහි ඇතිව මැනවින් දැන සිද්ධ වෙති.

**සත්‍යාධිෂ්ඨානය** සම්පූර්ණ වීමෙන් උපන් ඇසිල්ලෙහි උතුරු දෙසට මුහුණ ලා සත් පියවරක් වැඩීම, දස දිග බැලීම, "**අග්ගො හමස්මි ලොකස්ස**" ආදී අභීත සිංහනාද කිරීම සිද්ධ වෙති.

**උපසමාධිෂ්ඨානය** සම්පූර්ණ වීමෙන් සතර පෙර නිමිති දැකීමෙන් ඒ චතුර්විධ ධර්මයන් පිළිබඳ විනිශ්චයෙහි දක්ෂ වූවහුගේ යෞවන මද, ආරෝග්‍ය මද, ජීවිත මද, සම්පත්ති මද යන මදයන්ගේ සන්සිඳීම සිද්ධ වෙති.

**ත්‍යාගාධිෂ්ඨානය** සම්පූර්ණ වීමෙන් මහත් වූ ඥාති පරිවාර සම්පත්තිය, අතට පත් සක්විති රාජ්‍ය සම්පත්තිය අපේක්ෂා රහිතව අතහැර යාම සිද්ධ වෙති. තව ද ප්‍රතිඥාවට අනුව **සත්‍යාධිෂ්ඨානය** සම්පූර්ණ කිරීමෙන් චතුරාර්ය සත්‍යය අවබෝධය සිද්ධ වෙති. ත්‍යාගාධිෂ්ඨානය සම්පූර්ණ වීමෙන් සියලු ක්ලේශයන්ගේ අත්හැරීම

සිද්ධ වෙති. **උපසමාධිෂ්ඨානය** සම්පූර්ණ වීමෙන් (වාසනා සහිත ක්ලේශ ප්‍රහාණය සිදුවන බැවින්) උතුම් වූ සන්සිඳීම සිද්ධ වෙති. **ප්‍රඥාධිෂ්ඨානය** සම්පූර්ණ වීමෙන් අනාවරණ ඥාණ (සර්වඥතාඥාන) ප්‍රතිලාභය සිද්ධ වෙති.

තව ද **සත්‍යාධිෂ්ඨානය** සම්පූර්ණ වීමෙන් දෙළොස් ආකාර ආර්‍ය්‍ය සත්‍යය බෙද දක්වීම සිද්ධ වෙති. **ත්‍යාගාධිෂ්ඨානය** සම්පූර්ණ වීමෙන් සද්ධර්ම දේශනාව සම්පූර්ණ ලෙස දේශනා කිරීම සිද්ධ වෙති. **උපසමාධිෂ්ඨානය** සම්පූර්ණ වීමෙන් තමනුත් සන්සිඳී අන් ලෝ සතුන් සන්සිඳවීම සිද්ධ වෙති. **ප්‍රඥාධිෂ්ඨානය** සම්පූර්ණ වීමෙන් හික්මවිය යුතු සත්ත්වයන්ගේ සිත්හි ඇති ආශය අනුශය ආදිය දැන ගැනීම සිද්ධ වෙති.

තව ද **සත්‍යාධිෂ්ඨානය** සම්පූර්ණ වීමෙන් කෙලෙස් පිරිනිවීම සිද්ධ වෙති. **ත්‍යාගාධිෂ්ඨානය** සම්පූර්ණ වීමෙන් තෘෂ්ණා දී උපධීන්ට හසු වූ වස්තු පරිත්‍යාගය සිද්ධ වෙති. **උපසමාධිෂ්ඨානයෙන්** සියලු සංස්කාරයන්ගේ සන්සිඳවීම සිද්ධ වෙති. **ප්‍රඥාධිෂ්ඨානය** සම්පූර්ණ වීමෙන් අනුපාදිශේෂ පරිනිර්වාණයෙන් පිරිනිවීම සිද්ධ වෙති.

# 13.පාරමිතා ධර්මයන්ගේ සම්පාදනය කිරීමේ උපාය කවරේ?

සම්‍යක් සම්බෝධිය උදෙසා සියලු කුසල ධර්මයෝ නොවෙනස්ව යෙදීමෙන් **නිරවශේෂයෙන් යෙදීම** ය, **ආදර බහුමානයෙන් සකස් කොට කරන බව** ය, **නිරන්තරයෙන් නො නැවතී කිරීම** ය, **අතරතුර නො නැවතී බොහෝ කාලයක් කිරීම** ය යන අංග සතර මේ සියලු පාරමිතා ධර්මයන් සම්පාදනය කිරීමෙහි උපාය වෙති.

සම්මා සම්බුද්ධත්වය පිණිස පිළිවෙත් පුරණ මහා සත්ත්වයන් වහන්සේලා විසින් සම්‍යක් සම්බෝධිය පිණිස පළමු කොටම බුදුරජාණන් වහන්සේලාට තම ආත්මභාවය පූජා කළ යුතු ය. තමාට හිමිවන ලැබෙන වස්තූන්ගෙන් පළමු කොටස දන විෂයයෙහි අත්හැරිය යුතු ය. තමන්ට උපදනා ජීවිත පරිෂ්කාරාදී[1] යමක් වේ ද, ඒ සියල්ල යාචකයන් ඇති කල්හි පරිත්‍යාග කොට ඉතිරි වූවක් පරිභෝග කළ යුතු ය. මෙසේ මනා කොට පරිත්‍යාග කළ කුසල විපාක ප්‍රත්‍යයෙන් යමක් උපදී ද එහි **දනයෙහි කලින් නො කළ පුරුද්දය, පරිග්‍රහ (තමා සතු) වස්තුවෙහි මඳ බවය, මහත් කොට මනබඳින ස්වභාවය, ක්‍ෂයවීම පිළිබඳ සිතිවිල්ල** යැයි දනය පිළිබඳ බැඳීම් සතරක් ඇති වේ.

1. යම් කලෙක දිය යුතු වස්තුව ඇති කල්හි යාචකයන් ද ඇති කල්හි දීම පිණිස සිත නො නැමේ ද, එවිට **"මම ඒකාන්තයෙන් දීමෙහි පෙර නො කළ පුරුද්ද ඇත්තෙමි. එබැවින් දීමට කැමැත්තක් මගේ සිතෙහි නූපදී"** යැයි නිගමනය කළ යුතු ය. ඉන් පසු **"මෙතැන් පටන් දන් දෙන්නෙමි, පළමු කොට පරිග්‍රහ වස්තු යාචකයන්ට පරිත්‍යාග කළේ නොවේ ද"** වස්තුව කෙරෙහි බැඳීම් රහිතව දීමෙහි සිත් ඇලවිය යුතු ය. මෙසේ මහා සත්ත්වයන් වහන්සේලාගේ පළමු වන දන බන්ධනය නැසුණේ වෙති.

2. එසේම මහා සත්ත්වයන් වහන්සේලා දිය යුතු වස්තුව මඳ වූ කල්හි මෙසේ සලකති. **"මම වනාහි පෙර නුදුන් බැවින් දන් ප්‍රත්‍ය හිඟ වූයේ වෙමි, එබැවින් මඳ වූ හෝ යම් වස්තුවක් ලැබුණු විට එය මම ද පරිභෝග නො කොට දන් දෙන්නෙමි. මත්තෙහි දන පාරමිතාව මුඳුන් පමුණුවන්නෙමි"** යැයි දන් දිය යුතුම ය. එවිට දනය කෙරෙහි පැවති දෙවැනි බන්ධනය නැසුණේ වෙති.

3. එසේම මහා සත්ත්වයන් වහන්සේලා දිය යුතු වස්තුවෙහි උසස් ලෙස සිත් අලවන බැවින් ඇතැම් විට නො දෙනු කැමැත්ත සිතෙහි උපදිති. එවිට **"සත්පුරුෂය! නුඹ විසින් ඉතා උදර වූ**

---

[1] ගිලන් වූ විට ගත යුතු බෙහෙත් ආදිය

**හැමට ම ශ්‍රේෂ්ඨ වූ සම්‍යක් සම්බෝධිය පතන ලද්දේ නොවේ ද? එබැවින් නුඹ විසින් ඒ සඳහා උදර වූ මන වඩන්නා වූ දිය යුතු වස්තුව දීම සුදුසු ම ය."** යැයි සිහි කරති. මෙසේ සැලකීමෙන් දානය පිළිබඳ තෙවැනි බන්ධනය නැසුණේ වෙති.

4. තවද මහා සත්ත්වයන් වහන්සේලා වනාහි දන් දීමෙන් යම් කලෙක දාන වස්තුවෙහි ක්‍ෂය වීමක් දකිත් ද එවිට මෙසේ සිතති. **"යම් මේ ක්‍ෂය වන විනාශ වන ස්වභාවයක් වේ ද, එය වනාහි භෝගයන්ගේ ස්වභාවයයි. එසේ වුවත් මා විසින් පෙර එබඳු දානයන් නුදුන් හේතුවෙන් මෙසේ භෝගයෙන් ක්‍ෂය වූයේ ය. එබැවින් මම ස්වල්ප වූ හෝ මහත් වූ හෝ ලද දෙයකින් දන් දෙන්නෙම් නම් යෙහෙකි. මම මත්තෙහි දාන පාරමිතාව මුදුන්පත් කරන්නෙමි"** යැයි කල්පනා කොට දානය කෙරෙහි වූ සිවුවන බාධකය සිඳ දමති.

සීල පාරමිතා ආදියෙහි ද මෙලෙස ම ය.

තව ද මහා සත්ත්වයන් වහන්සේලා විසින් බුදු රජාණන් වහන්සේලා උදෙසා කරන ලද යම් ජීවිත පරිත්‍යාගයක් වේ ද, එය සියලු පාරමිතා ධර්‍මයන් මනා කොට සම්පාදනය කිරීමෙහි උපාය වෙති. මෙසේ බුදු රජාණන් වහන්සේලාට ආත්ම පරිත්‍යාග කරන ලද මහා පුරුෂයන් වහන්සේලා ඒ ඒ භවයන්හි බෝධි සම්භාර පූර්‍ණය පිණිස උත්සාහවත් වෙමින් ශරීරය ද සැප උපකරණයන් ද සිඳලන්නා වූ ඉවසිය නොහැක්කා වූ සම්පූර්‍ණ කිරීමට නොහැක්කා වූ දුෂ්කර ක්‍රියාවන්හි ද සත්ත්වයන් හා අනෙක් වස්තූන් නිසා ඇතිවන දරුණු වූ ප්‍රාණය පැහැර ගන්නා තරම් වූ අනර්‍ථයන් ඇති කල්හි ද **"මා විසින් මේ ආත්මභාවය බුදුවරයන් වහන්සේලාට පරිත්‍යාග කරන ලද්දේ ය. මෙහි යමක් වේ නම් එය වේවා"** යැයි ජීවිත ආශාව හැර කම්පා නොවී වෙනසකට නොපැමිණ නිශ්චලව කුසල ධර්‍මයන්හි පිහිටා පාරමිතා ධර්‍ම සම්පාදනය කරති. මෙලෙස කරන ලද ආත්ම පරිත්‍යාගය ද පාරමිතා ධර්‍ම සම්පාදනයෙහි උපාය වේ.

තව ද සැකෙවින් කරන ලද අභිනීහාර (ප්‍රාර්‍ථනාව) ඇති මහා බෝධිසත්ත්වයන් වහන්සේලා තමා කෙරෙහි ස්නේහය අඩු කොට අනුන් කෙරෙහි ස්නේහය වැඩි කරති. මෙය ද පාරමිතාවන්ගේ සම්පාදන උපාය වේ. මෙසේ සම්මා සම්බුද්ධත්වය පිණිස කළ ප්‍රාර්‍ථනා ඇති සියලු ධර්‍මයන් කෙරෙහි ඇලීමක් නැති මහා සත්ත්වයන් වහන්සේලාගේ ආත්ම ස්නේහය නිරවශේෂයෙන් ගෙවී යති. මහා කරුණාවෙහි පිහිටා ගැනීමෙන් සියලු සත්ත්වයන් තම පුතුන් මෙන් සැලකීමෙන් සියලු සත්ත්වයන් කෙරෙහි මෛත්‍රී කරුණා ස්නේහය වැඩෙන්නාහ. ඉක්බිති ඒ ඒ අවස්ථාවන්ට සුදුසු වූ තමාගේ හා අන්‍යයන්ගේ සිත්වල ලෝභ ද්වේෂ මෝහ පහ කිරීමෙන් මසුරු කම ආදී පාපධර්‍ම දුරු කොට **දානය, ප්‍රිය වචනය, අර්‍ථචර්‍යාව, සමානාත්මතාව** යන සංග්‍රහ වස්තුන් අනුව අතිශයින් ජනයාට අනුග්‍රහ කිරීමෙන් සියලු ගුණයන් මුදුන් පමුණුවා ගනිති.

මහා සත්ත්වයන් වහන්සේලාගේ මහා කරුණාවත් මහා ප්‍රඥාවත් දානයෙන් සරසන ලද්දේ ය. දානය ප්‍රිය වචනයෙන් සරසන ලද්දේ ය. අර්‍ථ චර්‍යාව සමානාත්මතාවයෙන් සරසන ලද්දේ ය.

සියලු සත්ත්වයන් කෙරෙහි තමන් හා සමානව විශේෂයක් නො කොට බෝධි සම්භාර පූර්‍ණයෙහි යෙදෙන මහා බෝධිසත්ත්වයන් වහන්සේලා සියලු තැන සමාන සැප දුක් ඇති බැවින් බුද්ධත්වයට පැමිණි කල්හි ද සතර අධිෂ්ඨානයන් සම්පූර්‍ණ කළ බැවින් සතර සංග්‍රහ වස්තුන්ගෙන් බොහෝ සෙයින් සංග්‍රහ කිරීම සිදු වෙති. සම්මා සම්බුදු රජාණන් වහන්සේලාගේ **ත්‍යාගාධිෂ්ඨානයෙන් දානය සම්පූර්‍ණ කරන ලද්දහු වෙති. සත්‍යාධිෂ්ඨානයෙන් ප්‍රිය වචනය** සම්පූර්‍ණ කරන ලද්දහු වෙති. **ප්‍රඥාධිෂ්ඨානයෙන් අර්‍ථ චර්‍යාව සම්පූර්‍ණ** කරන ලද්දහු වෙති. **උපසමාධිෂ්ඨානයෙන් සමානාත්මතාවය සම්පූර්‍ණ** කරන ලද්දහු වෙති. තථාගතයන් වහන්සේලාගේ හා පසේ බුදු රජාණන් වහන්සේලාගේ ද අග්‍ර ශ්‍රාවකාදී මහ රහතන් වහන්සේලාගේ ද අනුපාදිශේෂ පරිනිර්‍වාණයෙන් සමානාත්මතාවය වෙති. විමුක්තියෙහි (නිවනෙහි) නානත්වයක් නැත.

# 14. පාරමිතාවන්ගේ සම්පාදනය කොපමණ කලකින් සිද්ධ වේ ද?

සාමාන්‍යයෙන් මහ බෝසතාණන් වහන්සේලාගේ පාරමී කාලය යටත් පිරිසෙයින් (අඩුම වශයෙන්) මහා කල්ප අසංඛ්‍ය සතරකුත් කල්ප ලක්ෂයකි. මධ්‍යම වශයෙන් මහා කල්ප අසංඛ්‍ය අටකුත් කල්ප ලක්ෂයකි. උඩත් පිරිසෙයින් (වැඩිම වශයෙන්) මහා කල්ප අසංඛ්‍ය දහසයකුත් කල්ප ලක්ෂයකි.

ප්‍රඥාව අධික වූ බෝධිසත්ත්වයන් වහන්සේලාගේ ශ්‍රද්ධාව මඳය. ප්‍රඥාව තියුණු ය. ශ්‍රද්ධාව අධික බෝධිසත්ත්වයන් වහන්සේලාගේ ශ්‍රද්ධාව තියුණු ය. ප්‍රඥාව මධ්‍යම වේ. වීර්‍ය්‍යය අධික බෝධිසත්ත්වයන් වහන්සේලාගේ ප්‍රඥාව මඳය. වීර්‍ය්‍යය තියුණු ය.

අභිනීහාර ක්‍ෂණයෙහි දී මහා බෝධිසත්ත්වයන් වහන්සේලා **උග්ඝටිතඥ, විපඤ්චිතඥ, ඥෙය** වශයෙන් ත්‍රිවිධ වෙති.

යම් බෝසතාණන් වහන්සේ නමක් **උග්ඝටිතඥ** (තියුණු ප්‍රඥා ඉන්ද්‍රිය) ඇත්තේ වේ ද, එතුමන් වහන්සේ ශ්‍රාවක බෝධියෙහි පිහිටියේ වේ නම් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ හමුවෙහි දී සතර පද ගාථාවක් ශ්‍රවණය කරන්නේ එහි තෙවන පදය නිමවීමට පෙර ෂට් අභිඥා, චතු ප්‍රතිසම්භිධා ඥාණ සහිතව අර්හත් ඵලය අවබෝධ කර ගැනීමට සමර්ථ වූ උපනිඃශ්‍රය සම්පත් ඇත්තේ වේ ද, එබඳු තියුණු නුවණැති අභිනීහාර සම්පන්න මහ බෝසතාණන් වහන්සේලා එතැන් පටන් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් සමත්‍රින්ශත් පාරමිතා ධර්ම පූර්ණය කොට ලොව්තුරා බුදු බවට පැමිණෙති.

යම් බෝසතාණන් වහන්සේ නමක් **විපඤ්චිතඥ** වේ ද එබඳු බෝධිසත්වයන් වහන්සේ ශ්‍රාවක බෝධියෙහි පිහිටියේ වී නම් භාග්‍යවතුන් වහන්සේ දේශනා කරන සතර පද ගාථාවක් ශ්‍රවණය කරන්නේ එහි සතර වන පදය නිමවීමට පෙර ෂට් අභිඥා ඥාණ සහිතව අර්හත් ඵලය අවබෝධ කර ගැනීමට සමර්ථ වූ උපනිඃශ්‍රය

සම්පත් ඇත්තේ වේ ද, එබඳු වූ අභිනීහාර සම්පන්න මහ බෝධිසත්ත්වයන් වහන්සේලා බලවත් ශ්‍රද්ධා ඉන්ද්‍රියෙන් යුක්තව අටාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් සමත්‍රින්ශත් පාරමිතා ධර්‍ම පූර්‍ණය කොට ලොව්තුරා බුදු බවට පැමිණෙති.

යම් බෝසතාණන් වහන්සේ නමක් ශ්‍රේදය වේ ද, එබඳු බෝසතාණන් වහන්සේ ශ්‍රාවක බෝධියෙහි පිහිටියේ වී නම් භාග්‍යවතුන් වහන්සේ දේශනා කරන සතර පද ගාථාවක් ශ්‍රවණය කරන්නේ එය නිම වූ කල්හි ෂට් අභිඥා ඥාණ සහිතව අර්හත් ඵලය අවබෝධ කර ගැනීමට සමර්ථ වූ උපනිඃශ්‍රය සම්පත් ඇත්තේ වේ ද, එබඳු වූ අභිනීහාර සම්පන්න මහ බෝධිසත්ත්වයන් වහන්සේලා බලවත් වීර්‍ය්‍ය ඉන්ද්‍රියෙන් යුක්තව සොළසාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් සමත්‍රින්ශත් පාරමිතා ධර්‍ම පූර්‍ණය කොට ලොව්තුරා බුදු බවට පැමිණෙති.

# 15.පාරමිතා ධර්‍මයන්ගේ ආනිශංස කවරේ ද?

**"එවං සබ්බඞ්ගසම්පන්නා - බොධියා නියතා නරා,**
**සංසරං දීඝමද්ධානං - කප්පකොටිසතෙහිපි.**
**අවීචිම්හි නුප්පජ්ජන්ති - තථා ලොකන්තරෙසු ච"**

අභිනීහාර සම්පන්න මහ බෝසතාණන් වහන්සේලා සියලු ගුණයන්ගෙන් යුක්ත වූවාහු සම්බෝධියට නියත වූවාහු වෙති. එබැවින් කල්ප සිය දහස් කෝටි අසංඛ්‍ය ගණනක් සසරෙහි ඇවිදින්නාහු නමුත් අවීචි මහ නරකයෙහි නූපදිති. ලෝකාන්තරික නරකයෙහි නූපදිති.

**"නිජ්ඣාමතණ්හා ඛුප්පිපාසා - න හොන්ති කාලකඤ්ජිකා,**
**න හොන්ති ඛුද්දකා පාණා - උප්පජ්ජන්තාපි දුග්ගතිං"**

නිජ්ඣාමතණ්හික, ඛුප්පිපාසක, කාලකඤ්ජික, පරදත්තුප ජීවිකා දී ප්‍රේත විෂයන්හි නූපදිති. තිරිසන් යෝනියෙහි උපදින්නාහු

නමුත් (වටුවන්ට වඩා කුඩා සතුන් ව ද, ඇතුන්ට වඩා විශාල සතුන් ව ද) නූපදිති.

"ජායමානා මනුස්සෙසු - ජච්චන්ධා න භවන්ති තෙ
සොතවෙකල්ලතා නත්ථි - න භවන්ති මූගපක්ඛිකා,
ඉත්ථිභාවං න ගච්ඡන්ති - උභතොබ්‍යඤ්ජනපණ්ඩකා"

මිනිස් ලොව උපදින්නාහු අඳ, ගොළු, බිහිරි, කොර, අංගවිකලාදී අභව්‍ය ලෙස නූපදිති. ස්ත්‍රීත්ව නූපදිති. උභතෝ භ්‍යඤ්ජනකව ද, නපුංසක ව ද නූපදිති.

"න භවන්ති පරියාපන්නා - බොධියා නියතා නරා,
මුත්තා ආනන්තරිකෙහි - සබ්බත්ථ සුද්ධගොචරා
මිච්ඡාදිට්ඨිං න සෙවන්ති - කම්මකිරියදස්සනා"

සියලු තැන්හිම පිරිසිදු අදහස් ඇත්තාහු සම්බෝධිය ලැබීමට නියත වූ ඒ ශ්‍රේෂ්ඨ උතුමන් වහන්සේලා ආනන්තර්‍ය්‍ය කර්‍මයන්ගෙන් හා මිථ්‍යා දෘෂ්ටිවලින් වැළකුණාහු වෙති.

"වසමානාපි සග්ගෙසු - අසඤ්ඤං නූපපජ්ජරෙ,
සුද්ධාවාසෙසු දෙවෙසු - හෙතු නාම න විජ්ජති"

බ්‍රහ්ම ලෝකයෙහි උපදින්නාහු නමුත් අසඤ්ඤ තලයෙහි ද අරූප ලෝකවල ද නූපදිති. පශ්චිම භවයෙහි ම අධිගම ලබන බැවින් ශුද්ධාවාසයෙහි ද නූපදිති.

"නෙක්ඛම්මනින්නා සප්පුරිසා - විසංයුත්තා භවාභවෙ,
චරන්ති ලොකත්ථචරියායො - පූරෙන්ති සබ්බපාරමී'ති"

කුඩු මහත් භවයන්හි නො ඇලුණාහු නෛෂ්ක්‍රම්‍යයට බර වූ සිත් ඇති මහ බෝසතාණන් වහන්සේලා ලෝකාර්‍ථ චර්‍ය්‍යාව පිණිස ම සියලු පාරමිතා පුරමින් හැසිරෙති.

තව ද මහ බෝසතාණන් වහන්සේලා විසින් පූර්‍ණය කරනු ලබන පාරමිතා ධර්‍මයන්ගේ ආනිශංස වශයෙන් පශ්චිම භවික

ප්‍රතිසන්ධි ලාභයත් සමග සොළොස් වැදෑරුම් ඓශ්වර්‍ය ධර්‍මයන්ගේ පහළ වීම, දෙතිසක් පූර්‍ව නිමිති හට ගැනීම සිද්ධ වෙති. ඒවා මෙසේ ය :-

## ❈ සොළොස් වැදෑරුම් ඓශ්වර්‍ය ධර්‍ම

1. මහ බොධිසත්ත්වයන් වහන්සේලා මනාව සිහිය නුවණ ඇතිව ම තුසිත දෙවියන් කෙරෙහි උපදිති.

2. ආයු ඇති තාක් තුසිත ලෝකයෙහි සිටිති. තුසිත ලෝකයෙන් ච්‍යුතව මව්කුස පිළිසිඳ ගනිති.

3. මව්කුස පිළිසිඳ ගත් ක්‍ෂණයෙහි ම ඉර හඳ ආලෝකයෙන් කිසි කලෙක ආලෝකවත් නොවන ලෝකාන්තරික නරකයෙහි සත්ත්වයන්ට ද ඔවුනොවුන් දැකිය හැකි ආලෝකයක් දෙවියන්ගේ දේවානුභාවය ද ඉක්මවා පහළ වෙයි. දසදහසක් ලෝක ධාතුව හාත්පසින් අතිශයින් කම්පාවෙයි.

4. යම් කලෙක බෝසතාණන් වහන්සේ මව්කුසට පිළිසිඳ ගැනීම් වශයෙන් බැස ගත්තේ වේ ද, එකල ඒ බෝසතුනුත් බෝසත් මවත් මිනිසෙකු හෝ අමනුෂ්‍යයෙකු හෝ කිසිවෙකු විසින් නොපෙළාවා යැයි දෙවියන් සතර දෙනෙක් බෝසතාණන් වහන්සේට ආරක්ෂාව පිණිස සිව්දිග එළඹ සිටිති.

5. බෝසතාණන් වහන්සේ මව් කුසට (ප්‍රතිසන්ධි වශයෙන්) බැසගත්තේ ද, (එතැන් පටන්) බෝසත් මව ස්වභාවයෙන් සිල්වත් තැනැත්තියක් වන්නී ය. උපෝසථ සීලයෙහි පිහිටා ගනී.

6. බෝසත් තෙම මව් කුසට (ප්‍රතිසන්ධි වශයෙන්) බැසගත්තේ ද, (එතැන් පටන්) බෝසත් මවට පුරුෂයන් කෙරෙහි කාමයෙන් යුත්

සිතක් නූපදී. රාග සිතින් කිසිවකුට බෝසත් මව වෙත එළඹිය නොහැකි වෙති.

7. බෝසත් මව පස් කම් ගුණ බොහෝ කොට ලබන්නියක් වෙයි. ඉඳුරන් පිනවයි.

8. බෝසතාණන් වහන්සේ මව් කුසට බැසගත්තේ තැන් පටන් බෝසත් මවට කිසි ආබාධයක් නූපදින්නී ය. බෝසත් මව සැප ඇති ක්ලාන්ත නොවූ කය ඇත්තියක් වන්නී ය.

9. බෝසත් මව කුස තුළ සිටින නොපිරිහුනු ඉන්ද්‍රිය ඇති සියලු අංග ප්‍රත්‍යංගයන්ගෙන් යුත් බෝසතුන් දකින්නී ය.

10. බෝධිසත්ත්වයන් වහන්සේ ඉපද සත් දිනකින් බෝසත් මව කළුරිය කරන්නී ය. කළුරිය කොට තුසිත දිව්‍ය ලෝකයෙහි උපදින්නී ය.

11. බෝසත් මව දස මසක් ම බෝසතාණන් වහන්සේ කුසින් උසුලා සිට වදන්නී ය. මව සිටගෙන සිටියදී ම පශ්චිම භවිකව මහ බෝසතාණන් වහන්සේ ගේ බිහි වීම සිහිනුවණින් සිද්ධ වෙති.

12. බෝසතාණන් වහන්සේ මව් කුසින් බිහි වෙන කල්හි දෙවියෝ ඔහු පළමු කොට පිළිගනිත්.

13. දිව්‍ය පුත්‍රයන් සතර දෙනෙක් බෝසතාණන් වහන්සේ පිළිගෙන **"දේවියනි, සතුටු වූව මැනව. ඔබට මහේශාක්‍ය පුතෙක් උපන්නේය"** යැයි මව ඉදිරියෙහි තබති. පසුව මනුෂ්‍යයෝ පිළිගනිති.

14. බෝසතාණන් වහන්සේ මව්කුසින් බිහි වෙන කල්හි උණු දිය හා සිසිල් දිය ජල ධාරා දෙකක් අහසින් පහළ වී පිරිසිදු කරයි.

15. උපන් කණෙහි බෝසතාණන් වහන්සේ සම වූ පාදයෙන් පොළොවෙහි සිට ගනී. දෙවියන් විසින් සේසත දරන කල්හි උතුරු දිගට මුහුණ ලා සත් පියවරක් යයි. සියලු දිශාවන් බලා **"මම ලොවට අග්‍ර වෙමි. මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි මම ලොවට ජ්‍යෙෂ්ඨ වෙමි. මේ මගේ අන්තිම ඉපදීමයි. නැවත උත්පත්තියක් නැත"** යන වචනය කියන්නේ වේ.

16. බෝසත් තෙම මව්කුසින් බිහිවූණු ක්‍ෂණයෙහි ඉර හඳ ආලෝකයෙන් කිසි කලෙක ආලෝකවත් නොවන ලෝකාන්තරික නරකයෙහි සත්ත්වයන්ට ද, ඔවුනොවුන් දැකිය හැකි ආලෝකයක් දෙවියන්ගේ දේවානුභාවය ද ඉක්මවා පහළ වෙයි. දසදහසක් ලෝක ධාතුව හාත්පසින් අතිශයින් කම්පාවෙයි.

## ❄ දෙතිස් පූර්‍ව නිමිති

පශ්චිම භවික මහ බෝසතාණන් වහන්සේගේ ප්‍රතිසන්ධි මංගල්‍යය උත්පත්ති මංගල්‍යය බුද්ධත්ව මංගල්‍යය ධර්‍මචක්‍ර දේශනය යන අවස්ථාවන්හි දී දසදහසක් සක්වළ පුරාවට සිදුවන අසිරිමත් සිදුවීම් (පෙර නිමිති) දෙතිසක් වෙති. ඒවා මෙසේ ය :-

1. දස දහසක් ලෝකධාතු කම්පා වෙති.
2. දස දහසක් ලෝකධාතුන්හි චන්ද්‍ර සූර්‍ය්‍ය ආලෝක දිව්‍ය බ්‍රහ්ම ආලෝක පරදවන අප්‍රමාණ ආලෝකයක් ඇති වෙති.
3. ඒ ආශ්චර්‍ය්‍යයන් දැකීමට මෙන් අන්ධයන්ට ඇස් ලැබෙති.
4. බිහිරන්ට ශබ්ද ඇසීමට හැකි වෙති.
5. ගොළු වූවන්ට කථා කළ හැකි වෙති.
6. කුදු වූවන්ට ඍජු ශරීර ඇතිවෙති.
7. පිළුන්ට ගමන් කළ හැකි වෙති.
8. බන්ධන ගත සත්ත්වයන් එම බන්ධනවලින් නිදහස් වෙති.
9. සියලු නරකයන්හි අපා ගිනි නිවී යති.
10. ප්‍රේත අපායන්හි සා පිපාසා දී දුක් සන්සිඳෙති

11. තිරිසන් ගත සත්ත්වයන්ට ඇති මරණ භය ආදිය පහව යති.
12. රෝගාතුර වූ සියලු සත්ත්වයෝ සුවය ලබති.
13. සියලු සත්ත්වයන් ඔවුනොවුන්ට ප්‍රිය වචනයෙන් කථා කරති.
14. අශ්වයෝ මිහිරි වූ හේසාරව නාද පවත්වති. ඇතුන් මිහිරි හඬින් කුඤ්චනාද පවත්වති
15. වෛරී වූවෝ සමගි වෙති.
16. දෙව්ලොව මනුලොව ඇත්තා වූ සියලු තූර්‍ය්‍ය භාණ්ඩයන්ගෙන් ඉබේම මිහිරි නාද ඇතිවෙති.
17. මනුෂ්‍යයන් ගේ පැළඳි ආභරණ නොගැටීම ගැටුණු කලක මෙන් නාද වෙති.
18. සියලු දිසාවන් අලංකාරමත් වෙති.
19. සත්ත්වයන්ට සුව පහසුව ඇති කරවමින් මෘදු වූ සිසිල් වූ මඳ පවන් ඇතිවෙති.
20. අකල් වැසි වසිති.
21. භූගත ජලය මතුපිටට පැමිණ ගලා යති.
22. පක්ෂීහු අහස් ගමන් නවත්වා බිමට බසිති
23. . ගංගා ඇළ දෙළ ආදියෙහි ජලය ගැලීම නතර වෙති.
24. සමුද්‍ර ජලය මිහිරි පැන් බවට පත් වෙයි.
25. මීදුම වළාකුළු ආදියෙන් බාධාවකින් තොරව අහසෙහි හිරු හා තාරකාවෝ එකවිට බබළති.
26. අරූපාවචර බ්‍රහ්මයින් ද, අසඤ්ඤතල බ්‍රහ්මයින් ද හැර අන් දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍ය අපාය සත්ත්වයන් ඔවුනොවුන් දකිති.
27. ගස් ගල් බිත්ති පර්වත ආදිය අතරින් විනිවිද දැකිය හැකි වෙති.
28. ඒ මොහොතෙහි දසදහසක් සක්වළ කිසිදු සත්වයෙකුගේ මරණයක් උත්පත්තියක් සිද්ධ නොවෙති.
29. සියලු දුර්ගන්ධයන් පහව ගොස් දසදහසක් සක්වළ සියලු සුගන්ධයෙන් සුවඳවත් වෙති.
30. ගෙඩි හටගන්නා සියලු ගස් වැල් එල බර වෙති.
31. මහ සමුදුර පස් පියුමෙන් හා දිය ගොඩ පිපෙන සියලු පුෂ්පයන්ගෙන් පිරී ගනිති.
32. ගස් වැල්වල කඳ අතු ආදියෙහි පිපෙන සියලු පියුම් පිපෙති. තැනිතලා ගල් පර්වත ආදියෙහි දිය ගොඩ පිපෙන සියලු පියුම්

එක නටුවෙහි හත හත බැගින් පිපෙති. අහස පුරා එල්ලෙන පියුම් පිපෙති. හාත්පසින් මල් වර්‍ෂා වසිති. දසදහසක් සක්වළ හාත්පස වටා මුදු හළ මල් මිටියක් මෙන් ද, මිටි කොට ගත් මල් මිටියක් මෙන් ද, අලංකාරමත් ලෙස පිළියෙල කළ මල් ආසනයක් මෙන් ද, මල් සුවඳ දුම් හා අනෙකුත් සුවඳ ද්‍රව්‍යයන්ගෙන් සුවඳවත් කරන ලද එකම මල් මාලාවකින් සරසන ලද වල්විදුනාවක් (චාමරයක්) මෙන් අලංකාරමත් වෙති.

මෙසේ වූ ආශ්චර්‍යයන් මධ්‍යයෙහි ලොව පහළ වන මහ බෝසතාණන් වහන්සේලා සියලු සත්ත්වයන්ට හිතෛෂී භාවයෙන් පියෙකු හා සමාන වෙති. දක්ෂිණාර්හ වෙති. ගරු බුහුමන් කටයුතු වෙති. අනේක විධ ගුණ විශේෂයන් හේතුවෙන් පින් කෙතක් වෙති. බෙහෙවින් මනුෂ්‍යයන්ට ප්‍රිය වෙති. අමනුෂ්‍යයන්ට ප්‍රිය වෙති. දෙවි බඹුන්ට ප්‍රිය වෙති. මෛත්‍රියෙන් හා කරුණාවෙන් පරිභාවිත සිත් ඇති බැවින් වන මෘග සත්ත්වයන් විසින් මැඩලිය නොහැකි වෙති. යම් තැනක උපදිත් ද ඒ ඒ තැන්හි දී පිනෙන්, ශරීර වර්‍ණයෙන්, යසසින්, සැපයෙන්, බලයෙන්, අධිපති බවෙන් සෙසු සත්ත්වයන්ට වඩා උසස් වෙති. අල්පාබාධ හා අල්ප ශරීර දුක් ඇත්තාහු වෙති. සුපිරිසිදු වූ ද ඉතා ප්‍රකට වූ ද ශ්‍රද්ධා වීර්‍යාදී ඉන්ද්‍රිය ධර්‍මයන්ගෙන් යුක්ත වෙති. මද වූ කෙලෙස් ඇත්තෝ වෙති. මද වූ විඩා ඇත්තෝ වෙති. මද වූ කෙලෙස් පරිදහ ඇති බැවින් සුවච වෙති. අනුන් විසින් පෙන්වා දෙන වරද ගෞරවයෙන් පිළිගනිති. ඉවසන සුලු වෙති. සූර වෙති. මෘදු වචන ඇත්තෝ වෙති. පිළිසඳර කථාවෙහි දක්‍ෂ වෙති.

ක්‍රෝධ, බද්ධ වෛර, ගුණමකු ස්වභාව නැත්තෝ වෙති. අනුන්ගේ දෙස් කියන්නෝ නොවෙති. මසුරු මළ නැත්තෝ වෙති. තමා තුළ නැති ගුණ නො පෙන්වති. ඇති දෙස් (අගුණ) නො සඟවති. දළදඬු නො වෙති. අධික මාන නැත්තෝ වෙති. සන්සුන් වෙති. අප්‍රමාදී වෙති. අනුන්ගේ පීඩා ගර්‍හා ඉවසන්නාහු වෙති. මහ බෝසතාණන් වහන්සේලා යම් ප්‍රදේශයක වෙසෙත් ද ඒ ප්‍රදේශයෙහි සත්ත්වයන්ට නූපන් භය උපද්‍රව නූපදිති. උපන් භය උපද්‍රව සන්සිඳෙති. යම් දුගතියක උපදිත් ද, අන් සත්ත්වයන් මෙන් අධික දුක්

නො විඳිති. බොහෝ සංවේග ඇත්තෝ වෙති. මෙසේ උපනුපන් තැන්හි බොහෝ සත්ත්වයන්ට පීතෘ සම වෙති.

තවද **ආයුෂ සම්පත්තිය, වර්‍ණ සම්පත්තිය, කුල සම්පත්තිය, ඓශ්වර්‍ය්‍ය සම්පත්තිය, ඇදහිය යුතු වචන ඇති බව, මහානුභාව ඇති** බව ආදිය ද පාරමිතා පිරීමෙන් ලැබෙන ආනිශංසයෝ වෙති.

**"සචෙචා චාගී උපසනෙතා - පඤ්ඤවා අනුකමපකො,**
**සමභතසබබසමභාරො - කං නාමතථං න සාධයෙ"**

සත්‍යයෙහි පිහිටි ත්‍යාගශීලී වූ සන්සුන් ඉඳුරන් ඇත්තා වූ නුවණැත්තා වූ (ලොවට) අනුකම්පාකාරී වූ සියලු බෝධි සම්භාර ධර්‍මයන් රැස්කර ගත්තා වූ මහා බෝධිසත්ත්වයන් වහන්සේලා කවර නම් අර්‍ථ යක් සිදුකර නොගන්නාහු ද?

# 16.පාරමිතා ධර්‍මයන්හි ඵලය කවරේද?

සම්මා සම්බුද්ධත්වය ලැබීම එහි ප්‍රධාන ඵලය වේ. තවද **දෙතිසක් මහා පුරුෂ ලක්ෂණ, අසූවක් අනු ව්‍යඤ්ජන ලක්ෂණ, ව්‍යාම ප්‍රභාව, අසීති හස්ත ප්‍රභාව, කේතුමාලාව, ෂඩ්විධ බුද්ධ රශ්මිය ආදී ගුණ රැසින් බබලන අසිරිමත් රූපකාය සම්පත්තිය ද, ෂඩ් අසාධාරණ ඥාන, දසබල ඥාන, චතුවිශාරද ඥාන** ආදිය ද පාරමිතාවන්ගේ උත්තම ඵල විශේෂ වෙති.

## ❄ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ

බුදුරජාණන් වහන්සේගේ ශරීරයෙහි පිහිටන විශේෂ ලක්ෂණ දෙතිසක් ඇත්තේ වේ. ඒවා **දෙතිස් මහා පුරුෂ ලක්ෂණ** නම් වේ. ඒවා මෙසේ ය.

1. මනාව පොළොව ස්පර්ශ කළ හැකි සිරිපා යුග්මය ඇත්තේ වේ.
2. ශ්‍රී පාදයන්හි දහසක් අර ඇති, නිම්වළලු සහිත වූ නැබ සහිත වූ සියලු අයුරින් සම්පූර්ණ වූ චක්‍රයෝ ඇත්තේ වේ.
3. දික් විලුඹ ඇත්තේ වේ.
4. දිග ඇඟිලි ඇත්තේ වේ.
5. මෘදු වූ තරුණ වූ අතුල් පතුල් ඇත්තේ වේ.
6. දැල් කවුළුවකට බඳු සම වූ ඇඟිලි ඇති අත් පා ඇත්තේ වේ.
7. පිරුණු ගොප් මස ඇති පා ඇත්තේ වේ.
8. ඕලු මුවන්ගේ බඳු කෙණ්ඩා ඇත්තේ වේ.
9. සිටගෙන ම නො නැමී දෙ දන පිරිමැදිය හැකි අත් ඇත්තේ වේ,
10. කෝෂය තුළ සැඟවුනු පුරුෂ ව්‍යඤ්ජනය ඇත්තේ වේ.
11. රන්වන් වූ චවි වර්ණය ඇත්තේ වේ.
12. සියුම් වූ සිවිය ඇත්තේ වේ.
13. දූවිලි කුණු නො තැවරෙන සියුම් වූ හම (සිවිය) ඇත්තේ වේ.
14. එක එක රෝම කූපයක එක එක රෝම ඇත්තේ වේ.
15. අග උඩුකුරු ව පිහිටි රෝම ඇත්තේ වේ.
16. නිල් වන් වූ අඳුන් වන් රෝම ඇත්තේ වේ.
17. කෙලින් පිහිටි ශරීරය ඇත්තේ වේ.
18. උස්ව පිහිටි පිටි අත්දෙක පිටි පතුල් දෙක උරහිස් දෙක කර යන සත් තැන ඇත්තේ වේ.
19. සිංහයෙකුගේ ශරීරයේ ඉදිරිපස මෙන් සම්පූර්ණ ශරීරයක් ඇත්තේ වේ.
20. දෙපැත්ත හා මැද පිරුණු පිට ඇත්තේ වේ.
21. වට නුග රුකක් සේ පිහිටි සිරුර ඇත්තේ වේ.
22. සමව වටව පිහිටි බෙල්ල ඇත්තේ වේ.
23. සත් සියයක් රස නහර ඇත්තේ වේ.
24. සිංහයෙකුගේ යට හක්ක මෙන් සම්පූර්ණ උඩු යටි දෙ හනු ඇත්තේ වේ.
25. සම සතළිස් දන්තයන් ඇත්තේ වේ.
26. සමව පිහිටි දන්තයන් ඇත්තේ වේ
27. අවිවර (අතර සිදුරු නැති) දන්තයන් ඇත්තේ වේ.
28. දිලිසෙන ඉතා සුදු වූ දන්තයන් ඇත්තේ වේ.
29. මෘදු වූ දිගු පළල් දිව ඇත්තේ වේ.

30. බ්‍රහ්ම ස්වර ඇත්තේ වේ.
31. උපන් කණෙහි වස්සෙකුගේ බඳු නිල් වන් පැහැ වූ නෙත් ඇත්තේ වේ.
32. දෙ බැම අතර අතිශයින් සුදු වූ මෘදු වූ පුලුන් පෙදක් වැනි දකුණට කරකැවී නළල මැද පිහිටි ඌර්ණරෝම ධාතුව ඇත්තේ වේ.
33. පිරුණු නළල සහිත සම්පූර්ණ වූ සිරසක් ඇත්තේ වේ.

## ❄ අසූ අනු ව්‍යඤ්ජන ලක්‍ෂණ

බුදුරජාණන් වහන්සේගේ ශරීරයෙහි පිහිටියා වූ දෙතිසක් මහා පුරුෂ ලක්‍ෂණයන් අලංකාර කිරීම පිණිස ම පිහිටියා වූ ලක්‍ෂණ අසූවක් පිහිටා ඇත. ඒවා **අනු ව්‍යඤ්ජන ලක්‍ෂණ** නම් වේ. ඒවා මෙසේ ය :-

1. විසිතුරු ව පිහිටි ඇඟිලි ඇත්තේ වේ.
2. පිළිවෙළට පිහිටි ඇඟිලි ඇත්තේ වේ.
3. වට වූ ඇඟිලි ඇත්තේ වේ.
4. තඹ පාට වූ නිය ඇත්තේ වේ.
5. උස්ව පිහිටි නිය ඇත්තේ වේ.
6. පැහැපත් වූ සිනිඳු නිය ඇත්තේ වේ.
7. නො ගිලුණා වූ සම්පූර්ණ වූ ගොප් මාංශ ඇත්තේ වේ.
8. සමව පිහිටි පාද ඇත්තේ වේ.
9. හස්ති රාජයෙකුගේ මෙන් ගමන් ඇත්තේ වේ.
10. සිංහ රාජයෙකුගේ බඳු වූ ලීලාවෙන් යුත් ගමන් ඇත්තේ වේ.
11. හංස රාජයෙකුගේ මෙන් ගමන් ඇත්තේ වේ.
12. වෘෂභ රාජයෙකුගේ මෙන් ගමන් ඇත්තේ වේ.
13. දක්‍ෂිණාවර්තව පවත්නා සිරුර ඇත්තේ වේ.
14. මනාව පිහිටියා වූ දණ මඬල ඇත්තේ වේ.
15. අංගසම්පූර්ණ වූ පුරුෂ ව්‍යඤ්ජනය ඇත්තේ වේ.

16. සිදුරු නැති රන්වන් පැහැ වූ නාභිය ඇත්තේ වේ.
17. ගැඹුරු වූ නාභිය ඇත්තේ වේ.
18. දක්ෂිණාවර්තව පිහිටි අලංකාරමත් වූ නාභිය.
19. උතුම් හස්ති රාජයෙකුගේ මෙන් පිහිටි බාහු ඇත්තේ වේ.
20. සමව බෙදුණු ශරීරාවයව ඇත්තේ වේ.
21. අනුපිළිවෙළින් පිහිටි සිරුර ඇත්තේ වේ.
22. මටසිලිටි වූ සිරුර ඇත්තේ වේ.
23. ඉතා උස් නොවූ සිරුර ඇත්තේ වේ.
24. ඉතා මිටි නොවූ සිරුර ඇත්තේ වේ.
25. සමෙහි කැලැලි දෙස් නැත්තේ වේ.
26. අනුපිළිවෙළින් පිහිටි සිත්කලු වූ සිරුර ඇත්තේ වේ.
27. ඉතා පිරිසිදු ශරීරය ඇත්තේ වේ.
28. සාමාන්‍ය ඇත්තු කෝටි දහසකගේ කාය බලය ඇත්තේ වේ (එය මනුෂ්‍යයන් කෝටි දසදහසක ගේ කාය බලයකි).
29. උස්ව පිහිටි නාසය ඇත්තේ වේ.
30. ඉතා රතු වූ විදුර මස ඇත්තේ වේ.
31. සුදු දළඳ ඇත්තේ වේ.
32. ඉතා පිරිසිදු දළඳ ඇත්තේ වේ.
33. ඉතා පිරිසිදු වූ ඇස් කන් නාසය දිව ශරීරය ඇත්තේ වේ.
34. වටකුරු වූ දළඳ ඇත්තේ වේ.
35. ඉතා රතු වූ දෙතොල් ඇත්තේ වේ.
36. රවුම් ආකාර වූ දික්ව පිහිටි මුහුණ ඇත්තේ වේ.
37. ඉතා රතු වන් වූ හස්ත රේඛා ඇත්තේ වේ.
38. දික්ව පිහිටි රේඛා ඇත්තේ වේ.
39. ඊයක් මෙන් දික්ව පිහිටි රේඛා ඇත්තේ වේ.
40. ආකුල නොවූ රේඛා ඇත්තේ වේ.
41. බඹයක් පමණ වූ ශරීරය වටා පිහිටි චන්ද්‍ර මණ්ඩලය බඳු වූ ව්‍යාමප්‍රභා ආලෝකය ඇත්තේ වේ.
42. දෙළොස්වක චන්ද්‍ර මණ්ඩලය බඳු වූ දෙ හනු ඇත්තේ වේ.
43. දිගු පුළුල් නෙත් ඇත්තේ වේ.
44. පස් පැහැ විහිදෙන නේත්‍ර යුග්මය ඇත්තේ වේ.
45. මනාව සමව පිහිටි ඇස් පිහාටු ඇත්තේ වේ.
46. මෘදු වූ රත් පැහැති දිව ඇත්තේ වේ.

47. දික්ව පිහිටි සිත්කලු කන සිළු ඇත්තේ වේ.
48. රන්වන් පාත්‍ර ඔපයක් මෙන් පිහිටි ශීර්ෂය ඇත්තේ වේ.
49. ඉතා ප්‍රකට ලෙස පැහැදිලිව පිහිටි ශීර්ෂය ඇත්තේ වේ.
50. ක්‍රමානුකූලව වටකුරු ව නැමී ගිය ශීර්ෂය ඇත්තේ වේ.
51. දික්ව පිහිටි පුළුල් වූ නළල් තලය ඇත්තේ වේ.
52. ඉතා මොලොක්ව පිහිටි දෙ බැම ඇත්තේ වේ.
53. තෙල් ආලේපයක් මෙන් පිහිටි දෙ බැම ඇත්තේ වේ.
54. චිත්‍ර ශිල්පියෙකු විසින් අඳින ලද්දක් මෙන් පිහිටි දෙ බැම ඇත්තේ වේ.
55. ඉතා සිහින් ද නොවූ මහත් ද නොවූ දේදුන්නක් බඳු වූ දෙ බැම ඇත්තේ වේ.
56. ඉතා කළුවන්ව පිහිටි දෙ බැම ඇත්තේ වේ.
57. ඉතා සියුමැළි ව පිහිටි සිරුර ඇත්තේ වේ.
58. අන්‍යයන්ගේ නෙත් පිනවන සෝභාවත් වූ සිරුර ඇත්තේ වේ.
59. කාන්තිමත්ව බැබළෙන සිරුර ඇත්තේ වේ.
60. ඉතා මෘදු වූ සිරුර ඇත්තේ වේ.
61. ඉතා මොලොක් වූ සිරුර ඇත්තේ වේ.
62. දූවිලි නො තැවරෙන සිනිඳු සිරුර ඇත්තේ වේ.
63. සැම කල්හි සුවඳ වහනය වන සිරුර ඇත්තේ වේ.
64. එකිනෙකට සමව පිහිටි ලෝම ඇත්තේ වේ.
65. දුටුවන්ගේ සිත් ඇදගන්නා වූ මොලොක් බැවින් යුත් ලෝම ඇත්තේ වේ.
66. දක්ෂිණාවර්තව කරකැවී අගින් උඩට නැවී ගිය ලෝම ඇත්තේ වේ.
67. ඉතා නිල් වන් වූ ලෝම ඇත්තේ වේ.
68. ඉතා සිනිඳු වූ ලෝම ඇත්තේ වේ.
69. වා පිත් සෙම් ආදියෙන් අවහිරතා නැති ශ්වසන පද්ධතිය ඇත්තේ වේ.
70. සුවඳවත් වූ මුඛය ඇත්තේ වේ.
71. සැම කල්හි දිව්‍යමය සුගන්ධයෙන් සුවඳවත් වූ ශීර්ෂය ඇත්තේ වේ.
72. ඉතා නිල් පැහැයෙන් අලංකාරමත් වූ කේශයෝ ඇත්තේ වේ.
73. දක්ෂිණාවර්තව කරකැවී බුබුළු වැනිව පිහිටි කේශයෝ ඇත්තේ වේ.
74. මනාව පිහිටි කේශයෝ ඇත්තේ වේ.

75. ඉතා සිනිඳු වූ කේශයෝ ඇත්තේ වේ.
76. ඉතා මෘදු වූ කේශයෝ ඇත්තේ වේ.
77. අවුල් නොවී මනාව පිහිටි කේශයෝ ඇත්තේ වේ.
78. සමව පිහිටි කේශයෝ ඇත්තේ වේ.
79. සිත් ඇදගන්නා සුළු වූ මෘදු මොලොක් කේශයෝ ඇත්තේ වේ.
80. අසූ රියනක් තරම් උස්ව කේශ කලාපයෙන් විහිදෙන නිල් වන් වූ කේතුමාලාව නම් වූ රශ්මි මාලාව ඇත්තේ වේ.

## ❄ ව්‍යාම ප්‍රභාව

බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී දේහය වටා සතර රියනක් පමණ තැන්හි පැතිර පවත්නා සුදු පැහැති ප්‍රභාස්වර රශ්මි මණ්ඩලය **ව්‍යාමප්‍රභාව** නම් වේ.

## ❄ කේතුමාලාව

බුදුරජාණන් වහන්සේගේ ශීර්ෂයෙන් අසූ රියනක් පමණ තැන්හි උස්ව පැතිර පවත්නා වූ නීලවර්ණ රශ්මි ප්‍රභාව **කේතුමාලාව** නම් වේ. පශ්චිමභවික මහ බෝසතාණන් වහන්සේ මහාභිනිෂ්ක්‍රමණය කොට පැවිදි වීමට කෙස් වැටිය එකතු කොට කැපූ පසු ඉතිරි වූ කේශයෝ දක්ෂිණාවර්තව බුබුළු මෙන් කරකැවී නැවත වැඩීමක් නොවන ලෙස පිහිටා ගන්නේ වේ. බුද්ධත්වයට පැමිණීමෙන් පසු එම කේශ මණ්ඩලයෙන් නික්මෙන නීලවර්ණ රශ්මි ධාරාව ෂඩ් වර්ණ රශ්මි මණ්ඩලයත් සමග එකතු වී පවත්නා විට සප්ත රත්නයන්ගෙන් සැරසූ නිල්මිණි ඔටුන්නක් මෙන් ලෝක නාථයන් වහන්සේගේ සිරස මත බබළන්නේ ය.

## ❄ අසීතිහස්තප්‍රභාව

බුදුරජාණන් වහන්සේගේ සිරිමත් වූ දේහය වටා අසූ රියනක් තැන්හි පැතිර පවත්නා වූ රශ්මි මණ්ඩලය **අසීතිහස්තප්‍රභාව** නම් වේ. චන්ද්‍ර මණ්ඩලය නිමීලව අහසෙහි බබලන දිනයන්හි දී ඒ චන්ද්‍ර මණ්ඩලය වටා වළල්ලක් මෙන් පෙනෙන මණ්ඩලාකාර රශ්මිය හා ඉන් ඔබ්බට පැතිර පවත්නා වූ චන්ද්‍රාලෝකය වෙන වෙනම දිස්වන්නාක් මෙන් බුද්ධ ශරීරය වටා පැතිර පවත්නා ව්‍යාමප්‍රභාව හා අසීතිහස්ත ප්‍රභාව වෙන වෙනම දිස්වන්නේය. ඒ රශ්මි මණ්ඩල දෙකෙන් බබලන බුදුරජාණන් වහන්සේ රත්න ප්‍රාකාර දෙකකින් වට වූ ස්වර්‍ණ පර්‍වතයක් මෙන් බබළන්නේ.

## ❄ ෂඩ්විධ බුද්ධ රශ්මිය

සියලු බුදුරජාණන් වහන්සේලා බුද්ධත්වයෙන් සිවුවන සතියෙහි දී රත්න ගෘහයෙහි වැඩ හිඳ අනන්ත නය සමන්වාගත සමන්ත පට්ඨාන මහා ප්‍රකරණය ආවර්‍ජනා කිරීමෙහි දී ඇතිවන චිත්ත චෛතසික ධර්‍මයන්ගේ ප්‍රභාස්වර භාවය හේතුවෙන් රූපකය ද බබළන්නට වන්නේ ය. එසේ ප්‍රභාස්වර වන රූප කයෙන් නික්මී අනන්තාපරිමාණ ලෝක ධාතුන්හි පැතිර යන්නා වූ නිල් -කහ -රතු -සුදු -මඳටිය -මිශ්‍ර වර්‍ණය යන සවනක් රැස් මාලාවෝ **ෂඩ්විධ බුද්ධ රශ්මිය** හෙවත් **අනන්ත රශ්මිය** නම් වේ.

## ❄ අසාධාරණ ඥාන සය

සම්මා සම්බුදුරජාණන් වහන්සේලාට පමණක් විෂය වන්නා වූ පසේ බුදුරජාණන් වහන්සේලාට අග්‍රශ්‍රාවක මහා ශ්‍රාවක මහරහතන්

වහන්සේලාට නො පිහිටන්නා වූ විශේෂ ඥාන සයක් ඇත්තාහ. එම ඥාන සය අසාධාරණ ඥාන නම් වේ. ඒවා මෙසේ ය :-

❖ **ඉන්ද්‍රියපරොපරිය ඥානය**

සත්ත්වයන්ගේ ශ්‍රද්ධා දී ඉන්ද්‍රිය ධර්මයන් දියුණු වූණු, නුවූණු බව දන්නා නුවණ.

❖ **ආසයානුසය ඥානය**

සත්ත්වයන්ගේ **ආසය, අනුශය, චරිතය, අධිමුත්තිය, භව්‍යාභව්‍ය** ස්වභාවයන් දන්නා ඥානය යි. එහිː-

**ආසයː-** යනු මෙය මෙසේ ම යැයි අල්ලා ගන්නා ලද මිථ්‍යා දෘෂ්ටිය හා යථාභූත ඤාණයයි.

**අනුශය ː-** යනු සිත්හි ලැග ගෙන පවත්නා කාමරාග, භවරාග, පටිඝය, මානය, දිට්ඨිය, විචික්ච්ඡාව, අවිද්‍යාව යන අනුශය ධර්ම සතයි.

**චරිතය ː-** යනු අතීත භවයන්හි සිදුකර ගන්නා ලද පින් පව් දෙකය.

**අධිමුත්තියː-** යනු හීන වූ (සම්පූර්ණ නොවූ) අදහස් ඇති සත්ත්වයන් ද, ප්‍රණීත (පරිපූර්ණ) වූ අදහස් ඇති සත්ත්වයන් ද දැකීමයි.

**භව්‍ය ː-** යනු මේ ජීවිතයෙහි දී ම මඟ ඵල ලැබීමට සුදුසු කර්මාවරණ නැති, ක්ලේශාවරණ නැති, විපාකාවරණ නැති, ශ්‍රද්ධාව ඇති, නිර්වාණාවබෝධයට කැමැත්ත ඇති, ප්‍රඥාව ඇති, බෝධිපාක්ෂික ධර්ම පාරමී ගුණ පිරුණු ලෝකෝත්තර මාර්ගය පිණිස අවශ්‍ය සුදුසුකම් ඇති සත්ත්වයන් ය.

**අභව්‍ය ː-** යනු මේ ජීවිතයෙහි දී ම මඟ ඵල ලැබීමට නුසුදුසු ඉහත කී ගුණ නැති සත්ත්වයන් ය.

### ❖ යමක මහා ප්‍රාතිහාර්‍යය ඥානය

ශරීරයෙන් ගිනි පිට කිරීම හා ජලය පිට කිරීමාදී ලෙස එකවර ප්‍රාතිහාර්‍යය දෙකක් දක්වන ඥානය යි.

### ❖ මහා කරුණා සමාපත්ති ඥානය

මම වනාහි සසරින් එතෙර වූයේ වෙමි. කෙලෙසුන්ගෙන් මිදුණේ වෙමි. දමනය කරන ලද ඉන්ද්‍රිය ඇත්තේ වෙමි. කෙලෙසුන් සන්සිඳවූයේ වෙමි. වස්තු කාම ක්ලේශ කාමයන් හි නො ඇලුණේ වෙමි. කෙලෙස් පිරිනිවීමෙන් පිරිනිවියේ වෙමි. එබැවින් සසරින් එතෙර වූ මම ලෝක සත්ත්වයන් එතර කරවන්ට සමර්‍ථ වෙමි. කෙලෙසුන්ගෙන් මිදුණා වූ මම ලෝක සත්ත්වයන් කෙලෙසුන්ගෙන් මුදවන්ට සමර්‍ථ වෙමි. දමුණා වූ මම ලෝක සත්ත්වයන් දමනය කරවන්ට සමර්‍ථ වෙමි. සංසිඳුණා වූ මම ලෝක සත්ත්වයන් සංසිඳවන්ට සමර්‍ථ වෙමි. වස්තු කාම ක්ලේශ කාමයන් හි නො ඇලුණා වූ මම ලෝක සත්ත්වයන් වස්තු කාම ක්ලේශ කාමයන් හි නො ඇලුණවුන් කරවන්නට සමර්‍ථ වෙමි. කෙලෙස් පිරිනිවීමෙන් පිරිනිවියා වූ මම ලෝක සත්ත්වයන් කෙලෙස් පිරිනිවීමෙන් පිරිනිවාලන්නට සමර්‍ථ වෙමි යැයි දක්නා වූ භාග්‍යවත් බුදුවරයන් වහන්සේලාට සත්ත්වයන් කෙරෙහි මහා කරුණාව පහළ වෙති. මෙය වනාහි කරුණා ධ්‍යාන සම්ප්‍රයුක්ත වූ තථාගතයන් වහන්සේලාගේ මහා කරුණා සමාපත්ති ඥානය යි.

### ❖ සර්‍වඥතාඥාන ඥානය

හේතු ප්‍රත්‍යයන්ගෙන් හට ගන්නා වූ ද, හට නොගන්නා වූ ද, අතීත අනාගත වර්‍තමාන කාලත්‍රයට අයත් සියල්ල නිරවශේෂ කොට දන්නා වූ ද, නාම රූප - පඤ්ච උපාදනස්කන්ධ - ආධ්‍යාත්මික වූ ද බාහිර වූ ද දෙළොස් වැදෑරුම් ආයතන - ද්වාදස පටිච්ච සමුප්පාදංග ආදී හේතු ප්‍රත්‍යයන්ගෙන් හට ගන්නා

වූ සියලු ධර්මයන් අනිත්‍ය දුක්ඛ අනාත්ම ලක්‍ෂණ වශයෙන් ද, දුක්ඛය සමුදය නිරෝධ මාර්ගය යන ආර්ය්‍ය සත්‍යය වශයෙන් ද සතර ප්‍රතිසම්භිධාවන්ගේ වශයෙන් ද ඒ සියල්ල කාමාවචර රූපාවචර අරූපාවචර ලෝකෝත්තර වශයෙන් ද තත් වූ පරිද්දෙන් දන්නා වූ ඥානය ද චුද්දස බුද්ධ ඥානයන් ද සර්වඥතාඥාන ඥාන නම් වේ.

❖ **අනාවරණ ඥානය**

ඒ සර්වඥතාඥාන ඥාන විෂයයෙහි ආවරණයක් පැකිළීමක් නැති බව අනාවරණ ඥානයයි.

## ❄ දසබල ඥාන

සම්මා සම්බුදුරජාණන් වහන්සේලාට පමණක් පිහිටන්නා වූ පසේ බුදුරජාණන් වහන්සේලාට හෝ රහතන් වහන්සේලාට හෝ අන් කිසිවකුට නො පිහිටන්නා වූ ඤාණ බල දසයක් හේතුවෙන් තථාගතයන් වහන්සේලා ලොව උත්තම ස්ථානයට පැමිණෙති. අට පිරිසෙහි සිංහනාද පවත්වති. බ්‍රහ්ම චක්‍රය නම් වූ උත්තම ධර්ම චක්‍රය පවත්වති. එම ඤාණ බල දසය දසබල ඥාන නම් වෙති. ඒවා මෙසේ යඃ-

1. සෝවාන් ආදී ආර්ය්‍ය පුද්ගලයෙකුගෙන් මිසදිටු ගැනීම ආනන්තර්ය්‍යය පාපකර්ම ආදියක් සිදු නොවන බව ද, පෘථග්ජනයෙකුගෙන් එස් විය හැකි බව ද යනාදී ලෙස යමක් සිදුවීමේ හා නොවීමේ හේතු මෙසේ මෙසේ යැයි දන්නා නුවණ.

2. අතීත අනාගත වර්තමාන යන තුන් කාලයට අයත් කර්මයන්ගේ විපාක දන්නා නුවණ

3. සුගති දුගති භවවලට පැමිණෙන්නා වූ ද, මග ඵල නිවන් සුවයට පැමිණෙන්නා වූ ද ප්‍රතිපත්තීන් දන්නා නුවණ.

4. කැඩෙන බිඳෙන පළුදු වන අර්ථයෙන් ලෝක නම් වන සවිඤ්ඤාණක අවිඤ්ඤාණක සියල්ල කෙරෙහි මෙය මේ හේතූන්ගෙන් ලොකු කුඩා වෙති. කළු සුදු වෙති යනාදී වශයෙන් අනේකධාතු නානාධාතු ලෝක දන්නා නුවණ.

5. සත්ත්වයන්ගේ නා නා අදහස් ඇති බව දන්නා නුවණ.

6. සත්ත්වයන් ගේ ශ්‍රද්ධා දී ඉන්ද්‍රිය ධර්ම දියුණු වී ඇති බව හා නැති බව දන්නා නුවණ.

7. රූපාවචර අරූපාවචර වූ ධ්‍යාන සමාපත්තීන්ගේ පිරිහීම දියුණු වීම නැගී සිටීම දන්නා නුවණ.

8. අතීතය ආත්මභාවයන් පිළිබඳ දන්නා නුවණ.

9. සත්ත්වයන්ගේ ච්‍යුති උත්පත්ති සිදුවීම පිළිබඳ දන්නා නුවණ.

10. අර්හත් මාර්ගීය ඥානය.

## ❄ විශාරද ඥාන සතර

තථාගතයන් වහන්සේලා යම් විශාරද බවකින් යුක්තව උත්තම ස්ථානය ප්‍රතිඥා කෙරෙත් ද, පිරිසෙහි සිංහනාද කරත් ද, ධර්මචක්‍රය පවත්වත් ද, තථාගතයන් වහන්සේලාගේ එසේ වූ විශාරද ස්වභාවයන් සතරක් වෙති. ඒවා මෙසේ ය :-

1. නුඹ වහන්සේ විසින් මේ මේ ධර්මයෝ අවබෝධ නොකරන ලද්දෙහි ය යැයි සත්‍ය වශයෙන් ලොව කිසිවකුට භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි කරුණු සහිතව නොකිය හැකිය.

2. නුඹ වහන්සේ ක්ෂීණාශ්‍රව බව ප්‍රකාශ කළ ද නුඹ වහන්සේගේ මේ මේ මේ ආශ්‍රවයෝ ක්ෂය වී නැත යැයි සත්‍ය වශයෙන් ලොව කිසිවකුට භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි කරුණු සහිතව චෝදනා නො කළ හැකිය.

3. නුඹ වහන්සේ විසින් මාර්ගය ඵල ලැබීමට මේ මේ ධර්ම අන්තරායකර ධර්ම යැයි යම් ධර්මයක් වදාරණ ලද්දාහු ද, එම ධර්මයන් සේවනය කරන්නාහට මාර්ග ඵල ලැබීමට අන්තරායකර නොවේ යැයි සත්‍ය වශයෙන් ලොව කිසිවකුට භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි කරුණු සහිතව නොකිය හැකිය.

4. නුඹ වහන්සේ විසින් සසර දුකින් නිදහස්ව නිවන් සුව ලැබීම පිණිස යම් ධර්මයක් දේශනා කරණ ලද්දේ ද, ඒ ධර්මය අනුව පිළිපදින්නහුට මනා කොට දුක් කෙළවර කිරීම සිදු නොවන්නේ ය යැයි සත්‍ය වශයෙන් ලොව කිසිවකුට භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි කරුණු සහිතව නොකිය හැකිය.

## ❄ බුදුරජාණන් වහන්සේලාට අසමාන ධර්මතා අට

ලොව පහළ වෙන සියලු සම්මා සම්බුදු රජාණන් වහන්සේලාට ධර්මතා අටක් එක හා සමාන නොවෙති. එනම් :- **ආයුෂය, ශරීර ප්‍රමාණය, උපදින කුලය, දුෂ්කර ක්‍රියාව, බුද්ධ රශ්මි මාලාව, අභිනිෂ්ක්‍රමණය කරන යානය, බෝධි වෘක්ෂය, බෝධි පර්යංකය** හෙවත් **වජ්‍රාසනය** යන මේවා ය. එහිː-

❖ **ආයුෂය :-**

සම්මා සම්බුදු රජාණන් වහන්සේලා ලොව පහළ වන්නේ මනුෂ්‍ය ආයුෂය අවුරුදු ලක්ෂයත් සියයත් අතර ආයුෂය පවතින කාලයන්හි පමණකි. මේ අනුව ඇතැම් බුදුරජාණන් වහන්සේලා දීර්ඝායුෂ ද ඇතැම් බුදුරජාණන් වහන්සේලා කෙටි ආයුෂය ද ලබති.

❖ **ශරීර ප්‍රමාණය :-**

දීඝායුෂය ඇති කල්හි ශරීර ප්‍රමාණය ද විශාල වෙති. කෙටි ආයුෂය ඇති කල්හි ශරීර ප්‍රමාණය ද කුඩා වෙති.

❖ **උපදින කුලය :-**

ඇතැම් බුදුරජාණන් වහන්සේලා බ්‍රාහ්මණ කුලයෙහි උපදිති. ඇතැම් බුදුරජාණන් වහන්සේලා ක්‍ෂත්‍රිය කුලයෙහි උපදිති.

❖ **දුෂ්කර ක්‍රියාව :-**

මහ බෝසතාණන් වහන්සේලා දුෂ්කර ක්‍රියාව කරන වැඩිම කාලය සය අවුරුද්දකි. අඩුම කාලය දින සතකි.

❖ **බුද්ධ රශ්මි මාලාව:-**

සියලු බුදු රජාණන් වහන්සේලාගේ ප්‍රතිවේධ ගුණයෙහි වෙනස් බවක් නැත්තේ ම ය. මංගල බුදුරජාණන් වහන්සේ ආදී ඇතැම් බුදුරජාණන් වහන්සේලා ගේ විශේෂ කුසලතා අනුව බුද්ධ රශ්මිය විහිදෙන ප්‍රමාණ අඩු වැඩි වෙති.

❖ **අභිනිෂ්ක්‍රමණය කරන යානය :-**

හස්ති යානය, අස්ව යානය, රථය, ප්‍රාසාදය, පා ගමනින්, සිවිකාව යන සයෙන් එකකින් අභිනිෂ්ක්‍රමණය සිද්ධ වෙති.

❖ **බෝධි වෘක්‍ෂය :-**

ඒ ඒ මහ බෝසතාණන් වහන්සේලාගේ ප්‍රාර්ථනා වශයෙන් බෝධි වෘක්‍ෂය ලැබීම සිද්ධ වේ.

❖ **බෝධි පර්‍යඞ්කය :-**

ඒ ඒ බුදුරජාණන් වහන්සේලාගේ ශරීර ප්‍රමාණයට අනුව සුදුසු ලෙස වජ්‍රාසනයෙහි ද ප්‍රමාණය වෙනස් වේ.

# ❈ අවිජහිත ස්ථාන සතර

සියලු බුදුරජාණන් වහන්සේලා විසින් ම අත් නොහරින ස්ථාන සතරකි. ඒවා අවිජහිත ස්ථාන නම් වේ. එනම් :-

❖ සියලු මහ බෝසතාණන් වහන්සේලා බුද්ධත්වයට පැමිණෙන ස්ථානය වූ මහා බෝධි මණ්ඩලයෙහි වූ වජ්‍රාසනය එකම ස්ථානය වෙති.

❖ සියලු බුදුරජාණන් වහන්සේලා විසින් ම දම්සක් පවත්වනු ලබන්නේ බරණැස මිගදාය නම් වූ ඉසිපතනාරාමයෙහිදීම ය.

❖ සියලු බුදුරජාණන් වහන්සේලා විසින් ම අභිධර්‍ම දේශනාව නිමවා දෙව්ලොව සිට දේවාරෝහණ ප්‍රාතිහාර්‍යයෙන් යුක්තව මනුලොවට බසිනු ලබන්නේ සංකස්ස නුවර දොරටුවට ම ය.

❖ සියලු බුදුරජාණන් වහන්සේලාට ම නිත්‍ය වාසස්ථානය වන්නේ සැවැත්නුවර ජේතවනාරාම භූමියමය. එහි ද සැතපෙන ඇඳෙහි පාද සතර පිහිටන්නේ පොළොවෙහි එකම තැන ය.

## ❄ සම තිස් ධර්මතා

තව ද ලොව පහළ වෙන සියලු සම්මා සම්බුදු රජාණන් වහන්සේලාට සාධාරණ ධර්මතා තිසක් වෙති. ඒවා **සම තිස් ධර්මතා** නම් වෙති. ඒවා නම් :-

1. පශ්චිමභවික මහ බෝසතාණන් වහන්සේ සිහි නුවණින් මවු කුසෙහි පිළිසිඳ ගැනීම.
2. මව්කුසෙහි පය්‍යඞ්කයක් බැඳ ඉදිරිය බලා වැඩ හිඳීම.
3. මව සිටගෙන සිටිය දී ම මහ බෝසතාණන් වහන්සේ මෙලොවට බිහි වීම.
4. වනයක දීම මහ බෝසතාණන් වහන්සේ ඉපදීම.
5. උපන් ඇසිල්ලෙහි ම උතුරු දෙසට සත් පියවරක් වැඩ සතර දිසාව මනාව නුවණින් බලා **"අග්ගො හමස්මි ලොකස්ස"** යනාදී සිංහනාද පැවැත්වීම.
6. පෙර නිමිති සතර දැක පුතෙකු උපන් දම මහාභිනිෂ්ක්‍රමණය කිරීම.
7. අභීත් ධ්වජය හැඳ පෙරව පැවිදි ව අඩුම වශයෙන් සත් දිනක් හෝ දුෂ්කර ක්‍රියාවෙහි යෙදීම.
8. බුදු වන දින අලුයම ක්ෂීරපායාස දනය වැළඳීම.
9. තෘණ ඇතිරියක වැඩ හිඳ සර්වඥතාඥන ඥනාවබෝධය කිරීම.
10. ආනාපාන සති භාවනාව මූල කර්මස්ථානය කරගැනීම.
11. මාර පරාජය කිරීම.
12. බෝධි පය්‍යඞ්කයෙහිදී ම ත්‍රිවිද්‍යා ඥන ලැබීම සමගම අසාධාරණ ඥන ලැබීම.

13. මහා බෝධිය සමීපයෙහි ම සත් සති ගත කිරීම.

14. බ්‍රහ්ම ආරාධනාවෙන් ම ප්‍රථම ධර්‍ම දේශනාව කිරීම.

15. බරණැස ඉසිපතනාරාමයෙහිදී ම දම්සක් පැවැත්වීම.

16. නවම් පුර පසලොස්වක පෝය දිනයක දී ම චතුරාංග සමන්වාගත ශ්‍රාවක සන්නිපාතයෙහි ප්‍රාතිමෝක්‍ෂය උදෙසීම.

17. ජේතවනාරාම භූමිය ම නිත්‍ය වාසස්ථානය වීම.

18. සැවැත් නුවර නැගෙනහිර දෙරටුව සමීපයෙහි දී ම තීර්‍ථක මර්‍දනයට යමක මහා ප්‍රාතිහාර්‍ය්‍ය දැක්වීම.

19. තව්තිසා දෙව් ලොව දී ම අභිධර්‍ම දේශනාව පැවැත්වීම.

20. අභිධර්‍ම දේශනාව නිමවා සංකස්ස නුවර දෙරටුවට ම දේවාරෝහණයෙන් බැසීම.

21. නිරන්තරයෙන් ඵල සමාපත්තිවලට සමවැදීම.

22. චිත්තවාර දෙළොස් කෝටි ලක්‍ෂ වාරය බැගින් වාර දෙකක දී සූවිසි කෝටි ලක්‍ෂ වාරයක් මහා කරුණා සමාපත්තියට සමවැදී දිනක් පාසා ම උදේ සවස හික්මවිය යුතු සත්ත්වයන් බැලීම.

23. උපන් වරදක් ඇති විට ම ශ්‍රාවකයන්ට සිකපද පැණවීම.

24. උපන් කරුණක් ඇති විට ම ජාතක දේශනා කිරීම.

25. ඤාති සමාගමයෙහි බුද්ධවංස දේශනාව පැවැත්වීම.

26. ආගන්තුක භික්‍ෂූන් වහන්සේලා සමග පිළිසඳර කථා කිරීම.

27. ආරාධනා ඇතිව වස් සමාදන් ව පවාරණය කොට එම ආරාධිත දයකයන්ට නොදන්වා චාරිකාවෙහි නො වැඩීම.

28. දිනක් පාසා පඤ්ච විධ බුද්ධ කෘත්‍යය සිදු කිරීම.

29. පිරිනිවන් පානා දවසෙහි දී මස් රස ඇති භෝජනයක් වැළඳීම.

30. සූවිසිකෝටි ලක්‍ෂ වාරයක් නවානුපූර්‍වී විහාර සමාපත්ති සුව වළඳ අනුපාදිශේෂ පරිනිර්‍වාණ ධාතුවෙන් පිරිනිවීම.

**"මහාකාරුණිකො සත්‍ථා - හිතෙසී ච උපෙක්‍ඛකො,**
**නිරපෙක්ඛො ච සබ්බත්‍ථ - අහෝ අච්ඡරියො ජිනො"**

මහා කාරුණික වූ ලොවට අනුශාසක වූ හිත වැඩ කැමැත්තා වූ පස්මරුන් දිනූ බුදුරජාණන් වහන්සේලා අහෝ ආශ්චර්‍ය්‍ය වෙති.

**"විරත්තො සබ්බධම්මෙසු - සත්තෙසු ච උපෙක්ඛකො,**
**සදා සත්තහිතෙ යුත්තො - අහෝ අච්ඡරියො ජිනො"**

සියලු ධර්‍මයන්හි නො ඇලුණා වූ සත්ත්වයන් කෙරෙහි මැදහත් පැවතුම් ඇත්තා වූ හැම කල්හි සත්ත්වයන්ට හිත වැඩ පිණිස යෙදුණා වූ පස්මරුන් දිනූ බුදුරජාණන් වහන්සේලා අහෝ ආශ්චර්‍ය්‍ය වෙති.

**"සබ්බදා සබ්බසත්තානං - හිතාය ච සුඛාය ච,**
**උය්‍යුත්තො අකිලාසූ ච - අහෝ අච්ඡරියො ජිනොති"**

හැම කල්හි සියලු සත්ත්වයන්ට හිත පිණිස ද, සැප පිණිස ද උත්සාහවත් වූ නමුත් එයින් පීඩාවට පත් නොවන්නා වූ පස්මරුන් දිනූ බුදුරජාණන් වහන්සේලා අහෝ ආශ්චර්‍ය්‍ය වෙති.

# 17.පුණ්‍ය ප්‍රාර්ථනා

**"ඉති තං සබ්බරොනෙතන - යං තං අධිගතං මයා,**
**පුඤ්ඤං තසසානුභාවෙන - ලොකනාථසස සාසනං,**

**"ඔගාහෙතවා විසුදධාය - සීලාදිපටිපතතියා,**
**සබෙබපි පාණිනො හොනතු - විමුතතිරසභාගිනො"**

මා විසින් දිවා රෑ වෙහෙසී මෙම අගනා ධර්ම ග්‍රන්ථය සකස් කිරීම තුළින් යම් කුසලස්කන්ධයක් රැස්කර ගන්නා ලද්දේ වෙම් ද, ඒ කුසලානුභාවයෙන් ලෝක නාථයන් වහන්සේගේ ශාසනයට විශුද්ධ වූ සීලාදී ප්‍රතිපත්තියෙන් බැසගෙන සියලු සත්ත්වයෝ විමුක්ති රසයෙහි හිමිකරුවෝ වෙත්වා.

**"චිරං තිටඨතු ලොකසමිං - සමමාසමබුදධසාසනං,**
**තසමිං සගාරවා නිචචං - හොනතු සබෙබපි පාණිනො"**

සම්මා සම්බුද්ධ ශාසනය ලොව බොහෝ කලක් නිර්මලව පවතීවා! සියලු සත්ත්වයෝ තථාගත ධර්මයෙහි සැම කල්හි ගෞරව ඇත්තෝ වෙත්වා!

**"සමමා වසසතු කාලෙන - දෙවොපි ජගතීපති,**
**සදධමමනිරතො ලොකං - ධමෙමනෙව පසාසතුති"**

සුදුසු කල්හි වැසි වසීවා. ලොවට අධිපති සුද්ධ ධර්මයෙහි පිහිටියා වූ දෙවියෝ ද (බ්‍රහ්මයෝ ද) ධර්මයෙන්ම ලෝ වැසියන්ට අනුශාසනා කරත්වා!

(මෙම ප්‍රාර්ථනා ගාථා ඉතිවුත්තකට්ඨකථාවෙනි.)

**"ඉමිනා පුඤ්ඤ කමෙමන - මා මෙ බාලසමාගමො,**
**සතං සමාගමො හොතු - යාව නිබබානපතතියා"**

ලොව පහළ වන ඓශ්චර්‍යය පුද්ගලයන් වන බුදුරජාණන් වහන්සේලාගේ ද, බුද්ධ කාරක ධර්ම පුරන මහ බෝසතාණන් වහන්සේලාගේ ද ඇත්තා වූ සත්‍ය ගුණ වර්ණනා කොට දැක්වීමේ

මහඟු කුසල බලයෙන් මාගේ ආචාර්‍ය උපාධ්‍ය උතුමන් වහන්සේලාට ද, මව්පිය ඥාතීන්ට ද, උපකාරක අනුග්‍රාහක සැමට ද, සදේවක ලෝකවාසී සියලු සත්ත්වයන්ට ද මට ද නිවනට පැමිණීම දක්වා ම අසත්පුරුෂාදීන් ගේ ඇසුරක් කිසි කලෙක නොවේවා. එසේම නීවරණ, සොළොස් මහා ආදී කෙලෙසුන් ගේ ද සතුරුකමක් නොමග යැවීමක් නොවේවා. බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලාගේ ද, සිල්වතුන්ගේ ද, ගුණවතුන්ගේ ද ඇසුර සැම කල්හි ලැබේවා. සත් තිස් බෝධිපාක්ෂික ධර්‍ම දස පාරමිතා දී උසස් ගුණ පූර්ණය කරගෙන ත්‍රිලක්ෂණ, චතුරාර්‍ය සත්‍ය ධර්‍මය සුවසේම අවබෝධ කරගෙන ප්‍රාර්ථනීය බෝධියෙන් නිවන්සුව ලබන්නට හේතු වාසනා වෙත්වා!

සාධු... සාධු... සාධු...

**නිමි.**

## ❖ ආශ්‍රිත ග්‍රන්ථ :-


| | |
|---|---|
| මජ්ඣිමනිකාය උ: පණ්ණාසක | (බු: ජ: ත්‍රිපිටක) |
| සංයුත්ත නිකාය මහාවග්ග | ” |
| අංගුත්තර නිකාය චතුක්ක නිපාත | ” |
| බුද්ධවංස පාලිය | ” |
| ම: නි: අට්ඨකථා සටීකාර සූ: වණ්ණනා | ” |
| බුද්ධවංසට්ඨකථා | (බෞ: සං: මධ්‍යස්ථානය) |
| චරියාපිටකට්ඨකථා | ” |
| ඉතිවුත්තකට්ඨකථා | ” |
| ථෙරගාථාට්ඨකථා - 1 | ” |
| සද්ධර්‍මාලංකාරය | ” |
| පාරමිතා ප්‍රකරණය | (පූජනීය රේරුකාණේ මහානාහිමි) |

සූවිසි මහ ගුණය ”

බුදු පිය ගුණගඟ (පූජ්‍ය සුල්තානාගොඩ සුදස්සන හිමි)